Policy Reforms and Competitiveness

Migration and Urbanization

Human Resources for Sustained Development

Private Sector Development

Poverty and Vulnerability

Environment, Natural Resources and Agriculture

# 2016

# වාර්ෂික වාර්තාව සහ ගිණුම්

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

# අප ගැන




ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ පිළිබඳ උසස්තම බුද්ධි මණ්ඩලයයි. එහි අරමුණු වන්නේ රට තුළ ප්‍රතිපත්ති කෙරේ යොමු වූ ආර්ථික පර්යේෂණ ප්‍රවර්ධනය සහ මධ්‍ය කාලීන ප්‍රතිපත්ති විශ්ලේෂණය ශක්තිමත් කිරීමයි ස්වාධීන ආයතනයක් වන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ආරම්භයේ සිටම ආණ්ඩුව, පෞද්ගලික අංශය□ ශාස්ත්‍රඥයන් සහ සිවිල් සමාජය සමග සමීපයෙන් ක්‍රියා කරන අධිකාරිත්වයෙන් යුත් ස්වාධීන හඬක් ලෙස සුවිශේෂී තැනක් හිමිකර ගත්තේයි.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ආරම්භයේ සිටම කාර්ය මණ්ඩලය ක්‍රමානුකූලව ශක්තිමත් කරමින් සහ එහි හැකියාවන් ගොඩනගමින් පර්යේෂණ ක්‍රියාකාරකම් සැලකිය යුතු ආකාරයෙන් පුළුල් කරන ලදී. පර්යේෂණ වැඩ කටයුතුවල මෙම පුළුල්වීම සමස්ත මූල්‍ය සහ පරිපාලන කළමනාකරණය සහ තොරතුරු සහ ආයතනයේ පුස්තකාලය□ ප්‍රකාශන□ සන්නිවේදන සහ ව්‍යාප්ති ක්‍රියාකාරකම් සහ තොරතුරු සන්නිවේදන පද්ධති ඒකක සම්පාදනයෙන් ආයතනයේම වෘත්තීය සහාය සේවා ව්‍යාප්තියෙන් පරිපූර්ණ වියි.

## දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ- ආර්ථික පරිණාමය සඳහා උත්ප්‍රේරකයක් වන ගෝලීය වශයෙන් පිළිගත් පර්යේෂණ ආයතනයක් බවට පත්වීම.

## මෙහෙවර

සමාජ ආර්ථික ගැටලු පිළිබඳව විශ්වසනීය තියුණු දැක්මක් ලබා දෙන ගුණාත්මක භාවයෙන් උසස්□ ස්වාධීන□ ප්‍රතිපත්තිවලට අදාල පර්යේෂණ ලබා දීමෙන් අපගේ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සහ සියලු ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත කෙරේ සාධනීය බලපෑමක් ඇති කිරීමට ප්‍රතිපත්ති න්‍යාය පත්‍ර හැඩ ගැසීම.

# පාලන මණ්ඩලය



**ආචාර්ය රසීන් සාලි**
**සභාපති**

ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ උපදේශක සිංගප්පූරුවේ ජාතික විශ්ව විද්‍යාලයේ ලී ක්වාන් යූ මහජන ප්‍රතිපත්ති පාසලේ බාහිර මහාචාර්ය



**ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමිපාලන මණ්ඩලයේ සාමාජික අධිපති**

ශ්‍රී ලංකාවේ මහ බැංකුව (නිල බලයෙන්)



**ඇම් අයි ඇම් රෆීක් මහතා පාලන මණ්ඩලයේ සාමාජික**

ලේකම් ක්‍රම සම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය (නිල බලයෙන්)



**ආචාර්ය සරත් රාජපතිරණ පාලන මණ්ඩල සාමාජික**

ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති තුමාගේ ආර්ථික උපදේශක



**එස් එස් මුදලිගේ මහතා පාලන මණ්ඩල සාමාජික**

අධ්‍යක්ෂ ජනරාල් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව (නිල බලයෙන්)



**ආචාර්ය ගිෂාන් දිසානායක පාලන මණ්ඩල සාමාජික**

එක්සත් ජනපද කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ සමායතන පාලනය පිළිබඳ ඇඩම් ස්මිත් මහාචාර්ය



**ආචාර්ය සමන් කැලේගම විධායක අධ්‍යක්ෂ**

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

# 2016 වසරේ කැපී පෙනෙන සිද්ධීන්

## ජනවාරි

### 2016 ශ්‍රී ලංකා ආර්ථික මණ්ඩපය කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය




ආචාර්ය සමන් කැලේගම මහතා ශ්‍රී ලංකාවේ ව්‍යුහාත්මක පරිණාමය සහ තරගකාරිත්වය පිළිබඳ දේශනයක් කළ අතර ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ප්‍රධාන ආචාර්ය ගංගා තිලකරත්න ශ්‍රී ලංකාවේ සමාජයීය අන්තර්ග්‍රහණය: දරිද්‍රතාවය සහ වයස්ගතවීම' මැයෙන් ඉදිරිපත් කිරීමක් කළාය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ආචාර්ය දුෂ්නි වීරකෝන් සහ පර්යේෂණ ප්‍රධාන ආචාර්ය නිෂා අරුණතිලක ද මෙම සාකච්ඡා මණ්ඩපයට සහභාගි වූහ.

## පෙබරවාරි

### කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ දී ඉන්දියානු සාගර වළල්ල ( IORA ) සංගමයේ තල් මසුන් සහ ඩොල්පින් නැරඹීමේ වැඩ මුළුව



'ඉන්දියානු සාගර කලාපයේ තල්මසුන් සහ ඩොල්පින් නැරඹීමේ තිරසාර සංචාරක කර්මාන්තයක් ගොඩනැගීම' යන තේමාව යටතේ ඉන්දියානු සාගර වළල්ල (IORA) සංගමය කොළඹ පැවැත් වූ තල් මසුන් සහ ඩොල්පින් බැලීමේ වැඩ මුළුවී මෙම වැඩ මුළුවේ දී IORA සාමාජික රටවලට තල් මසුන් සහ ඩොල්පින් නැරඹීමේ සංචාරක කර්මාන්තයේ අත්දැකීම් හුවමාරු කර ගැනීමට සහ අන්තර්ජාතික තල් මසුන් සහ ඩොල්පින් නැරඹීමේ විශේෂඥතාවය ලබා ගැනීමට රාජ්‍ය ප්‍රතිපත්ති සැලසුම්කරුවන් සහ විද්‍යාඥයක් එකට එක් කෙරිණ.

## මාර්තු

### 2016 ලෝක පාරිභෝගික අයිතීන් දින සාකච්ඡා මණ්ඩපය: ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශ්‍රවනාගාරයේ දී



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතය නොකඩවා සිව් වැනි වරටත් ලෝක පාරිභෝගික අයිතීන් දිනය සැමරීමට 2016 ලෝක පාරිභෝගික අයිතීන් දින සාකච්ඡා මණ්ඩපයක් සංවිධානය කරන ලදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශ්‍රවනාගාරයේ පැවති උත්සවය ඇමතු ආචාර්ය සමන් කැලේගම මහතා රටේ පාරිභෝගිකයන්ට බලපාන ගැටලු හඳුණාගැනීම සඳහා පාරිභෝගිකයන් සහ ප්‍රතිපත්ති සැලසුම්කරුවන් එකට එක්වීමේ වැදගත්කම අවධාරණය කෙළේය.

## අප්‍රේල්

### ආහාර වටිනාකම් දාමය සංවර්ධනය කිරීම පිළිබඳ ජාතික වැඩ මුළුව: ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශ්‍රවනාගාරයේ දී



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මූලික කර්මාන්ත අමාත්‍යංශය සමග අන්තර්ජාතික ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයේ ( IFPRI ) සහාය ඇතිව ශ්‍රී ලංකාවේ ආහාර වටිනාකම් දාමය සංවර්ධනය කිරීම පිළිබඳව ජාතික වැඩ මුළුවක් පැවැත් වූයේයි එහි අරමුණ වූයේ කෘෂි – ආහාර කර්මාන්තවල වටිනාකම් දාමය සංවර්ධනය පිළිබඳ සංවාදයක් පහසු කිරීම සහ උප අංශ හතරක සංවර්ධන සැලැස්ම සමග මූලික කර්මාන්ත සඳහා ආහාර වටිනාකම් දාම සංවර්ධනයක් වැඩි දියුණු කිරීමය

## මැයි

### මැලේසියාව සහ ශ්‍රී ලංකාව අතර වෙළඳ සහ ආයෝජන ගැඹුරු කිරීම පිළිබඳ සාකච්ඡාව: ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ දී



2016 මැයි 6 වැනිදා මැලේසියාවේ අන්තර්ජාතික වෙළඳාම සහ කර්මාන්ත අමාත්‍ය ඩාටෝ මුස්තාපා මොහොමඩ් මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් දූත පිරිසක් දෙරට අතර ද්විපාර්ශ්වික සම්බන්ධතා පිළිබඳව සාකච්ඡා කිරීමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට පැමිණියහී ඇමතිවරයා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය සමන් කැලේගම මහතා හමුවී මැලේසියාව සහ ශ්‍රී ලංකාව අතර වෙළඳ සහ ආයෝජන සම්බන්ධතා ගැඹුරු කිරීමේ ක්‍රම සහ විධි ගැන සාකච්ඡා කෙළේය.

## ජූනි

### සංයුක්ත දේශගුණික තොරතුරු කළමනාකරණ පද්ධතියක් සඳහා කලාපීය ප්‍රවිචාරණ වැඩ මුළුව: කොළඹ ගලදාරි හෝටලයේ දී



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ජනතක්ෂන් සහ සංවර්ධනය සහ පාරිසරික ආර්ථිකය සඳහා වූ දකුණු ආසියානු ජාලය (SANDEE ) සමග එක්ව ''තීරණ වඩාත් කාර්යකෂ්මව යොදා ගැනීම සඳහා ඇති තොරතුරු සහ සන්නිවේදන හිඩැස් පියවීම: සංයුක්ත දේශගුණික තොරතුරු කළමනාකරණ පද්ධතියක් පිළිබඳ වැඩ මුළුවක් සංවිධානය කෙළේය.

# 2016 වසරේ කැපී පෙනෙන සිද්ධීන්

## ජුලි

තායිලන්තයේ බැංකොක් නගරය



තායිලන්තයේ බැංකොක් හි 2016 ජුලි 21 දින පැවති සම්ප්‍රේෂණ පිළිබඳ කොළඹ ක්‍රියාවලියේ තේමාගත ප්‍රදේශ ක්‍රියාකාරි කණ්ඩායමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ප්‍රධාන ආචාර්ය බිලේෂා වීරරත්න සහභාගි වූවාය. එහිදී ඇය ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් ''සම්ප්‍රේෂණ සහ ස්ත්‍රී පුරුෂ භාවය' මැයෙන් ඉදිරිපත් කිරීමක් කළායි එම රැස්වීමට කොළඹ ක්‍රියාවලියේ සාමාජික රටවල් සියල්ලම සහභාගි වූහ.

## අගෝස්තු

ශ්‍රී ලංකාවේ ආර්ථික හමුව 2016: කොළඹ සිනමන් ග්‍රෑන්ඩ්




ශ්‍රී ලංකාවේ වානිජ මණ්ඩලය (CCC) සංවිධානය කළ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ අනුග්‍රහයෙන් පැවති ශ්‍රී ලංකා ආර්ථික හමුවේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය සමන් කැලේගම මහතා 'කලාපීය කේන්ද්‍රයක් වශයෙන් මතුවීමට ශ්‍රී ලංකාවට පහසුකරවන අන්තර්ජාතික වෙළඳාමේ භූමිකාව' මැයෙන් ඉදිරිපත් කිරීමක් කෙළේය.

## සැප්තැම්බර්

ෂේප් සවුත් ඒසියා 2016: කොළඹ සිනමන් ලේක්සයිඩ්




ග්ලෝබල් ෂේපර්ස් කොළඹ කේන්ද්‍රය සංවිධානය කළ ෂේප් සවුත් ඒසියා 2016 සැප්තැම්බර් මස කොළඹ දී පැවැත් වූ අතර ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය සමන් කැලේගම මහතා බංග්ලාදේශ් මහ කොමසාරිස් අතිගරු රියාස් හමිදුල්ලා මාලදිවයින් නියෝජ්‍ය මහ කොමසාරිස් අබ්බාස් ආදිල් රිසා සහභාගි වූ 'දකුණු ආසියානු නගර ප්‍රති පරිකල්පනය' පිළිබඳ සාකච්ඡා මණ්ඩපයේ දී කතා කෙළේය.

## ඔක්තෝබර්

2016 ඔක්තෝබර් මස එක්සත් ජනපදයේ වොෂින්ටන් හි දී පැවැත් වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුවේ වාර්ෂික රැස්වීම



එක්සත් ජනපදයේ වොෂින්ටන් හි දී පැවැත් වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුවේ වාර්ෂික රැස්වීමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ආචාර්ය දුෂ්නි වීරකෝන් සහභාගි වූවාය.

## නොවැම්බර්

හොටේල් ක්ලබ් පාම් බේ හි පැවති ආහාර සුරක්ෂිත භාවය සහතික කිරීම සඳහා පාඩම් බෙදා හදා ගැනීමේ සහ ප්‍රතිපත්ති ප්‍රචාරණ වැඩ මුළුව



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ජාතික විද්‍ය පදනම (NSF) සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සංගමය (SLAEA) සමග ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිත භාවය පිළිබඳ ප්‍රතිපත්ති විකල්ප සාකච්ඡා කිරීමට දෙදින වැඩ මුළුවක් සංවිධානය කෙළේයි වැඩ මුළුව හැඳින් වූයේ '' පාඩම් බෙදා හදා ගැනීමේ සහ ප්‍රතිපත්ති විකල්ප වැඩ මුළුව: ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිත භාවය සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති විකල්ප: සහල් මාළු සහ කිරි නිෂ්පාදන විවිධ වෙළඳ පොළ විශ්ලේෂණයක්'' යන්නය.

## දෙසැම්බර්

ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සංගමයේ 10 වැනි වාර්ෂික පර්යේෂණ මණ්ඩපය: තිරසාර සහ සියල්ලන් ඇතුළත් කර ගන්නා සංවර්ධනය සඳහා කෘෂිකර්මය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශ්‍රවනාගාරයේදී



ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍ය සංගමය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සමග හවුලේ සංවිධානය කරන ලද 2016 දෙසැම්බර් 8 වැනි දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශ්‍රවනාගාරයේ පැවති එම සංවිධානයේ 10 වැනි වාර්ෂික සාකච්ඡා මණ්ඩපයේ ප්‍රධාන දේශනය ප්‍රතිපත්ති අධ්‍යයන ආතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය සමන් කැලේගම මහතා විසින් පවත්වන ලදී. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ප්‍රධාන සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍ය සංගමයේ සභාපති ආචාර්ය අතුල සේනාරත්න මහතා පිළිගැනීමේ කතාව කළ අතර මූලික කර්මාන්ත අමාත්‍යංශයේ ලේකම් ඉංජිනේරු බන්දුල වික්‍රමාරච්චි මහතා විශේෂ අමුත්තා විය.

# සභාපති තුමාගේ පනිවුඩය



**ආචාර්ය රසීන් සාලි**

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට 2016 වසර කාර්ය බහුල වසරකී සාර්ව ආර්ථික ස්ථායිතාවය ප්‍රතිස්ථාපනය කිරීමට සහ ඇණහිට ඇති ඵලදායිතාවය වැඩි දියුණු කිරීමට ආණ්ඩුව ආර්ථික ප්‍රතිශෝධන දියත් කිරීමට ප්‍රයත්න දැරීමේ දී මෙම ආයතනයේ ප්‍රතිපත්ති විශේෂඥතාවයට සහ උපදෙස් සඳහා ඇති ඉල්ලුම වැඩි වෙමින් පවතී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කෙටි කාලින සහ දිගු කාලීන පර්යේෂණ න්‍යාය පත්‍රය ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා කෙරේ දිගටම යොමු වනු ඇතී පෞද්ගලික අංශය නිදහස් කිරීමටත් ගෝලීය ආර්ථිකයට වඩාත් ගැඹුරින් අන්තර්ග්‍රහණය වීමටත් ශ්‍රී ලංකාවට වෙළඳ පොළ ප්‍රතිශෝධන අවශ්‍ය යී වර්ධනයේ සහ ධනය නිර්මාණයේ උල්පත් වන්නේ ඒවායී ඒ නොමැතිව ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික අභියෝග – දරිද්‍රතාවය□ අධ්‍යාපනය□ නිපුණතා□ වයස්ගතවීම□ සෞඛ්‍ය ආරක්ෂණය□ නාගරිකකරණය□ පරිසරය සහ තවත් බොහෝ දේ විසඳිය නොහැකිය

2017 ජුනි මස මෙම ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය සමන් කැලේගම මහතාගේ හදිසි වියෝවීමත් සමග මහත් කම්පනයකට ලක්වියී ඔහු මෙම ආයතනයේ මුල්ම කාලයේ සිට එහි ප්‍රතිමූර්තියක් වියී සමන් 1990 සිට මෙම ආයතනයේ වැඩ කළ අතර 1995 සිට විධායක අධ්‍යක්ෂ ලෙස ඊට නායකත්වය දුන්නේයී ඔහු වෘත්තීය පර්යේෂකයන් තිහකට වැඩි සංඛ්‍යාවක් ද ඇතුළත් වන සේ ආයතනයේ කාර්ය මණ්ඩලය හැටක් දක්වා පුළුල් කිරීමට පියවර ගත්තේයී වෙන කිසිවෙකුටත් වඩා සමන් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ සම්බන්ධයෙන් ප්‍රමුඛස්ථානයට පත් කිරීමට කටයුතු කෙළේයී ඔහු ප්‍රදාන අරමුදලක් පිහිටුවා□ ආයතනය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කොට වත්මන් කාර්යාලය නිදහස් චතුරශ්‍රයට ගෙන ඒම අධීක්ෂණය කෙළේයී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ස්වාධීනත්වයත්□ දේශපාලන පක්ෂ පාතිත්වයෙන් තොරව අපක්ෂපාත පර්යේෂණ ආයතනයක් ලෙස එහි අවංක භාවය

> **2017 ජුනි මස මෙම ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය සමන් කැලේගම මහතාගේ හදිසි වියෝවීමත් සමග මහත් කම්පනයකට ලක්විය.**

ආරක්ෂා කිරීම සහ පවත්වා ගැනීම සමන්ගේ චරිත ස්වභාවයට සහ අධිෂ්ඨානයට නිදසුන් යී මෙය ශ්‍රී ලංකාවේ සුළුපටු කාරණයක් නොවේ

සමන් ගේ අභාවය මෙම ආයතනයට පමණක් නොව ආණ්ඩුවට සහ රටට පාඩුවකී ආණ්ඩුවේ නොයෙකුත් කොමිසන් සභාවල සහ උපදේශක මණ්ඩලවල□ පසුගිය ජනාධිපති බදු කොමිසමට දායකත්වය ලබා දීමෙන් සමන්ට රාජ්‍ය සේවයේ දීර්ඝ ඉතිහාසයක් ද ඇත්තේයී පසුගිය වසර දෙක තුළ ඔහු විශේෂයෙන් සංවර්ධන ක්‍රමෝපායන් සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යංශයේ වෙළඳ ප්‍රතිපත්තිය පිළිබඳ උසස් නිලධාරියෙකු සහ උපදේශකයෙකු වශයෙන් රාජ්‍ය සේවයේ නිරත වුයේයී ඔහු ඉන්දියාව□ චීනය සහ සිංගප්පූරුව සමග අපගේ වෙළඳ සාකච්ඡාවලදී සහ ජාතික නව වෙළඳ ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී තීරණාත්මක භූමිකාවක් ඉටු කෙළේය

සමන්ගේ වියෝව පිටරටවලටත් දැනෙනු ඇතී ඔහු දකුණු ආසියානු සහ පුළුල් ආසියානු ප්‍රතිපත්ති ජාලයන්හි පදනමක් වූයේයී ඔහුට ස්තූති වන්නට මෙම ආයතනය ද එම ජාලයන්ට ඇතුළත් වියී සමන් ගේ සහ මෙම ආයතනයේ ලොව පුරා සිටින මිතුරන්ගේ ශෝක පණිවුඩ වලින් අපි සියල්ලෝම කම්පාවට පත් වූයෙමු

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය සමන්ගේ උරුමය මත මෙම ආයතනය ගොඩ නැගීමට සහතික වන්නෙමු

2017 ජුලි 25

In Memoriam of

# Dr. Saman Kelegama, Executive Director, IPS

**1995 – 2017**



## A Visionary, whose Legacy was Built on Humility and Humanity

### In Appreciation of Dr. Saman Kelegama, by the Staff of IPS

Those of us who have been fortunate enough to work with Dr. Saman Kelegama during his long and distinguished tenure at the Institute of Policy Studies of Sri Lanka (IPS), first as a Research Fellow from 1990 and then at the helm as its Executive Director from 1995, are immeasurably saddened by his sudden demise on Friday 23 June, 2017.

His legacy at the IPS was driven by three core beliefs that he held dear; foster independent thinking, secure financial stability, and provide an enduring IPS identity. His ideas and vision have bequeathed to us a sense of all that is possible to achieve, if there is drive and determination to pursue your dreams.

The culture of independent thought that Dr. Kelegama nurtured has seen innumerable numbers of us returning to the IPS, time after time, on completing post-graduate studies or professional qualifications abroad. His mantra of 'you are representatives of IPS' inculcated a spirit of commitment and self-belief in all of us. The liberal, free thinking environment fostered intellectual growth of the many researchers who have passed through IPS' doors and encouraged our team of support service professionals to innovate and deliver. We believe it is this legacy of independent research and engagement in public policy discourse that is Dr. Kelegama's enduring legacy, not only to IPS but to Sri Lanka and the wider regional community.

Dr. Kelegama understood from the outset that in order to sustainably build human capital, research capacity, and an efficient and effective organizational machinery, long-term financial security is a must. He worked tirelessly towards this end from the outset. On taking the helm as the Executive Director, his first priority was to secure a financial base for the IPS in 1995. His foresight and diligence allowed us to expand our activities over time and weather changes in fortunes when raising research grant funds.

Dr. Kelegama was also passionately convinced that a growing organization must have an identity that is uniquely its own. This he envisioned in the form of a permanent office for the IPS, custom built to suit our own requirements. He embarked on this journey as early as 2000. Again, his vision and foresight was commendable. It took him a further decade in which to realize his dream, when the IPS head office was ready for occupation in 2010. Through all the years of innumerable delays in obtaining land and raising funds for construction, Dr. Kelegama persevered tirelessly against all obstacles, and personally oversaw the project over a three year period until completion. His commitment to bequeathing a beautiful office in which we are so fortunate to work in will never be forgotten.

# In Memoriam of Dr. Saman Kelegama, Executive Director, IPS

Through all his pioneering efforts to build a strong and stable organization, Dr. Kelegama's humility and humanity are perhaps what we will remember most. His career is too long and distinguished to detail here, but he was the most modest of men. On most occasions, we, the staff of IPS, would find out the details of his numerous high profile appointments and accomplishments only well after the event or through other sources. Dr. Kelegama's belief was that 'you just get on with the job'. His humility was only surpassed by his humanity. No personal difficulty faced by a staff member was ever too small for a sympathetic hearing from him.'We must be sympathetic on humane grounds' was his second mantra.

Dr. Kelegama left us too soon. We have lost a visionary head and the IPS will never be the same without him. But, we have all gained from working with him. We want to thank him for his ideas and vision; he inspired us all, and his legacy will live on.

We offer our deepest condolences to Mrs. Kelegama, Chandana and Jayathri.

May Dr. Kelegama attain the supreme bliss of nibbana.

*29th June 2017*

## Messages of Condolence

'I hope with time you are coping up with the great loss you, IPS and all of us have gone through. At RIS, we are all deeply perturbed over sudden demise of our great friend Saman. It is indeed an early and untimely loss....'

***Prof. Sachin Chaturvedi***
*Director General, Research and Information System for Developing Countries (RIS), India*

'A leading voice for economic and human development work in Sri Lanka, we note that Dr. Kelegama shaped the IPS portfolio to respond to Sri Lankan challenges and opportunities, including on health, education, migration, urbanisation, remittances, skills development, industrial policy, agriculture and climate change...'

***Peter Taylor***
*Associate Director, Think Tank Initiatives*

'I am writing this with a heavy heart on the loss of my very dear friend of 25 years here in Bangkok under most tragic circumstances...'

***Nagesh Kumar***
*Director, Social Development Division, UNESCAP*

'He was a fellow fighter at various global platforms to promote the region's interests...'

***Fahmida Khatun***
*Executive Director, Centre for Policy Dialogue (CPD), Bangladesh*

'His legacy will remain with us.We will remember him as a top-class policy honcho, a committed SARCist/BOBist and a wonderful human-being....'

***Bipul Chatterjee***
*Executive Director, CUTS International, India*

'Saman is supposed to have coined the term "brain gain" to counter the fears of the brain drain. He was so much the living example of that gain, not just for Sri Lanka, but for all of us South Asians...'

***Shekhar Shah***
*Director-General, National Council of Applied Economic Research (NCAER)*

'He was his usual positive, humble self, offering constructive comments and suggestions, during an ESCAP dialogue held in Bangkok, also attended by a SAWTEE colleague...'

***Posh Raj Pandey***
*Chairman, South Asia Watch on Trade Economics and Environment (SAWTEE), Nepal*

'Saman was a stellar individual who influenced the course of economic integration in South Asia. Of course, this was beset with challenges, but Dr. Kelegama was not the one to flinch from difficulties...'

***Abhijit Das***
*Professor & Head, Centre for WTO Studies, New Delhi*

'Dr. Kelegama was an untiring Southern Voice activist, true representative of 'Southern Voice' in any global platform...'

***Southern Voice***

'Many of us, including myself, had met Saman during his visit to Monash some years ago and also during the conference in Colombo early this year..'

***Michael Ward***
*Professor, Head of Department, Economics, Monash Business School*

'He directed the Institute of Policy Studies in Colombo for many years until his death, applying his sharp intellect and well heeled diplomatic skills to ensure evidence and careful analysis informed debates about economic and social conditions across the country..'

***Professor David Hulme***
*Global Development Institute*

'His energy and life-long dedication to improve quality of economic policymaking in Sri Lanka and the region will continue to inspire us all...'

***Dr. Shamshad Akhtar***
*United Nations ESCAP to Ambassador of Sri Lanka, Bangkok*

'With every exchange and at every meeting with members of the IDRC team, Dr Kelegama demonstrated not only his keen intellect but his compassion and dedication to making the world a better place for all...'

***Jean Lebel,*** *IDRC, President*

'Dr. Kelegama was one of the most respected and leading Economists who contributed to formulating policy and provided guidance to many governments in the country...'

***Simrin Singh***
*Country Director - ILO*

'Dr. Kelegama supported ADB's work in Sri Lanka by engaging with SLRM's economic team as well as ADB's work at Headquarters such as economic research and regional cooperation and integration...'

***Sri Widowati***
*Country Director, ADB Resident Mission, Sri Lanka*

# 2016 දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය




## අපගේ පර්යේෂණ

අප පර්යේෂණවල ප්‍රමාණාත්මක අවධානය යොමු වූයේ තිරසාර වර්ධනය□ සමානත්වය සහ දරිද්‍රතාවය සමනය කිරීම සඳහා ශ්‍රී ලංකාව මුහුණ දෙන මධ්‍ය කාලින සහ දීර්ඝ කාලීන සංවර්ධන අභියෝගවලට සංයුක්ත විශ්ලේෂණයක් ලබා දීමයි පර්යේෂණ වැඩ සටහන්වලට 1) සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය 2) අන්තර්ජාතික ආර්ථික ප්‍රතිපත්තිය 3) ශ්‍රම□ සේවා නියුක්තිය හා මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය 4) කර්මාන්ත තරගකාරිත්වය සහ නියාමන ප්‍රතිපත්තිය 5) දරිද්‍රතාවය සහ සමාජ සුභසාධන ප්‍රතිපත්තිය 6) කෘෂිකාර්මික ආර්ථික ප්‍රතිපත්තිය 7) පාරිසරික ආර්ථික ප්‍රතිපත්තිය 8) සෞඛ්‍ය ආර්ථික ප්‍රතිපත්තිය යන ක්ෂේත්‍ර ඇතුළත් විය



- ප්‍රතිපත්ති ප්‍රතිශෝධනය සහ තරගකාරිත්වය
- සංක්‍රමනය සහ නාගරික කරණය
- තිරසාර සංවර්ධනයට මානව සම්පත්
- පෞද්ගලික අංශයේ සංවර්ධනය
- දරිද්‍රතාවය සහ අවදානම්බව
- පරිසරය□ ස්වභාවික සම්පත් සහ කෘෂිකර්මය

# ප්‍රතිපත්ති ප්‍රතිශෝධනය සහ තරගකාරිත්වය

## සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය අවදානම් තත්වයක පවතී දුර්වල මූල්‍ය කළමනාකරණය නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ආයෝජනය හා ඵලදායිතාවය මුළුල්ලේම එකිනෙක හා බැඳුණු ප්‍රශ්න ගණනාවක බලපෑමට ලක්ව ඇති ආයතනයේ ප්‍රධානම වාර්තාව වන 2016 ආර්ථිකයේ තත්වය ප්‍රකාශනයේ ''වර්ධනය සඳහා බදු ප්‍රතිපත්තිය: සංවර්ධනය සඳහා තිරසාර මූල්‍යනයී'' යන සමස්ත තේමාව යටතේ ශ්‍රී ලංකාවේ බදු පදනම පුළුල් කිරීම සහ වියදම් හේතු යුක්ති කිරීම සහ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට වැය පියවර ගැනීම සමග විකෘතිවීම් අවම කිරීම අරමුණු කර ගත් බදු ප්‍රතිපත්තිය ස්ථාවර කිරීමක් ඉල්ලා සිටියේයි පුළුල්ව බෙදා හරින වාර්ෂික වාර්තාව තිරසාර වර්ධනයක් සඳහා මූලික පූර්ව කොන්දේසියක් ලෙස මනා බදු ප්‍රතිපත්තියක අවශ්‍යතාවය පෙන්වා දේ වාර්ෂික ප්‍රකාශන ප්‍රතිපත්ති සැලසුම්කරුවන්, ශාස්ත්‍රඥයන්, සංවර්ධන හවුල්කරුවන් මෙන්ම පෞද්ගලික අංශය අතර පුළුල්ව බෙදා හැරේ.

ලෝක බැංකුවේ තාක්ෂණ සහ මූල්‍ය සහාය ඇතිව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයන් වන නිෂා අරුණතිලක, ප්‍රියන්කා ජයවර්ධන සහ නෙළුකා ගුණසේකර ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය බෙදාහැරීමේ ඵලවිපාක පරික්ෂා කිරීමට අධ්‍යයන ගණනාවක් පැවැත්වීමට ( බදු සහ සහනාධාර බෙදාහැරීම, සමානාත්මතාවයට කැපවීම, රාජ්‍ය මුදල්, රාජ්‍ය වැඩසටහන්) සම්බන්ධ වූහ. ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය වැය කිරීම තුළින් සමස්තයක් වශයෙන් ක්‍රමානුකූලව දරිද්‍රතාවය අඩු කරන බව අධ්‍යයනයන්ගෙන් පෙන්නුම් කරයි. රැස් කෙරෙන සෘජු බදු ප්‍රමාණය ඉතා කුඩා නිසා ආදායම් නැවත බෙදාහැරීම කෙරේ ඉන් ඇතිවන බලපෑම සුළුයී අනෙක් අතට වක්‍ර බදු පසුගාමී යී වැය පාර්ශ්වයෙන් බලනවිට සෘජු පැවරීම් මගින් ආදායම් බෙදාහැරීමේ සමානත්වය වර්ධනය වන නමුත් එහි සීමිත ප්‍රමාණය නිසා ඇති කෙරෙන බලපෑම කුඩායී වක්‍ර සහනාධාර ප්‍රගතිගාමී වන නමුත් එහි ඵලප්‍රයෝජන ඉහළ ආදායම් කණ්ඩායම් අතර වැඩි වීමෙන් ආදායම් නැවත බෙදාහැරීමේ මාධ්‍යයක් ලෙස කාර්යක්ෂමතාවයෙන් අඩුය.

## වෙළඳාම ආයෝජන සහ මූල්‍ය

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට ඇති වෙළඳ අනුපාතය පහත වැටෙමින් පවතින අතර එය පසුගිය දශකයේ වෙළඳ හිඟය වැඩි වීමට හේතු වීමෙන් රටේ අස්ථායි සාර්ව ආර්ථික පරිසරයකට හේතු විය. මෙවැනි සන්දර්භයක ශ්‍රී ලංකාව කුඩා රටක් වීමෙන් එහි වෙළඳ පොළ පුළුල් කළ හැකි වන්නේ වෙළඳාම, ලිහිල්කරණය, අපනයන ප්‍රවර්ධනය සහ වෙළඳ ගිවිසුම් මගිනී ආණ්ඩුවේ ප්‍රධාන න්‍යාය පත්‍රයක් වන්නේ ආසියාවේ වෙළඳ හවුල්කරුවන් සමග ගිවිසුම් ගණනාවක් හරහා වෙළඳ පොළ පිවිසුම වැඩි කර ගැනීමයී මේ සම්බන්ධයෙන් ආණ්ඩුව ඉන්දියාව සමග ආර්ථික සහ තාක්ෂණ සහයෝගිතාවය පිළිබඳ ද්විපාර්ශ්වීය ගිවිසුමක් ඇති කර ගැනීමට සලකා බලමින් සිටී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ලෝක බැංකුවෙන් ලබා දුන් අරමුදල් යොදා ගනිමින් ඉන්දියාව සමග

*ප්‍රතිපත්ති කාර්යක්ෂමතාවය පදනම් වන ක්‍රියාවලිය සහ ආයතනික වැඩ පිළිවෙළ වර්ධනය සහ සංවර්ධනයට ඇති ආර්ථික සහ දේශපාලන බාධක ජය ගැනීමේ දී තීරණාත්මක සාධකයී ප්‍රතිපත්ති කාර්යක්ෂමතාවය දුෂ්කර නමුත් අවශ්‍ය වූ ප්‍රතිශෝධන හඳුනා ගැනීම, ප්‍රමුඛතා ගත කිරීම, මුල පිරීම, ක්‍රියාත්මක කිරීම සහ කාලයක් තිස්සේ පවත්වා ගැනීම තහවුරු කළ හැකිය. ශ්‍රී ලංකාවේ දැනට පවතින ජන විද්‍යාත්මක පරිණාමය සැලකිල්ලට ගත්විට ඉහළ වර්ධන වේගයක් අත්කර ගත හැකි වන්නේ ආර්ථිකයේ තරගකාරිත්වය සහ ආයතනික ධාරිතාවන් නගා සිටුවීමේ නියාමන ප්‍රතිශෝධන මාලාවක් ඇතුළත් වන ශ්‍රම ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමෙනී ඒ සඳහා නිෂ්පාදන සාධක නැවත වෙන් කිරීමට ඉඩ සැලසෙන හා නිෂ්පාදනය සහ අපනයන භාණ්ඩ වර්ග පුළුල් කිරීමට ඉඩ සැලසෙන ප්‍රතිපත්ති අවශ්‍ය ය. එමෙන්ම නව නිෂ්පාදන ක්‍රමවේද සහ ක්‍රියාවලීන් සහ වෙනස් යෙදවුම් භාවිතා කළ යුතුය.*

ඇති කර ගන්නා ආර්ථික සහ තාක්ෂණ සහයෝගිතා ගිවිසුමකින් ශ්‍රී ලංකාවට ඇති වාසි සහ අවාසි ගැන අධ්‍යයනයක් කිරීමට භාර ගත්තේය. උපදේශක රවි රත්නායකගේ නායකත්වයෙන් යුත් අධ්‍යයන කණ්ඩායමට මෙම ආයතනයේ පර්යේෂකයන් වන ජානක විජයසිරි, සුවේන්ද්‍රිනි ජයරත්න, නිපුණි පෙරේරා, ෂොන්ටල් සිරිසේන සහ කිත්මිණ හේවගේ දායක වූහ.

වෙළඳ සාකච්ඡා තුළින් තීරු බදු පහත දැමූ විට තීරු බදු නොවන මාර්ගවලින් (NTM ) ගිවිසුම් භාවිතය අඩු කළ හැකියී එමනිසා නිදහස් වෙළඳ ගිවිසුම් ශ්‍රී ලංකාවට වඩාත් අර්ථදායී වීමට නම් තීරු බදු අඩු කිරීම්/ඉවත් කිරීම් සමග තීරු බදු නොවන මාර්ග හඳුනාගෙන ඒවා ආමන්ත්‍රණය කළ යුතුයී ඒ සඳහා චීන වෙළඳ පොළට පිවිසීමේ දී අපනයනකරුවන් මුහුණ දෙන තීරු බදු නොවන මාර්ග ඇතුළත් සීමාවන් හඳුනා ගැනීමට සහ මෙම සීමාවන් පහසු කිරීමට/ කළමනාකරණයට නිර්දේශ ලබා දීම සඳහා අධ්‍යයනයක් ( චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ චීන වෙළඳ පොළ පිවිසීම පිළිබඳව අපනයනකරුවකුගේ දැක්ම) කරන ලදී එම පර්යේෂණ කණ්ඩායමට ජානක විජේසිරි, දර්ශනී ප්‍රේමරත්න සහ නිපුණි පෙරේරා ඇතුළත් විය.

1985 සිට ආර්ථික සහයෝගිතාවය ප්‍රවර්ධනය කළ ද දකුණු ආසියාව ආර්ථික වශයෙන් ලොව අඩුවෙන්ම අන්තර්ග්‍රහණය වූ කලාපයකි. වැඩි දුරටත් අන්තර්කලාපීය ගුවන් සම්බන්ධතාවයෙන් ද දුර්වල තත්වයක පවතී දකුණු ආසියාවේ ගුවන් සම්බන්ධතා අතින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ඉතා හොඳ තත්වයක ඇතී 2003 සිට ගුවන් සේවා ලිහිල්කරණය දෙරට අතර ගුවන් සම්බන්ධතාවයේ ප්‍රධාන වර්ධනයන්ට හේතු වූවා විය හැකියී ලෝක බැංකුවේ අරමුදල්වලින් දකුණු ආසියාවේ ගුවන් සේවා ලිහිල්කරණය ( අදියර 1) පිළිබඳ

අධ්‍යයනය ගුවන් සේවා ලිහිල්කරණයේ සාර්ථකත්වය සහ අභියෝග හෙළිකර ගැනීමේ අරමුණෙන් ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ගුවන් සේවා ලිහිල්කරණයේ අත්දැකීම් විමර්ශනය කෙරේ් එම අධ්‍යයනයෙන් ගුවන් සේවා ලිහිල්කරණය පිළිබඳ ප්‍රතිපත්ති සංවාදය දැනුවත් කිරීමට සහ දකුණු ආසියාවේ අනෙකුත් රටවල් අතර ද එවැනි තත්වයක් පවත්වා ගැනීමේ උනන්දුවක් ඇති කිරීමට අරමුණු කරයි්

පසුගිය කාලය තුළ ශ්‍රී ලංකාවේ වෙළඳ ක්‍රියාකාරිත්වය දුර්වලවීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කරන නිසා භාණ්ඩ සහ වෙළඳ පොළ මෙන්ම අපයනයන භාණ්ඩ විවිධාංගකරණය ද ශ්‍රී ලංකාවේ අපනයන නගා සිටුවීම සඳහා අවශ්‍ය යි පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යංශය සමග සහයෝගිතාවයෙන් අප ආයතනයේ පර්යේෂකයන් වන සුවේන්ද්‍රිනී ජයරත්න සහ නිපුණි පෙරේරා නව භාණ්ඩ□ නව වෙළඳ පොළ යෝජනාක්‍රමය සහ කලාපීය/ගෝලීය වටිනාකම් දාමයන්ට සම්බන්ධවීම පිළිබඳව කරන ලද අධ්‍යයනයෙන් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා නව වෙළඳ පොළ සහ නව භාණ්ඩ සඳහා ඇති තරගකාරී විභවයන් හඳුනා ගනී් මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණු වන්නේ: ශ්‍රී ලංකාවේ අපනයන තරගකාරිත්වය වැඩි දියුණු කිරීමේ අරමුණෙන් නව භාණ්ඩ/නව වෙළඳ පොළ තරගකාරී විභවයන් හඳුනා ගැනීමයි්

ශ්‍රී ලංකාව දැනට වෙළඳ ගිවිසුම් කීපයකට අත්සන් තබා ඇති අතර ඉන්දියාව□ චීනය සහ සිංගප්පූරුව සමග වෙළඳ ගිවිසුම් සඳහා සාකච්ඡා පවත්වමින් සිටී් ආසියා පැසිපික් කලාපයේ වෙළඳ ගිවිසුම් වැඩි වෙමින් පවතින අතර කලාපය තුළ මහා වෙළඳ කණ්ඩායම් මතුවෙමින් පවතී් වසර පහකට වැඩි කාලයක් රහසිගතව සාකච්ඡා පැවැත්වීමෙන් පසුව 2016 පෙබරවාරි මස ට්‍රාන්ස් පැසිපික් හවුල් ගිවිසුම අත්සන් තබන ලදී් මෙම කටයුත්ත සම්පූර්ණ වීමෙන් එහි ඇති විස්තීර්ණ වූ කලාපීය සහ ගෝලීය බැඳීම් නිසා මහා වෙළඳ ගිවිසුම්වල පළමු වැන්නවීම එක්තරා ආකාරයක කඩඉමකි් ට්‍රාන්ස් පැසිපික් හවුල ශ්‍රී ලංකාව කෙරේ ඇති කළ හැකි බලපෑම පිළිබඳ මූලික තක්සේරුවක් මෙම ආයතනය සංවර්ධන උපාය මාර්ග සහ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ අමාත්‍යංශය සඳහා සිදු කර ඇති් එම පර්යේෂණ කණ්ඩායමට ඇතුළත් වන්නේ දුල්ෂි වීරකෝන්□ ජානක විජයසිරි□ සුවේන්ද්‍රිනී ජයරත්න□ රවීන් ඒකනායක□ නිපුණි පෙරේරා□ කිත්මින හේවගේ සහ චන්තල් සිරිසේන යී්

ශ්‍රී ලංකාව ජගත් වෙළඳ සංවිධානයේ සාකච්ඡාවල දිගටම නිරතව සිටී් කෙසේ වුවත් ජිනීවා ජගත් වෙළඳ සංවිධානයේ නියෝජිතයන් තම පෞද්ගලික අංශයේ ඕනෑ එපාකම් ගැන සම්පූර්ණයෙන්ම දැනුවත් නැති් මෙය වෙළඳ බාධක ප්‍රමාණවත්ව ආමන්ත්‍රණය නොවන සාකච්ඡා ස්ථාවරවලට තුඩු දිය හැකියි් මෙය සංවර්ධනය වන සහ අඩුවෙන්ම සංවර්ධිත රටවල නියෝජිතයන් සම්බන්ධයෙන් වඩාත් කැපී පෙනෙන්නේ එම රටවලට පාර්ශ්වකරුවන්ගේ පුළුල් ප්‍රවිචාරණ පැවැත්වීමට සම්පත් සහ පද්ධති නොමැතිකම යී් මෙම තත්වය සමනය කිරීමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ජිනීවා හි CUTS ආයතනය සමග එක්ව පෞද්ගලික අංශයේ අදහස් පදනම් කරගෙන කරුණු පහක් පිළිබඳ සටහන් සකස් කර ඇත



**ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ප්‍රධාන** ආචාර්ය ජානක විජයසිරි මෙම ආයතනයේ පැවති ශ්‍රී ලංකාව පිළිබඳ සම්මන්ත්‍රණයේ දී

## ප්‍රකාශන

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන□ බැංකොක් දකුණු ආසියාවේ ස්ත්‍රී ව්‍යවසායකයන්ගේ නැගීම: රටේ පසුබිම් අධ්‍යයනය: ශ්‍රී ලංකාව වෙනස්වීමේ වෙළඳ සුළං පරිච්ඡේදය ජානක විජයසිරි□ දිලානි හිරිමුතුගොඩ□ සුනිමලී මදුරාවල සහ දර්ශනී ප්‍රේමරත්න විසින්

.




ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වෙළඳාම පහසුකිරීම' ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සාකච්ඡා පත්‍රිකා මාලාව අංක 22 ජානක විජයසිරි සහ සුවේන්ද්‍රිනී ජයරත්න මාර්තු.

''ශ්‍රී ලංකාව කලාපීය සමුද්‍ර ප්‍රවාහන කේන්ද්‍රය'' කෘතියේ පරිච්ඡේදයී පුලුමර් ඇම් ජී. මෝර්ගන් පී ජේ සහ විග්නරාජා ජී.(සංස්කාරකවරුන්) ''ආසියාව සම්බන්ධ කිරීම: දුෂ්ණි වීරකොන් සහ නිපුණි පෙරේරා විසින් ''දකුණු සහ අග්නි දිග ආසියාව අන්තර් සම්බන්ධ කිරීමේ යටිතල පහසුකම්'' චෙල්ටන්හැම්: සීමා සහිත එඩ්වර්ඩ් එල්ගාර් ප්‍රකාශන.

## දේශන පැවැත්වීම්

ඔක්තෝබර් 10 සහ 11 බීජින් හි සමාජ විද්‍යා පිළිබඳ චීන ඇකඩමිය සහ බීජින් විදේශ අධ්‍යයන විශ්ව විද්‍යාලය සමග එක්ව ගෝලීය උපාය මාර්ග පිළිබඳ ජාතික ආයතනය සංවිධානය කළ සම්මන්ත්‍රණයේ දී ''එක තීරුවක් එක මාවතක්: ශ්‍රී ලංකා දැක්ම'' යනුවෙන් ජානක විජයසිරි කළ ඉදිරිපත් කිරීම

නොවැම්බර් 18 සහ 19 චීනයේ බීජින් හි චීන සමාජ විද්‍ය ඇකඩමිය සංවිධානය කළ 'චීනය සහ එහි අසල්වැසියන් අතර පොදු අනාගත ප්‍රජාවක් ගොඩ නැගීම'' සම්මන්ත්‍රණයේ දී ''චීන ශ්‍රී ලංකා ආර්ථික සහයෝගිතාවය'' මැයෙන් දූෂ්නි වීරකෝන් කළ ඉදිරිපත් කිරීම

ඔක්තෝබර් 22 කොළඹ ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය සංවිධානය කළ ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමයේ වාර්ෂික සැසියේ දී ''ශ්‍රී ලංකාව: ස්ථාවරත්වය□ වර්ධනය සහ ණය බර දූරීම'' දූෂ්නි වීරකෝන්

ජූලි 20 සහ 21 බංග්ලාදේශය දකී බංග්ලාදේශ් රාජ්‍ය පරිපාලන පුහුණු මධ්‍යස්ථානය සංවිධානය කළ සම්මන්ත්‍රණයේ දී ''පශ්චාත් ගැටුම් සමයේ සියල්ලන් ඇතුළත් කර ගන්නා වර්ධනය සහ පාලනය'' කිත්මිණි හේවගේ කළ ඉදිරිපත් කිරීම

ජූනි 1 කොළඹ සීටී සීඇල්එස්ඒ ( C T CLSA) සංවිධානය කළ දකුණු ආසියානු දේශ සීමා සම්මන්ත්‍රණයේ දී ''ශ්‍රී ලංකාවේ ආර්ථික අනාගත දැක්ම'' දූෂ්නි වීරකෝන්

පෙබරවාරි 6 කොළඹ හැටන් නැෂනල් බැංකුව සංවිධානය කළ එහි ශාඛා කළමනාකරුවන්ගේ වාර්ෂිකයේ දී ''ශ්‍රී ලංකාවේ ආර්ථික අනාගත දැක්ම'' දූෂ්නි වීරකෝන්

සැප්තැම්බර් 27 නවදිල්ලියේ රිස් (RIS ) සංවිධානය කළ බිම්ස්ටෙක් (BIMSTEC ) ප්‍රතිපත්ති බුද්ධි මණ්ඩලයේ කලාපීය




*Deputy Director, Dushni Weerakoon, at 'Building a Community of Common Destiny between China and its Neighbours,' Beijing, China.*

## දේශන පැවැත්වීම්

ප්‍රවිචාරණය හි දී ජානක විජේසිරි ''බිම්ස්ටෙක් නිදහස් වෙළඳ ගිවිසුමකට ඇති අභියෝග ශ්‍රී ලාංකීය දැක්ම'' ඉදිරිපත් කිරීම

අප්‍රේල් 20 ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී එම ආයතනය විසින් AMCHAM සාමාජිකයන් සඳහා සංවිධානය කළ ඉදිරිපත් කිරීමේ දී ජානක විජයසිරි ''ට්‍රාන්ස් පැසිපික් හවුල සහ ශ්‍රී ලංකාවට එහි බලපෑම'' දේශනයි

චීනයේ බීජිං නගරයේ දී චීනය සහ එහි අසල්වැසියන් අතර පොදු අනාගත ප්‍රජාවක් ගොඩ නැගීම'' සමුළුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ දුෂ්නි වීරකෝන්

ජුනි 3 කළුතර සාර්ක් වානිජ සහ කර්මාන්ත මණ්ඩල සංවිධානය කරන ලද 'දකුණු ආසියාවː වර්ධනය සඳහා නව ආදර්ශක හැඩ ගැසීම' සම්මන්ත්‍රණයේ දී ජානක විජයසිරි විසින් ''දකුණු ආසියාවේ ගුවන් සම්බන්ධතා' ඉදිරිපත් කිරීම

මාර්තු 1 - 3 ඉන්දියාවේ පොන්ඩිචෙරි හි පොන්ඩිචෙරි විශ්ව විද්‍යාලය හා UMISARC සංවිධානය කළ ''2030 දී ආසියාව පරිකල්පනයː මතුවන ප්‍රවනතා අභියෝග සහ විකල්ප'' සමුළුවේ දී කිත්මිණ හේවගේ 'වෙළඳාම සඳහා කලාපීය ආධාර තුළින් ආර්ථික සහයෝගිතාවය නැවත ශක්තිමත් කිරීමː යුරෝපයෙන් පාඩම්' ඉදිරිපත් කිරීම




පර්යේෂණ නිලධාරි කිත්මිණ හේවගේ ඉන්දියාවේ පොන්ඩිචෙරි හි දී තම දේශනය පවත්වමින්

## බ්ලොග්/ ලිපි

දෙසැම්බර් 22 දුෂ්නි වීරකෝන් 'ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2017ට සෙමින් පා තබයි' නැගෙනහිර ආසියා සාකච්ඡා මණ්ඩපයේ දී

නොවැම්බර් 28 ජානක විජයසිරි සහ නිපුනි පෙරේරා විසින් ප්‍රතිපත්ති දැක්ම ( Policy insights ) තීරුබදුවලට ඔබ්බෙන්ː චීනයට ශ්‍රී ලංකාවේ අපනයන

නොවැම්බර් 29 සහ 30 ඩේලි මිරර් ඩේලි එෆ්ටී දී අයිලන්ඩ් පුවත්පත්වල ජානක විජයසිරි ගේ 'වෙළඳාම මහා ව්‍යාපාර සඳහා පමණක් නොවේː ශ්‍රී ලංකාවේ වෙළඳාමේ සුළු සහ මධ්‍යම ප්‍රමාණ ව්‍යවසායන්ගේ ( SME ) භූමිකාව

අගෝස්තු 19 සහ 21 ඩේලි මිරර් ඩේලි එෆ්ටී දී අයිලන්ඩ් පුවත්පත්වල ෂොන්ටාල් සිරිසේන ගේ 'ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සහ විදේශ අයිතිය පිළිබඳ විවාදය'

ජූලි 14, 16, 17 දී අයිලන්ඩ් ඩේලි එෆ්ටී පුවත්පත්වල සුවේන්ද්‍රිනී ජයරත්න සහ කිත්මිණ හේවගේ 'ඔලිම්පික් සඳහා ආර්ථිකය' ලිපිය

ජූලි 14, 16, 17 දී අයිලන්ඩ් ඩේලි මිරර් සන්ඩේ ඔබ්සර්වර් පුවත්පත්වල ෂොන්ටාල් සිරිසේනගේ 'ශ්‍රී ලංකාවට කෘෂි අපනයනකරුවන්ට සෞඛ්‍යාරක්ෂාව සහ ශාඛ සෞඛ්‍යාරක්ෂා ප්‍රමිතීන් පවත්වා ගැනීමට වඩාත් උදවු කළ හැකිද?'

ජුනි 27 vivaLanka.com ණී දී අයිලන්ඩ් ඩේලි එෆ්ටී හි සුවේන්ද්‍රිනි ජයරත්න කිත්මිණ හේවගේ සහ ෂොන්ටාල් සිරිසේන 'බ්‍රෙක්සිට්ː එපමණ එක්සත් රාජධානිය නොවේ'

ජුනි 23 දී අයිලන්ඩ් ඒසියන් සන් පුවත්පත්වල නිපුනි පෙරේරා 'චීනයේ එක තීරුවත් එක මාවතක් මුලපිරුමː ශ්‍රී ලංකාවට ඇති බලපෑම'

මැයි 27 සහ ජුනි 1 ඩේලි එෆ්ටී ඩේලි නිවුස් පුවත්පත්වල සුවේන්ද්‍රිනි ජයරත්න සහ රවීන් ඒකනායක 'ශ්‍රී ලංකාවට ඍජු විදේශ ආයෝජන ගෙන්වා ගැනීමː ආයෝජකයින්ට හිතකර පහසුකරණයේ අවශ්‍යතාවය'

මැයි 11 දී අයිලන්ඩ් ඩේලි නිවුස් ජානක විජේසිරි සහ නිපුනි පෙරේරා 'ට්‍රාන්ස් පැසිපික් හවුල ශ්‍රී ලංකාවෙන් වෙළඳාම වෙනතකට හරවාද?'

ජනවාරි 25, අප්‍රේල් 28 සහ 29. ඩේලි මිරර් ඩේලි එෆ්ටී සහ දී අයිලන්ඩ් සුවේන්ද්‍රනි ජයරත්න ගේ 'වෙළඳ පහසුකරණ ගිවිසුම අපරානුමත කිරීම සහ ඩිජිටල් රේගු බදු වසර'

අප්‍රේල් 7 දී ඩිප්ලොමැට් කිත්මිණ හේවගේ ' එක්සත් ජනපදය නිදහස් වෙළඳ ගිවිසුමට එරෙහි වන්නේ ද?'

අප්‍රේල් 17 දී අයිලන්ඩ් රවීන් ඒකනායක සහ කිත්මිණ හේවගේ විදෙස් වෙළඳාම ගෝලීය නිෂ්පාදන ජාලයන් කෙරේ ප්‍රතිදිශානති කිරීමː ශ්‍රී ලංකාවට හදිසි අවශ්‍යතාවයක්'

මාර්තු පොන්ඩිචෙරි UMISARC ''2030 දී ආසියාව පරිකල්පනයː මතුවන ප්‍රවනතා අභියෝග සහ විකල්ප'' සමුළුවේ දී කිත්මිණ හේවගේ 'වෙළඳාම සඳහා කලාපීය ආධාර තුළින් ආර්ථික සහයෝගිතාවය නැවත ශක්තිමත් කිරීමː යුරෝපයෙන් පාඩම්' ඉදිරිපත් කිරීම

මාර්තු 15 නැගනහිර ආසියා සාකච්ඡා මණ්ඩපය දුෂ්නි වීරකෝන් 'ශ්‍රී ලංකාවේ ආර්ථික හිරවීමෙන් මිදීම'

# සංක්‍රමණය සහ නාගරික කරණය

*ශ්‍රී ලංකාව නිදහසින් පසු දශකවලදී සංක්‍රමණයේ සහ නාගරික කරණයේ නොයෙකුත් ආකාරයන් සහ තිව්‍රතාවයන් අත්දක ඇති දනට ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් දශ ලක්ෂ එකකට අධික ප්‍රමාණයක් විදෙස් රැකියා සඳහා සංක්‍රමණ වී සිටිති ආණ්ඩුව වසර ගණනාවක් තිස්සේ විදෙස් රැකියා සහ සම්ප්‍රේෂණ පහසු කිරීමට සංචාරක සහ විදෙස් විනිමය පරිවර්තනතාව පිළිබඳ රෙගුලාසි ලිහිල් කිරීමෙන් රැකියා පීඩණය අඩු කිරීමට සහ රටේ විදෙස් විනිමය ඌනතාවයෙන් මිදීමට ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය පහසු කෙළේයි මෑතකදී ප්‍රතිපත්ති ප්‍රමුඛතා වූයේ සංක්‍රමණික සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සුභ සාධනය සහ අන්තර්ජාතික සම්ප්‍රේෂණ ශ්‍රී ලංකාවට ලැබීම හානියට පත් නොවන ආකාරයෙන් සංක්‍රමණික සේවකයන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය, නිපුණතා සහ රැකියා සොයා යන රටවල් යන ත්‍රෛයිපාර්ශ්ව සංයුතිය වෙනස් කිරීම යී සංක්‍රමණ කර්මාන්තයට මෑතකදී මුහුණ දීමට සිදු වූ අභියෝගය ග්‍රාමීය සහ නාගරික යන දෙකොටසේම දේශීය වෙළඳ පොළට ශ්‍රම සැපයුම පහත වැටීම යී ගම්වල සිට නගරයට සංක්‍රමණයවීම ගම්වල ශ්‍රම සැපයුම පහත වැටීමට හේතු වියි නාගරිකයෙන් ජාත්‍යන්තරයට සංක්‍රමණයවීම තීව්‍රවීම නිසා නගරවල ශ්‍රම සැපයුම පහත වැටිණි*

විදෙස් රැකියා සඳහා ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණයවීම වසර ගණනාවක් තිස්සේ පැවති අතර දූන් විවිධ වූ වෙනස්වීම්වලට මුහුණ දීමට සිදු වූ නිසා සන්ධිස්ථානයකට පැමිණ ඇති මෙම වෙනස්වීම්වල එක ලක්ෂණයක් වන්නේ ගෝලීය ශ්‍රම වෙළෙඳ පොළ ක්ෂේත්‍රයන් හි ශ්‍රී ලාංකිකයන්ගේ සංඛ්‍යාව වැඩිවීම යී අනෙක් ලක්ෂණය වන්නේ ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණිකයන්ගේ සංයුතිය වෙනස්වීමයි ගෝලීය ශ්‍රම සංක්‍රමණ ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාව මෑත වසරවල සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇති ශ්‍රී ලංකාව විශේෂයෙන්ම ආසියානු ශ්‍රම සැපයුම් රටවල එකතුවක් වන කොළඹ ක්‍රියාවලියේ සභාපති තනතුර 2013 සිට දරයි ඒ සභාපති තනතුර වසර දෙකින් දෙකට මාරුවීමට නියමිතව තිබිය දීයි එමෙන්ම ශ්‍රී ලංකාව අබු ධාබි සංවාදයේ ඉදිරි සභාපති තනතුරට ද හඳුනා ගෙන ඇති ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය කොළඹ ක්‍රියාවලියේ අදාල ක්‍රියාකාරකම්වල කොටස්කරුවෙකි තායිලන්තයේ බැංකොක් හි පැවති සම්ප්‍රේෂණ පිළිබඳ කොළඹ ක්‍රියාවලියේ තේමාගත ක්ෂේත්‍ර ක්‍රියාකාරි කණ්ඩායමේ දී ''සම්ප්‍රේෂණ සහ ස්ත්‍රී පුරුෂ භාවය'' පිළිබඳ සම්පත් දායකයෙකු වශයෙන් ඉදිරිපත් කිරීමක් සඳහා මෙම ආයතනයේ පර්යේෂණ ප්‍රධාන බිලේෂා වීරරත්නට ආරාධනය කරන ලදී එමෙන්ම බංග්ලාදේශයේ පැවැත්වෙන සංක්‍රමණය සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය සාකච්ඡා මණ්ඩපයට (GFMD ) සහභාගිවන ශ්‍රී ලංකා දූත පිරිස සූදානම් කිරීම සඳහා කොළඹ පැවති සංක්‍රමණය සහ සංවර්ධනය පිළිබඳ පූර්ව ගෝලීය සාකච්ඡා මණ්ඩපයේ ප්‍රචාරණ වැඩ මුළුවට ''සංක්‍රමණයේ පිරිවැය අඩු කිරීම'' මැයෙන් දේශනයක් කිරීමට බිලේෂා වීරරත්නට ආරාධනයක් ලැබිණි බිලේෂා වීරරත්න කළ ඉදිරිපත් කිරීම්වලට පදනම් වූයේ 2016 දී ස්ත්‍රී පුරුෂ භාවය, බඳවා ගැනීමේ පිරිවැය, ප්‍රතිපත්ති බලපෑම් සහ ශ්‍රී ලංකාවේ අනාගත ශ්‍රම සංක්‍රමණය යන ක්ෂේත්‍රවල මෙම ආයතනය කළ සංක්‍රමණ පර්යේෂණයෙන් හෙළි වූ කරුණුයි

වොෂින්ටනයේ ලෝක බැංකුවේ සංක්‍රමණය සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය දැනුම් හවුල්කාරිත්වය (KNOMAD ) අරමුදල් සපයන ලද ''සංක්‍රමණය සහ ස්ත්‍රී පුරුෂ භාවීය ප්‍රතිඵල: ශ්‍රී ලංකාවේ තෝරාගත් ප්‍රතිපත්ති විශ්ලේෂණයක්'' පිළිබඳ ව්‍යාපෘතිය සංක්‍රමණ ප්‍රතිපත්ති තුනක් ඇති කරන ස්ත්‍රී පුරුෂ භාවීය බලපෑම ඇගයීමට අවධානය යොමු කෙරිණි ඒවා නම් සංක්‍රමණික සේවකයන් බඳවා ගැනීමේ දී නියෝජිතයන්ට අය කළ හැකි උපරිම මුදල් ප්‍රමාණය නියම කිරීම, සංක්‍රමණිකයන් පිටව යැමට පෙර නියම කෙරෙන අනිවාර්ය පුහුණුව සහ පවුල් පසුබිම් වාර්තාවක අවශ්‍යතාවයයි මෙම අධ්‍යයනයෙන් හෙළි වූ ස්ත්‍රී පුරුෂ බලපෑම්වලින් කීපයක් වන්නේ, ස්ත්‍රීන්ගේ ණය බැඳුම් තුරන් කිරීම සහ පිටව යැමට පෙර පැවති ණයගැති භාවය, ස්ත්‍රීන් බලහත්කාරයෙන් සංක්‍රමණයට යොමු කිරීම සහ ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර දරුවන් රැක බලා ගැනීමේ වගකීම් බෙදී යැමේ අසමානතාවය යී වැඩි දුරටත් එක ප්‍රතිපත්තියක සාධනීය ස්ත්‍රී පුරුෂ බලපෑම් අනෙක් ප්‍රතිපත්තියකින් නිෂේධ කරන බවද මෙම අධ්‍යයනයෙන් හෙළි වියි බිලේෂා වීරරත්න පවුල් පසුබිම් වාර්තා ප්‍රතිපත්තියේ බලපෑම් විශ්ලේෂණයක් ද කළායි එය Intenational Migration හි ''ළමයින්ගේ සුභ සාධනය ආරක්ෂා කිරීම සහ එය මවුවරුන්ගේ ශ්‍රම සංක්‍රමණය සීමාකිරීම පිළිබඳ හේතුඵල'' යනුවෙන් පළ වියි ඉන් පවුල් පසුබිම් වාර්තාවේ බලපෑම් ගණනය කර ඇති අතර මසකට ස්ත්‍රී සංක්‍රමණය 449 සිට 812 දක්වා සාමාන්‍යයකින් පහත වැටී ඇති බව පෙන්වයි '' සංක්‍රමණ පිරිවැය වටිනාකම් දාම විශ්ලේෂණය: අඩු නිපුණතා ශ්‍රම සංක්‍රමණය'' යන අධ්‍යයනය ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණය වන රටවල් තුනක් – සෞදි අරාබිය, මැලේසියාව සහ දකුණු කොරියාව යන රටවල් කෙරේ අවධානය යොමු කරයි එම රටවලට අඩු නිපුණතා සේවකයන් බඳවා ගැනීම ආණ්ඩුවෙන් ආණ්ඩුවට සහ පුද්ගලික අංශයෙන් පුද්ගලික අංශයට වශයෙන් නොයෙකුත් මට්ටම්වලින් සිදු වේ මෙම අධ්‍යයනයට ලෝක බැංකුවේ KNOMAD ආයතනයෙන් අරමුදල් ලබා දුන් අතර බිලේෂා වීරරත්න, ජානක විජයසිරි සහ සුවේන්ද්‍රිනි ජයරත්න සමීක්ෂණය කරන ලදී එහි එක් එක් රටකට ශ්‍රමිකයන් යවන ප්‍රධාන ආයතන, ඔවුන්ගේ අන්තර් සම්බන්ධතාවය, වටිනාකම් දාමයේ එක් එක් අවධියේ පිරිවැය හා බඳවා ගැනීමේ පිරිවැය අවම කිරීමට යෝජනා ඇතුළත් යී සැලකිය යුතු සංඛ්‍යාවක් විදෙස් රැකියා සඳහා පිටත්ව යැම නිසා සංක්‍රමණික සේවකයන් ඇතුළත් කිරීමෙන් රට තුළ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය වෙනස් වන්නේ ද යන්න ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදකයෝ නිතර ප්‍රශ්න කරති මෙම ප්‍රශ්නයට පිළිතුරු සෙවීමට නිෂා අරුණතිලක, ප්‍රියන්කා ජයවීර සහ සුනිමාලි මදුරාවල ''ශ්‍රම

වෙළඳ පොළ සහභාගිත්ව විශ්ලේෂණයට සංක්‍රමණික සේවකයන් අන්තර්ග්‍රහණය කිරීම'' මැයෙන් අධ්‍යයනයක් කළහ. විදෙස් සේවා නියුක්තික ශ්‍රී ලාංකිකයන් ඇතුළත් කිරීමෙන් රටේ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතයට බලපාන්නේ ආන්තික වශයෙන් බව එම අධ්‍යයනයෙන් හෙළි වියි එම අධ්‍යයනයට අරමුදල් සපයන ලද්දේ ජිනීවා ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙනි.

2016 වන විට ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණය ලක්ෂණ කීපයකින් පරිණාමය විය. එක අතකින් වැඩි වශයෙන්ම වූ ස්ත්‍රී ශ්‍රම සංක්‍රමණය වැඩි වශයෙන්ම පිරිමි නිපුණ ශ්‍රම සංක්‍රමණය දක්වා වෙනස් වියි ඒ සමගම රට තුළට කෙරෙන සම්ප්‍රේෂණ 2016 වසරේ දී පහත වැටෙන ප්‍රවනතාවයක් පෙන්නුම් කළ අතර පිටත්ව යන ගෘහ සේවිකා අනුපාතය නිපුණ සේවක අනුපාතයට වඩා පහත වැටිණ. බලය ලත් ආයතනවලින් කෙරෙන බඳවා ගැනීම් අනුපාතය වෙනත් මාර්ගවලින් කෙරෙන බඳවා ගැනිම්වලට වඩා පහත වැටිණී ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණ කර්මාන්තයේ සිදු වෙමින් පවතින වෙනස්කම් පදනම්ව බිලේෂා වීරරත්න ''ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳ පොළ අනාගතය'' යනුවෙන් සංකල්ප පත්‍රිකාවක් කම්කරු සහ වෘත්තීය සමිති සම්බන්ධතා අමාත්‍යංශය සංවිධානය කළ ශ්‍රම සහ සේවා නියුක්ති සම්මන්ත්‍රණයට ඉදිරිපත් කළාය. එම පත්‍රිකාවෙන් අවදානම් භාවයේ වෙනස් වන මුහුණුවරට ශ්‍රී ලංකාව හැඩ ගැසිය යුතු බවත් පසුගිය වසරවල සංක්‍රමණික සේවිකාවන්ගේ වැඩි අවදානම් බව ස්ත්‍රී පුරුෂ භාවය සඳහන් නොවීමෙන් සහ අඩුවෙන් වාර්තා කිරීමෙන් සටහන් වනු ඇති බවත් පෙන්වා දුන්නායී මෙම අධ්‍යයනය ස්ත්‍රී සංක්‍රමණිකයන්ගේ ප්‍රමාණය පහත වැටීම සම්ප්‍රේෂණ ලැබීමට කලාතුරකින් තම පවුල් නතර කර යන නිපුණ සංක්‍රමණිකයන්ගේ අනුපාතය වැඩිවීම සහ තාවකාලික සංක්‍රමණය පහත වැටීම වැනි හේතු නිසා සම්ප්‍රේෂණ පහත වැටීමක් ගැන අනතුරු හඟවයී සොයා ගැනීම්වල සම්ප්‍රේෂණ කොටස ගැන අවධානය යොමු කළ මෙම ආයතනයේ පර්යේෂණ ප්‍රධාන බිලේෂා වීරරත්න ''2015 දී සම්ප්‍රේෂණ පහත වැටීම: ඇණ හිටීමක් ද අවසානය පටන් ගැනීමක් ද'' යනුවෙන් බ්ලොග් ලිපියක් ලීවාය. එය ´Talking Economic Blog හි මෙන්ම දේශීය පුවත් පත් කීපයකම පළ විය.

සංක්‍රමණය දේශීය සංවර්ධනයට සම්බන්ධ කරමින් බිලේෂා වීරරත්න කොළඹ ඉන්ටර්නැෂනල් ඇලර්ට් සංවිධානය කළ විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් විසින් වගකීමෙන් යුත් ආයෝජනයට ඇති වාසි සහිත අවස්ථා පිළිබඳ සාකච්ඡා මණ්ඩපයකට සහභාගි වූවාය. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සංක්‍රමණය පිළිබඳ සමීක්ෂණවලට අමතරව බිලේෂා '2016 ආර්ථිකයේ තත්වය' ප්‍රකාශනයේ නාගරිකකරණය මූල්‍යයනය යන මාතෘකවෙන් යුත් ලිපියෙන් ද මෙම ආයතනයේ පර්යේෂණයෙන් සොයා ගත් කරුණු යොදා ගත්තායී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අනෙකුත් පර්යේෂණ නාගරිකකරණයේ සත්‍ය ව්‍යාප්තිය පිළිබිඹු කිරීමට දනට යොදා ගන්නා නාගරිකකරණය ප්‍රමාණවත් නොවීමේ ගැටලුව ආමන්ත්‍රණය කිරීම සහ මහ නගර ප්‍රවාහන මුලපිරුම්: ශ්‍රී ලංකාවට ගත හැකි පාඩම් පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයයී ''ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ ප්‍රති නිර්වචනය කිරීම'' පිළිබඳ TTI අරමුදල් සපයන ලද අධ්‍යයනයක් බස්නාහිර සංවර්ධන සහ මහනගර අමාත්‍යංශය සහ නාගරික සංවර්ධන සභාපති සමග පාර්ශ්වකරුවන්ගේ ප්‍රවිචාරණයක් මෙම ආයතනයේ පර්යේෂණ ප්‍රධාන බිලේෂා වීරරත්න සිදු කළාය. එම වාර්තාවේ ප්‍රකාශයට පත් කරන ලද පිටපතක් ඇමතිවරයාට ඔහුගේ කාර්යාලයේ දී පිළිගැන්විණී මෙම අධ්‍යනයට අදාල බ්ලොග් ලිපියක් Talking Economics බ්ලොග් පිටුවේ සහ දේශීය මුද්‍රිත මාධ්‍යයේ පළ විය.




පර්යේෂණ ප්‍රධාන ආචාර්ය බිලේෂා වීරරත්න විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් විසින් වගකීමෙන් යුත් ආයෝජනයට ඇති වාසි සහිත අවස්ථා පිළිබඳ සාකච්ඡා මණ්ඩපයේ දී

## ප්‍රකාශන

බිලේෂා වීරරත්න ගේ ''ළමයින්ගේ සුභ සාධනය ආරක්ෂා කිරිම සහ මවුවරුන්ගේ ශ්‍රම සංක්‍රමණය සීමාකිරීම පිළිබඳ හේතු ඵල'' 2016 ජුනි 9, International Migration වෙළුම (54) කලාපය (5)

නිෂා අරුණතිලක විසින් ''ශ්‍රී ලංකාවේ සමාජ සංචලතාවය කෙරේ සංක්‍රමණය සහ සම්ප්‍රේෂණ බලපෑම්'' ටී කිම් සහ ඒ මුලකලා සංස්කරණය කරන ලද හා සෙජොන්- - සිඃ කොරියානු සංවර්ධන ආයතනය පළ කරන Social Mobility Experiences from Asia 129 සිට 146 දක්වා පිටු

සමන් කැලේගම සහ බිලේෂා වීරරත්න විසින් ''සංක්‍රමණය සහ සම්ප්‍රේෂණඃ සංවර්ධනය කෙරේ බලපෑම'' ඇනා ට්‍රියන්ඩෆිලිදෝ සංස්කරණය කළ හා රුට්ලෙජ් මගින් පළ කරන ලද රුට්ලෙජ් සංක්‍රමණය සහ සරණාගත අධ්‍යයන පිළිබඳ රුට්ලෙජ් අත්පොතී

බිලේෂා වීරරත්න විසින් ''ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ නැවත නිර්වචනය කිරීම'' ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කාර්ය පත්‍රිකා මාලාව අංක 23 2916 මැයි



පර්යේෂණ ප්‍රධාන ආචාර්ය බිලේෂා වීරරත්න ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රකාශනයක් වූ ''ශ්‍රී ලංකාවේ නගර නැවත නිර්වචනය කිරීම'' මහ නගර සහ බස්නාහිර පළාත් සංවර්ධන ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවකට පිළිගැන්වීම.

## ඉදිරිපත්කිරීම්

නිෂා අරුණතිලක විසින් මැයි 6 දින ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දේශීය කාර්යාලය විසින් සංවිධානය කළ කොළඹ ජාත්‍යන්තර කම්කරු කාර්යාලයේ පැවති වට මේස සාකච්ඡාවේ දී ''ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳ පොළ සංඛ්‍යාතිවලට සංක්‍රමණික සේවකයන් ඇතුළත් කර ගැනීම''

සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය ( IOM ) ජුලි 20 සහ 21 දිනවල සංවිධානය කළ බැකොක්හි කොළඹ ක්‍රියාවලිය සම්ප්‍රේෂණ පිළිබඳ තේමාගත ක්ෂේත්‍ර ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීමේ දී බිලේෂා වීරරත්න සම්ප්‍රේෂණ සහ ස්ත්‍රී පුරුෂ භාවය ගැන

ආයෝජන සහ ව්‍යවසායකත්වය සඳහා නව ආදර්ශ තුළින් විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් විසින් වගකීමෙන් යුත් ආයෝජන අවස්ථා පහසු කිරීම පිළිබඳ සැසියේ දී බිලේෂා වීරරත්න සාකච්ඡා මණ්ඩප සාමාජිකාවක් ලෙසී සිනමන් ලේක්සයිඩ් හෝටලයේ දී ඉන්ටර්නැෂනල් ඇලර්ට් සංවිධානය කළ වගකීමෙන් යුත් ආයෝජන සහ තාක්ෂණ ආධාර ප්‍රවර්ධනය කිරීමට විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සම්බන්ධ කර ගැනීම පිළිබඳ මෙම සංවෘත සාකච්ඡාව ඔත්කෝබර් 17 සහ 18 පැවැත්විණ

නොවැම්බර් 5 ඉන්දියාවේ නවදිල්ලියේ දී සංවර්ධනය වන රටවල් සඳහා පර්යේෂණ සහ තොරතුරු පද්ධති ( RIS ) ආයතනය සංවිධානය කළ ''ඉන්දියානු සාගර කලාපයේ නිල් ආර්ථිකයේ අංශීය සහයෝගිතාවය'' පිළිබඳ දෙවන IORA නිල් ආර්ථික සංවාදයේ දී බිලේෂා වීරරත්න විසින් ශ්‍රී ලංකාවේ වෙරළබඩ සංචාරක කර්මාන්තය සහ නාගරිකකරණය පිළිබඳව




පර්යේෂණ ප්‍රධාන ආචාර්ය බිලේෂා වීරරත්න ජුනි 1 කොළඹ දී ශ්‍රම වෙළඳ පොළ සමීක්ෂණ පිළිබඳ කලාපීය වැඩ මුළුවට සහභාගි වූවායී එහි දි ඇය ''ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්ති මුලපිරුම් සැලසුම් කිරීම සඳහා ශ්‍රම වෙළඳ පොළ විශ්ලෙෂණය '' පිළිබඳ ඉදිරිපත් කිරීමක් කළාය



ආචාර්ය බිලේෂා වීරරත්න 'ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත් මහ නගර ප්‍රධාන සැලැස්ම සන්දර්භයේ නාගරික සැලසුම් මගපෙන්වීම් අදාලත්වය' පිළිබඳ සාකච්ඡාවේ දී සාකච්ඡා මණ්ඩප සාමාජිකාවක් ලෙස සහභාගි වූවාය

## බ්ලොග්/ලිපි

බිලේෂා වීරරත්න විසින් 'ශ්‍රී ලංකාවේ නාගරිකකරණයේ දී වඩාත් හොඳ ගණනය කිරීම් ඉදිරිපත් කළ හැකි ද?' අප්‍රේල් 5 ඩේලි එෆ්ටී▫ දි අයිලන්ඩ් සහ ´Talking Economics Blog

බිලේෂා වීරත්න විසින් '2015 සම්ප්‍රේෂණ පහත වැටීමඃ ඇණ හිටීමක් ද අවසානයේ ආරම්භයද?' දෙසැම්බර් 17 ඩේලි මිරර්▫ ඩේල් ඔෆ්ටී▫ Talking Economics Blog

# තිරසාර සංවර්ධනය සඳහා මානව සම්පත්

*වෙනස්වන ඉල්ලුම සපුරාලීම සඳහා රටේ මානව සම්පත් සංවර්ධනය කිරීමට පෙරමුණු කිපයක සංයුක්ත ප්‍රයත්නයක් ගත යුතුයි පළමුවෙන්ම ශ්‍රම වෙළඳ පොළට වෙනස් වන ඉල්ලුම සපුරාලීමට හැකිවනු සඳහා තෘතීය මට්ටමේ ඉහළ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීම වැඩි දියුණු කිරීම තීරණාත්මක යි එසේ වුවත් තෘතීය අධ්‍යාපන මට්ටම පුළුල් කිරීම පමණක් ප්‍රමාණවත් නැතී උසස් විද්‍යා සහ තාක්ෂණ විෂයන් පුහුණුවට අදාල පදනම වැටෙන්නේ පාසල් මට්ටමේ දීයී එම නිසා සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක භාවය සහ ඊට පිවිසීම ද වැඩි දියුණු විය යුතුයී අධ්‍යාපන සහ නිපුණතා සංවර්ධනය සමග අධ්‍යාපනයේ සාර්ථකත්වය සහ වැඩ දිවියේ වඩාත් වැඩි ඵලදායකත්වයක් තහවුරු කරණ වැදගත් නිර්ණායකයක් වන්නේ සෞඛ්‍යයී වැඩ කරන දින ගණන පහත වැටීම සහ ඵලදායිතාවය වැඩි කිරීමේ දී පෝෂණයේ වැදගත්කම ඒ සම්බන්ධ සාහිත්‍යයේ හොඳින් සටහන්ව ඇත. හාඳ පෝෂණයෙන් යුත් ළමයින් අධ්‍යාපනයෙන් වඩාත් සාර්ථක ප්‍රතිඵල අත් කර ගන්නා බව අධ්‍යයනයන්ගෙන් හෙළි වේ ඵලදායි වයස් කාණ්ඩයට අයත් ජන සංඛ්‍යාව අතර බෝ නොවන රෝග තත්වයන් බහුලව තිබීම වැඩ කිරීමේ කාලයට සහ ඵලදායිතාවයට බලපායි.˝ශ්‍රී ලංකාවේ ජන විද්‍යා ලක්ෂණය ද වෙනස් වෙමින් පවතී. වයස්ගතවන ජන සංඛ්‍යාව වැඩි වෙමින් පවතින අතර තරුණ ජන සංඛ්‍යාව - ළමයින් සහ ඵලදායි වයසේ පසුවන අය යන දෙකොටසම අඩුවෙමින් පවති. අනාගත මානව සම්පත් සැලසුම් කිරීමේ දී මෙම වෙනස්කම් සැලකිල්ලට ගත යුතුය.*

මෙම ඒකකයේ ක්‍රියාකාරකම් පුළුල් වශයෙන් ක්ෂේත්‍ර තුනක□ එනම් ශ්‍රම□ සෞඛ්‍යය සහ අධ්‍යාපනය සිදු කරන ලදී එක් එක් ක්ෂේත්‍රයට අයත් වැඩ කොටස් වෙන් වෙන්ව පහත සාකච්ඡා කෙරේ

## ශ්‍රමය

2015 නොවැම්බර් මස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද මධ්‍ය කාලීන ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව අනුව රැකියා දශ ලක්ෂයක් බිහි කිරීමට සහ සේවකයන්ගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරයි. රැකියා බිහි කිරීමේ ප්‍රකාශිත ඉලක්කය සපුරා ගැනීමට අදහස් කරනුයේ ඉල්ලුම පැත්තෙන් සේවා නියුක්තිය ඉහළ තීව්‍රතාවයක් පවතින ආයෝජන දිරි ගැන්වීමෙන් සහ සැපයුම් පැත්තෙන් නිපුණතා වැඩි දියුණු කිරීමෙනී මෙම ප්‍රතිපත්ති රාමුව ගෝලීය වෙළඳ පොළ සාර්ථකව තරග කිරීමට හැකි සූක්ෂ්ම සහ නව දැනුම පදනම් ආර්ථිකයක් නිර්මාණය කිරීමට අපේක්ෂා කරයි.

ඉහතින් සඳහන් කළ ශ්‍රම වෙළඳ පොළ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී ආණ්ඩුව මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ එය සතු රාජ්‍ය මුදල් සීමිත වීම ය. රාජ්‍ය මූල්‍ය ස්ථාවර කිරීම සඳහා – රාජ්‍ය බදු ආදායම් පරතරය සහ රටේ ණය බර අඩු කර ආණ්ඩුවේ වියදම් – පුනාරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සැලකිය යුතු ආකාරයෙන් වැඩි කිරීමට ඇති ඉඩකඩ සීමිතයි ඇත්තෙන්ම මූල්‍ය තත්වයෙන් පවතින වියදම් ප්‍රතිව්‍යුහ ගත කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි. මෙවැනි පසුබිමක ශ්‍රම වෙළඳ පොළ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා ආයෝජනයට ඇති අරමුදල් සීමිත ය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රමුඛ ප්‍රකාශනය වන 'ආර්ථිකයේ තත්වය'හි පරිච්ඡේදයකින් නිෂා අරුණතිලක සහ නෙළුකා ගුණසේතර රාජ්‍ය වියදම් වැඩි කරන්නේ නැතිව ආණ්ඩුවට ශ්‍රම වෙළඳ පොළ අරමුණු සාක්ෂාත් කර ගතහැකි විවිධ මාර්ග පරික්ෂා කරති.˝ ශ්‍රම වෙළඳ පොළ වැඩි නම්‍යතාවය□ වඩාත් අදාල සහ කාර්යක්ෂම අධ්‍යාපන පද්ධතිය සහ තෘතීයික අධ්‍යාපනය පුළුල් කිරීම වඩාත් හොඳ රැකියා නිර්මාණය කිරීමේ සහ ශ්‍රම වෙළඳ පොළ අසමතුලිත භාවය අඩු කිරීමේ ප්‍රධාන මාර්ග ලෙස යෝජනා කෙරේ.

ශ්‍රමය□ සේවා නියක්තිය සහ මානව සම්පත් සංවර්ධන ඒකකය මෑත අතිතයේ දී වැඩි අවධානයක් යොමු නොවූ ශ්‍රම වෙළඳ පොළ විශේෂ ගැටලු කීපයක් ද විමර්ශනය කර ඇතී නිදසුනක් වශයෙන් බොහෝ සේව්‍යයෝ වඩාත් වැඩි ගෝලීයකරණය සමග තරගකාරීව සිටීමේ අරගලය නිසා සේවකයන්ට අඩුවෙන් ගෙවන□ අඩු සමාජ ආරක්ෂණයක් ලබා දෙන ප්‍රමිතියෙන් අඩු සේවා නියුක්ති ආකාරයන් යොදා ගනිති. ප්‍රියන්කා ජයවර්ධන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කේන්ද්‍රිය අරමුදලේ සහාය ඇතිව ''ශ්‍රී ලංකාවේ මිනිසුන් ප්‍රමිතියක් නැති වැඩවල යෙදෙන්නේ ඇයි?''යන්න වඩාත් හොඳින් තේරුම් ගැනීම සඳහා අධ්‍යයනයක් කළායි ජන සංඛ්‍යාව වයස්ගත වීමත් සමග වයස්ගත සේවකයන් වැඩි වැඩියෙන් රැකියා බලකායට එකතු වේ සමන්ති බණ්ඩාර දකුණු ආසියා පර්යේෂණ ජාලයෙන් (SARNET) අරමුදල් සපයන ලද අධ්‍යනයකින්''වයස්ගත සේවකයන් විසින් ජීවන මාර්ග සොයා යෑමට හේතු කරුණු මොනවාද?'' පරික්ෂා කරයී අවසාන වශයෙන් අඩුවෙන් සිදුවීම නිසා 2012 සංගණනයේ සමීක්ෂණ දත්තවලින් අධ්‍යයනය කළ නොහැකි ශ්‍රම වෙළඳ පොළ ගැටලු  සොයා බැලීමේ විරල අවස්ථාවක් ලැබිණී එක්සත් ජාතීන්ගේ ජනගහණ වැඩ සටහනෙන් ( UNDP ලබා දුන් අරමුදල්වලින් සමීක්ෂණ දත්ත භාවිතා කර කළ නොහැකි අධ්‍යයනයකින් ශ්‍රම වෙළඳ පොළ විවිධ ලක්ෂණ තුනක් විමර්ශනය කළායි ඒවාට□ අ) වෙනස් වූ හැකියාවන් ඇති පුද්ගලයන් සඳහා වූ ශ්‍රම වෙළඳ පොළ ආ) ශ්‍රී ලංකාවේ විද්‍යා සහ තාක්ෂණ සේවක ව්‍යාප්තිය සහ අවසාන වශයෙන් දර්ශක දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමෙන් ශ්‍රම වෙළඳ පොළ ඇති විචල්‍යතා යී වෙනස් වූ හැකියාවන්ගෙන් යුත් පුද්ගලයන් සඳහා වන ශ්‍රම වෙළඳ පොළ අපේක්ෂා වෙනත් අයට වඩා අඩු බව මෙම අධ්‍යයනයෙන් හෙළි විය. එමනිසා වෙනස් වූ හැකියාවන්ගෙන් යුත් පුදගලයන් සේවයේ යෙදවීමට සේව්‍යයන්ට විශේෂ දිරිගැන්වීම් ලබා දීමට අධ්‍යයනයෙන් යෝජනා කරයී විද්‍යා සහ තාක්ෂණ සේවකයන් පිළිබඳව ශ්‍රී ලංකාවේ තෘතීය අධ්‍යාපනය ලත් සේවකයන්ගේ ව්‍යාප්තිය ඉතා පහත් බව අධ්‍යයනයෙන් හෙළි විය. එමෙන්ව තාතීයික සුදුසුකම් ලත් පුද්ගලයන් පවතින විද්‍යා සහ තාක්ෂණ

වෘත්තීන්ට මනාව ගැලපෙන්නේ ද නැති අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමට සහ විද්‍යා සහ තාක්ෂණ ඍකියා නිර්මාණය ප්‍රවර්ධනය කිරීමටත් අධ්‍යනයෙන් යෝජනා කරයි

## සෞඛ්‍යය

දශක ගණනාවක් තිස්සේ වඩාත් හොඳ සෞඛ්‍ය ආරක්ෂණ සේවයක් ලබා දීමට කැපවී සිටින ශ්‍රී ලංකාව අත්‍යවශ්‍ය සෞඛ්‍ය දර්ශක බොහොමයක් සාක්ෂාත් කර ගෙන සංවර්ධනය වූ රටවල් සමාන තත්වයකට පැමිණ සිටී රටේ සමස්ත සෞඛ්‍ය දර්ශක සහශ්‍රක සංවර්ධන ඉලක්ක 2015 සපුරා ගැනීමට ආසන්නව සිටී එසේ වුවත් මන්දපෝෂණය ඉතා ඉහළ මට්ටමක පැවතීම සහ වසංගත ලෙඩ රෝග පාලනයෙන් තොරව පැතිර යෑම වැනි තවම ජය ගැනීමට නොහැකි වූ සෞඛ්‍ය ගැටලු පවතී එමෙන්ම ජන විද්‍යාත්මක වෙනස්වීම් මෙන්ම ජනතාවගේ වෙනස්වන ජීවන රටාවන් – වෘත්තීය සෞඛ්‍යය වැනි මතුවෙමින් පවතින සෞඛ්‍ය ගැටලු ද ඇති බෝ නොවන ලෙඩ රෝග (NCD ) ගැන විශේෂ අවධානය යොමු කළ යුතුයි මෙම ගැටලු නිරෝගී සේවා බලකායක් පවත්වා ගැනීමේ දී සෞඛ්‍ය ඍකවරණයට මූල්‍යනය□ කාර්යක්ෂම සහ ඵලදායි සෞඛ්‍ය ආරක්ෂණ සේවා වැනි අභියෝග ගණනාවක් කෙරේ යොමු කරයි මෙම අභියෝග හැරෙන්න ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශයට 2015 දී තිරසාර සංවර්ධන ඉලක්ක හඳුන්වා දීමත් සමග තවත් අභියෝග ගණනාවකට මුහුණ දීමට සිදුව ඇති සම්පූර්ණයෙන්ම සෞඛ්‍යය සඳහා වෙන්ව ඇති තිරසාර සංවර්ධන ඉලක්ක ( SDG 3) සියලුම වයස් කාණ්ඩවලට අයත් අය සඳහා නිරෝගී ජීවිත සහතික කිරීම සහ යහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීමත් සමග 2030 දී සාක්ෂාත් කර ගත යුතු ඉලක්ක නමයක් දක්වා ඇති මෙම සන්දර්භය තුළ අප ආයතනයේ මෙම වසරේ සමීක්ෂණය මූලික වශයෙන් අවධානය යොමු කර ඇත්තේ සෞඛ්‍ය ආරක්ෂණය සඳහා මුදල් යෙදවීම□ සෞඛ්‍ය ආරක්ෂණය ලබා දීම සහ සහශ්‍රක සංවර්ධන ඉලක්ක (SDG) කෙරේයි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රමුඛ ප්‍රකාශය වන 2016 ආර්ථිකයේ තත්වය හි පරිච්ඡේදයකින් සුනිමලී මදුරාවල 'සෞඛ්‍ය ආරක්ෂණ මූල්‍යනය: අභියෝග සහ විකල්ප' යන පරිච්ඡේදයෙන් පවතික සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රම සහ හිඩැස් තක්සේරු කර ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආරක්ෂණ මූල්‍යනය සඳහා යොදා ගත හැකි වෙනස් විකල්ප යෝජනා කරයි රාජ්‍ය පෞද්ගලික හවුල් ( PPP ) සමාජ සෞඛ්‍ය රක්ෂණය□ ප්‍රජාව පදනම් සෞඛ්‍ය රක්ෂණය සහ භාවිත ගාස්තු වැනි සෞඛ්‍ය මූල්‍යන යාන්ත්‍රණ ශ්‍රී ලංකාවට යොදා ගත හැකි මූල්‍යන ප්‍රතිපත්ති විකල්ප සමහරක් ලෙස හඳුනාගෙන ඇති 2016 ආර්ථිකයේ තත්වය වාර්තාවට 'නිරෝගී දිවියක් සඳහා තිරසාර සංවර්ධන ඉලක්ක' යනුවෙන් ප්‍රතිපත්ති සංක්ෂිප්ත සටහනක් එක් කරන සමන්ති බණ්ඩාර සෞඛ්‍ය පිළිබඳ තිරසාර සංවර්ධන ඉලක්ක 3 ( SDG 3 ) ශ්‍රී ලංකාව සන්දර්භයේ එහි අදාලත්වය සහ මූලික අභියෝග සාකච්ඡා කරයි සහශ්‍රක සංවර්ධන ඉලක්කවලට අදාලව සෞඛ්‍යය පිළිබඳව ක්‍රියා කිරීමේ දී මූල්‍යනය□ දේශපාලන කැපවීම□ ඵලදායි සැලසුම් කිරීම□ ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සමහර මූලික අභියෝග ලෙස හඳුණා ගෙන ඇති

සුනිමලී මදුරාවල TTI අරමුදල් සහාය යටතේ 'රාජ්‍ය ද පෞද්ගලික ද: ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආරක්ෂණ සැපයුම්කරුවන් තෝරා ගැනීමේ නිර්ණායක' යනුවෙන් අධ්‍යයනයක් කළායි මෙම අධ්‍යයනය සිදු කරන ලද්දේ නේවාසික රෝගී ප්‍රතිකාර සහ බාහිර රෝගි ප්‍රතිකාර සඳහා සෞඛ්‍ය ආරක්ෂණ සේවා සැපයුම්කරුවෙකු තෝරා ගැනීමේ ප්‍රධාන නිර්ණායකයන් හඳුනා ගැනීමේ අරමුණෙනී බාහිර රෝගී ප්‍රතිකාර සඳහා සෞඛ්‍ය ආරක්ෂණ සේවා සැපයුම්කරුවන් සිටීම සහ එම සේවා ලබා ගැනීමේ හැකියාව ප්‍රධාන ගැටලුවක් නොවන බව අධ්‍යයනයේ සොයා ගැනීම් විශ්ලේෂණයෙන් පෙන්නුම් කරයි රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ නේවාසික රෝගී ප්‍රතිකාර පහසුකම් සහිත සෞඛ්‍ය ආරක්ෂණ පහසුකම්වල සුලභතාවය වැඩි කිරීම ඉතා වැදගත් සොයාගැනීමක් ලෙස ඉස්මතු කර ඇති පවුලේ ප්‍රධානියාගේ චරිත ස්වභාවය□ අංශය සහ භූගෝලීය පිහිටීම සහ රෝගයේ මටටම වැනි ප්‍රජා සාධක□ සෞඛ්‍ය ආරක්ෂණ සැපයුම්කරුවෙකු තෝරා ගැනීමේ දී කැපී පෙනෙන භූමිකාවක් ඉටු කරයී

නිෂා අරුණතිලකගේ නායකත්වයෙන් යුත් සමීක්ෂණ කණ්ඩායමක් ලතින් ඇමරිකානු සමාජ විද්‍ය පීඨය ( FLACSO CHILE ) අරමුදල් සපයන ලද 'ආසියාව□ අප්‍රිකාව සහ ලතින් ඇමරිකාවේ නොවිධිමත් සේවකයන්ගේ සෞඛ්‍ය අසමානතා□ වැඩ සහ සමාජ ආරක්ෂණය ලබා ගැනීම' පිළිබඳ අධ්‍යයනය නිම කළහී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මෙම අධ්‍යයනය සිදු කෙළේ ආසියානු කලාපීය රටක් වශයෙන් නොවිධිමත් සේවකයන් පැවතීම සහ ඔවුන්ට සමාජ සහ සෞඛ්‍ය ආරක්ෂණය ලබා ගන්නා ආකාරය හඳුනා ගැනිමේ අරමුණෙනී ශ්‍රී ලංකා අධ්‍යයනයේ අවධානය යොමු වූයේ අනුරාධපුර සහ කළුතර දිස්ත්‍රික්කවල වී ගොවීන්ගේ වැඩ කිරීමේ තත්වය සහ සෞඛ්‍ය තත්වය කෙරේයී වී ගොවීන්ගේ සේවා තත්වය සහ වැඩ කිරීමේ තත්වය නිසා ඔවුන් සෞඛ්‍ය සහ ආරක්ෂණ අනතුරු ගණනාවකට මුහුණ දෙන නමුත් අනතුරු වැළැක්වීමේ යාන්ත්‍රණ සීමිත/නොමැති බව අධ්‍යයනයෙන් හෙළි වියි වෘත්තීය සෞඛ්‍ය අනතුරු සඳහා හදිසි ප්‍රතිචාර සැලසුම් සහ වෘත්තීය සෞඛ්‍ය අනතුරුවලට හදිසි ප්‍රතිචාර දැක්වීමේ සැලසුම් සහ පූර්වාරක්ෂණ පියවර ගැනීම අවමයී බොහෝ විට නොසලකා හරියී සුනිමලී මදුරාවල□ ප්‍රියන්කා ජයවර්ධන සහ නෙළුකා ගුණසේකර සමීක්ෂණ කණ්ඩායමේ අනෙක් සාමාජිකයන් යී

## අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳ පොළ මතුවෙමින් පවතින අවශ්‍යතාවයන්ට මුහුණ දීම සඳහා අධ්‍යාපන පද්ධතිය සැලකිය යුතු මට්ටමකින් නව්‍යකරණය විය යුතුය. ඒ සේවකයන්ට නිර්මාණාත්මව සිතීමට සහ ක්‍රියා කිරීමට කඩිසරව සහ ඵලදායකව වැඩ කිරීමට සහ ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමට පවතින තාක්ෂණ නව්‍යකරණයට සහ යොදා ගැනීමට හැකි කරවීම සඳහායි රාජ්‍ය මූල්‍යයේ පවතින සිමාවන් සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වයේ සීමිත බවට මුහුණ දීම සඳහා අධ්‍යාපන අංශය ගතිකත්වයෙන් යුත් ශ්‍රම වෙළඳ පොළ වෙනස්වන අවශ්‍යතාවයන්ට ගැලපීම මූලික අභියෝගයකි. වෙළඳ පොළ නැඹුරුවක් ඇති විෂයන් සහ වඩාත් ප්‍රායෝගික නැඹුරුවක් ඇති පාඨ මාලා හඳුන්වා දීමෙන් සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක භාවය සහ අදාලත්වය වැඩි දියුණු කිරීමට ප්‍රයත්න ගෙන තිබුණ ද පහළ මට්ටමෙන් ක්‍රියාත්මක කිරීමේ දී ගැටලු ගණනාවක් මතු වියී ඒ මූල්‍ය සීමාවන් සම්පත් මදකම උත්සාහ කරන ලද ප්‍රතිශෝධනවල අපේක්ෂිත නිමැවුම ලබා ගැනීම බාධා කළ වඩාත් තීරණාත්මක කරුණු යී මෙම ආයතනයේ කේන්ද්‍රීය අරමුදලෙන් ''නව්‍ය අරමුදල් තුළින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය ප්‍රගමනයට යෙමු කිරීම'' පිළිබඳව සිදු කරන ලද සමීක්ෂණයේ දී ප්‍රියන්කා ජයවර්ධන අන්තර්ජාතික අත්දැකීම්වලින් නිදහසුන් දක්වමින් අධ්‍යාපන අංශයට අරමුදල් ලබා ගැනීමේ නව්‍ය ආකාරයන් ගැන සාකච්ඡා කරයි. එමෙන්ම නව නීති සහ නියාමනයන් ඇතුළත් කිරීමෙන් පුද්ගලික අධ්‍යාපන සැපයුම්කරුවන්ගේ නියාමන යාන්ත්‍රණය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය ද ඇය අවධාරණය කරයි.

යුනිසෙෆ් ආයතනයෙන් අරමුදල්වලින් ශ්‍රී ලංකාවේ බුද්ධියෙන් ආබාධිත ළමයින් සඳහා අධ්‍යාපනය ලබා දීම පිළිබඳව ප්‍රියන්කා ජයවර්ධන කරන ලද සමීක්ෂණයෙන් ඉගෙන ගැනීමේ ආබාධයන් ඇති ළමයින්ට අධ්‍යාපනය ලබා දීමේ දී පවතින බාධක සහ අවස්ථා ඇගයීමට ලක් කරයි. එම අධ්‍යයනයෙන් දැනට ඇති මැදිහත්වීම් කොපමණ හොඳින් ක්‍රියාත්මක වන්නේද සහ එම ළමයින් ප්‍රධාන ප්‍රවාහයේ පාසල්වලට ඇතුළත් කිරීමට හෝ ඔවුන්ට විකල්ප විශේෂ අධ්‍යාපනයක් ලබා දෙන්නේ කෙසේද යන්න විමර්ශනය කරයි. ජාතික අධ්‍යාපන පද්ධතිය තුළ විශේෂ අධ්‍යාපනයක් ලබා දීම වැඩි දියුණු කිරීමට හා අධ්‍යාපනය ලබා ගැනීමට බාධා ඇති ළමයින්ට ඒ සඳහා පිවිසුම් සංවර්ධනය සහ වෙනස් කිරීමේ නිර්දේශ ද එහි ඇතුළත් ය.

මෙම ඒකකයෙන් අධ්‍යාපනයට අදාලව කරන ලද වැඩ පිළිගැනීමට ලක් කිරීමක් වශයෙන් නිෂා අරුණතිලකට 2016 නොවැම්බර් ආසියා පැසිපික් අධ්‍යාපන පර්යේෂණ ආයතන ජාලයේ කලාපීය විශේෂඥ රැස්වීමට සහභාගි වීමට ද ආරාධනයක් ලැබිණ

## ප්‍රකාශන

සමන්ති බණ්ඩාර ''ශ්‍රී ලංකාවේ ඊ අපද්‍රව්‍ය කළමනාකරණයේ හදිසි අවශ්‍යතාවය'' Lanka Exporter Magazine අප්‍රේල් /ජුනි වෙළුම

සමන්ති බණ්ඩාර ''ආහාර සංකලනඃ ඒවා අරක්ෂිත ද? '' Lanka Exporter Magazine 2016 ජුලි/ සැප්තැම්බර් 93 කලාපය ( ශ්‍රී ලංකාවේ ජාතික අපනයන මණ්ඩලයේ ප්‍රතාශනයකී




ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ප්‍රධාන ආචාර්ය නිෂා අරුණතිලක නොවැම්බර් 24 – 25 තායිලන්තයේ බැංකොක් නගරයේ පැවති ආසියා පැසිපික් අධ්‍යාපන පර්යේෂණ ආයතන ජාලය ( ERI-NET ) කලාපීය විශේෂඥ රැස්වීමේ දී

## ඉදිරිපත් කිරීම්

එක්සත් ජාතීන්ගේ ස්ත්‍රීන් සංවිධානය කළ ''තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ස්ත්‍රී පුරුෂ ඉලක්ක සපුරා ගැනීම: මාධ්‍යයේ භූමිකාව'' ඔක්තෝබර් 31 කොළඹ පැවති වැඩ මුළුවේ දී සුනිමලී මදුරාවල ''තිරසාර සංවර්ධන ඉලක්ක: ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ගේ තත්වය'' මැයෙන් කළ ඉදිරිපත් කිරීම




වැඩ මුළුවේ දී පර්යේෂණ නිලධාරි සුනිමලී මදුරාවල තම ඉදිරිපත් තිරීමේ දී

නොවැම්බර් 1 ටාජ් සමුද්‍ර හෝටලයේ දී ඉන්දියාව□ භූටානය□ මාලදිවයින සහ ශ්‍රී ලංකාව සඳහා වූ එක්සත් ජාතීන්ගේ ස්ත්‍රීන් ගේ විවිධ රාජ්‍ය කාර්යාලය ''තිරසාර සංවර්ධන ඉලක්ක සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ මාධ්‍යයේ හැකියාවන් ගොඩනැගීමේ වැඩ මුළුවේ දී නිෂා අරුණතිලක ''දත්ත කොතැන ද?'' මැයෙන් කළ ඉදිරිපත් කිරීම

නොවැම්බර් 4 කම්කරු සහ වෘත්තීය සමිති සම්බන්ධතා අමාත්‍යංශය සංවිධානය කළ ''ශ්‍රමය සහ සේවා නියුක්තිය'' පිළිබඳ ජාතික සම්මන්ත්‍රණයේ දී ප්‍රියන්කා ජයවර්ධන ''මිනිසුන් ප්‍රමිතියක් නැති රැකියාවන් තෝරා ගන්නේ ඇයි'' යනුවෙන් ඉදිරිපත් කිරීමක් කළායි

නොවැම්බර් 8 කාන්තාව සහ මධ්‍යය සාමූහිකය ජාතික ප්‍රතිපත්ති සම්පාදකයන් සමග ''ස්ත්‍රීන් බලගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය'' පිළිබඳ ජාතික සංවාදයේ දී සුනිමලී මදුරාවල 'සහශ්‍රක සංවර්ධන ඉලක්ක සිට තිරසාර සංවර්ධන ඉලක්ක දක්වා: තිරසාර සංවර්ධන රාමුව තුළ ස්ත්‍රී බලගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ ඉදිරිපත් කිරීම්

නොවැම්බර් 14 – 15 කොරියානු ජනරජයේ පැවති පිලිපීනයේ ආසියානු සංවර්ධ බැංකුව විසින් සංවිධානය කළ මැත්ක්ලවුඩ් ( MathCloud ) පිළිබඳ කලාපීය වැඩ මුළුවේ දී ශ්‍රී ලංකාවේ මැත්ක්ලවුඩ් බලපෑම ඇගයීම

තායිලන්තයේ බැංකොක් හි නොවැම්බර් 24 සහ 25 බැංකොක් යුනෙස්කො සංවිධානය කළ SDG 4 - අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීමට පර්යේෂණ බලය යොදා ගැනීම පිළිබඳ අධ්‍යාපන පර්යේෂණ ආයතන ජාලයේ ( ERI-Net ) කලාපීය විශෙෂඥ රැස්වීමේ දී නිෂා අරුණතිලක ''ශ්‍රී ලංකාවේ වත්මන් පර්යේෂණ ප්‍රවනතා'' ඉදිරිපත් කිරීම

දෙසැම්බර් 5 කොළඹ හිල්ටන් හෝටලයේ දී ආසියානු සංවර්ධන බැංකුව ( ADB ) සංවිධානය කළ ''ශ්‍රී ලංකාවේ

## ඉදිරිපත් කිරීම්

චිකිත්සක අධ්‍යයනය'' ප්‍රචාරණ වැඩ මුළුවේ දී නිෂා අරුණතිලක ''ශ්‍රම වෙළඳ පොළ ප්‍රවනතා'' ඉදිරිපත් කිරීම

දෙසැම්බර් 5 කොළඹ හිල්ටන් හෝටලයේ දී ආසියානු සංවර්ධන බැංකුව ( ADB ) සංවිධානය කළ ''රට සහ සේවා නියුක්තිය: විනිශ්චයාත්මක අධ්‍යයන'' ප්‍රචාරණ වැඩ මුළුවේ දී ප්‍රියන්කා ජයවර්ධන ''නිපුණතා සහ අධ්‍යාපනය'' පරිච්ඡේදයේ සොයා ගැනීම් ඉදිරිපත් කිරීම

දෙසැම්බර් 9 හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන සේවා පර්යේෂණ සහ පුහුණු ආයතනයේ ( HARTI ) පැවති ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සංගමයේ 10 වැනි පර්යේෂණ මණ්ඩපයේ දී සමන්ති බණ්ඩාර ''ශ්‍රී ලංකාවේ කොන් කරන ලද ප්‍රජාවක පෝෂණ තත්වයේ නිර්ණායක'' පිළිබඳ ඉදිරිපත් කිරීම



පර්යේෂණ ප්‍රධානි ආචාර්ය බිලේෂා වීරරත්න කොරියාවේ පැවති ආසියානු සංවර්ධන බැංකුව සංවිධානය කළ කලාපීය වැඩ මුළුවේ දී 'ශ්‍රී ලංකාවේ MathCloud බලපෑම ඇගයීම'' පිළිබඳව ඉදිරිපත් කිරීම

## බ්ලොග්/ ලිපි

යොලන්තිකා ඇල්ලෙපොළ ''ජගත් පිළිකා දිනය: ප්‍රතිකාරයට වඩා වැළැක්වීම වැදගත්: සෑම කෙනෙකු සඳහාම භූමිකාවක්'' පෙබරවාරි 4 Talking Economics Blog සහ ඩේලි මිරර්□ පෙබරවාරි 5 දී අයිලන්ඩ්

ප්‍රියන්කා ජයවර්ධන 'මෑන් පවර්' රැකියා ගුණාත්මක විනීත මැඩ බවට පරිණාමය කිරීම' Talking Economics Blog සන්ඩේ ඔබ්සර්පර් පෙබරවාරි 28.

සුනිමලී මදුරාවල 'ඇයට වඩාත් හොඳ තැනක් සැදීම: ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය Talking Economics Blog මාර්තු 8 දි අයිලන්ඩ්

සමන්ති බණ්ඩාර 'ශ්‍රී ලංකාවේ දියවැඩියාව පරාජය කරමු: වැඩිපුර සීනි එතරම් රසවත් නොවේ' Talking Economics Bllog දි අයිලන්ඩ් අප්‍රේල් 6

සමන්තා වික්‍රමසිංහ සමග සමන්ති බණ්ඩාර ''එතරම් රසවත් නොවන සත්‍යයක්' විශේෂාංග ලිපියක් සිලෝන් ටුඩේ මැයි 1

අනර්කලි පෙරේරා 'සංවර්ධනය සඳහා තොරතුරු තාක්ෂණය: ශ්‍රී ලංකාව ඩිජිටල් ස්ත්‍රී පුරුෂ පරතරය විසඳිය යුත්තේ ඇයි? Talking Economics Bllog අගොස්තු 23

# පුද්ගලික අංශයේ සංවර්ධනය

*දළ ජාතික නිෂ්පාදිතය සියයට 8 හෝ ඊට වැඩි මට්ටමක පවත්වා ගැනීමේ ආණ්ඩුවේ ප්‍රකාශිත ප්‍රතිපත්ති අරමුණ සාක්ෂාත් කර ගැනීමට දැනට දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 28ක් වන ශ්‍රී ලංකාවේ ආයෝජන අනුපාතය අඩුම වශයෙන් සියයට 35ක් දක්වා වැඩි කළ යුතුය. රාජ්‍ය මුදල් කෙරේ ඇති පීඩණය වඩාත් වැඩිවෙත්ම සහ රාජ්‍ය ආයෝජනය දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 6ක මට්ටමේ පවත්වා ගැනීමට කර ඇති ප්‍රකාශය නිසා මෙම වැඩි ආයෝජන අනුපාතය සම්පූර්ණයෙන්ම ලැබිය යුත්තේ පෞද්ගලික අංශයෙනි. මෙහිදී විදේශ පෞද්ගලික ආයෝජන අතිශයෙන් වැදගත්ය. අවශ්‍යයෙන්ම අදහස් වන්නේ ශ්‍රී ලංකාවේ සමස්ත සංවර්ධන අභියෝගයේ දී පෞද්ගලික අංශයේ සංවර්ධනය තීරණාත්මකය යන්නයි. මෑත වසරවල වේගවත් වර්ධන අනුපාතය වැඩියෙන්ම ආණ්ඩුවේ මූල පිරුමෙන් ලැබුන අතර මධ්‍ය කාලීන වේගවත් වර්ධන අනුපාතය පවත්වා ගැනීමේ මූලාශ්‍රය විය යුත්තේ පෞද්ගලික අංශයේ විශාල සහ කුඩා ආයෝජනවලිනි. අපට තවදුරටත් පෞද්ගලික ව්‍යවසාය සංවර්ධනය අතීතයේ සිදු කළ ආකාරයට 'කාර්මික සංවර්ධනය' යන පටු ආකල්පයෙන් බැලිය නොහැකිය. එය පෞද්ගලික අංශය සිර කළ හැකි හෝ ශක්තිමත් කළ හැකි අපමණ වූ හේතු සාධක ගවේෂණය සහ ඒවා විසඳීම පිළිබඳවය. වර්ධනය සඳහා හිතකර වාතාවරණයක් සැකසීමෑ වර්ධන අසමානතා පියවීමට වැදගත් භූමිකාවක් ඉටු කරන සහ සියල්ලන් වඩාත් ඇතුළත් කර ගන්නා රටේ ආර්ථික ප්‍රගතිය සහ සමෘද්ධියට දායක වන්නක් විය යුතුය. පසුව කී කාරණය ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද කාලීන තත්වයන් යටතේ වඩාතී වැදගත් ය.*

අලුතින් තේරී පත් වූ ආණ්ඩුව ඉදිරිපත් කළ බාහිර ලෝකය කෙරේ යොමු වූ ආර්ථික වර්ධන න්‍යාය පත්‍රය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට සෘජු විදෙස් ආයෝජන සහ කාර්මික වර්ධනය මූලික ගාමක බලවේගය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවත් වසර ගනවෙත්ම ආයතනික දුර්වලතා සමග බැඳුණු ප්‍රතිපත්ති නොගැලපීම් තරගකාරිත්වයට බලපෑමෙන් කර්මාන්ත ව්‍යාප්තිය සහ සෘජු විදෙස් ආයෝජන ගලා ඒමට බාධාවක් වියී මෙම ක්ෂේත්‍ර 2016 ගෝලීය තරගකාරිත්ව වාර්තාවෙන් ඉස්මතු කර ඇතී මෙම වාර්තාව ලෝක ආර්ථික මණ්ඩපය ( WEF ) වෙනුවෙන් සකස් කිරීමේ දී ශ්‍රී ලංකාවේ හවුල්කාර ආයතනය වූයේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයයි. තරගකාරිත්වය වැඩි දියුණු කිරීමේ තේමාව යටතේ බ්ලොග් ලිපි ගණනාවක් පළ කර ඇති ඒ වඩාත් හිතකර ආයෝජන තත්වයන් පහසුකරණයෑ විදේශිකයන් ඉඩම් හිමිකර ගැනීම පිළිබඳ ගැටලු සහ ශ්‍රී ලංකා ආර්ථිකය ගෝලීය නිෂ්පාදන ජාලයන් කෙරේ නැවත යොමු කිරීම යන ලිපිය

ශ්‍රී ලංකාව වැනි කුඩා ආර්ථිකයන්ට සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ දී දේශීය ආයෝජන ප්‍රතිපත්ති විශේෂයෙන් වැදගත් ය. සමාගම් තරගකාරී වාසියක් අපේක්ෂා කරන්නේ දේශීය වෙළඳ පොළට පිවිසීමෙන් අවශ්‍යයෙන්ම ලාභ ප්‍රයෝජනයක් අත්නොවන නිසාය. ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති පරිසරය සහ සෘජු විදේශ ආයෝජනය කෙරේ එහි බලපෑම විමසා බැලීමට Think Tank මූල පිරුම (TTI ) යටතේ ලැබුණු අරමුදල්වලින් කිත්මිණ හේවගේ සහ විශ්වනාදන් සුබ්‍රමනියම් අධ්‍යයනයක් කර ගෙන යතී වැඩි දුරටත් ජානක විජේසිරි සහ සුවේන්ද්‍රිනී ජයරත්න ජපන් ආයෝජන ශ්‍රී ලංකාවට ආකර්ෂණය කර ගැනීමේ දී ආයෝජන මණ්ඩලයේ (BOI ) භූමිකාව පිළිබඳව අධ්‍යනයක් කළහී ඊට අරමුදල් සපයා ඇත්තේ ජපාන අන්තර්ජාතික සහයෝගිතා ආයතනයයි ( JICA ) ආයෝජන පහසුකරණයට අදාල ගැටලු සහ සංචාරක කර්මාන්තය වැනි අංශ කෙරේ දේශීය ප්‍රතිපත්ති රාමුවේ බලපෑම පිළිබඳව බ්ලොග් ලිපි ගණනාවක් මෙම ආයතනය විසින් ප්‍රකාශ කර ඇත.

වැඩි වශයෙන්ම ඉන්දියානු ආර්ථිකයේ ප්‍රවේගයෙන් ශක්තිමත් වන දකුණු ආසියාව ලොව වඩාත්ම වේගයෙන් වර්ධනය වන කලාපයක් ලෙස සැලකුවද එය ලොව අඩුවෙන්ම අන්තර්ග්‍රහණයට ලක් වූ කලාපයකී එහි ප්‍රතිඵලයක් වශයෙන් අර්ථාන්විත අන්තර් කලාපීය වෙළඳ සහ ආයෝජන ජාලයන් නොමැතිවීමෙන් ඉන්දියාවේ ආර්ථික සාර්ථකත්වයේ සම්පූර්ණ උත්තෝලනයක් කලාපයේ අනෙකුත් ආර්ථිකයන්ට ලබා ගත නොහැකි වියී දකුණු ආසියාවේ කලාපීය ආයෝජන සහ වටිනාකම් දාමයන් වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම සඳහා ලෝක බැංකුවේ සහභාගිත්වය ඇතිව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයන් වන කිත්මිණ හේවගේ සහ විශ්වනාදන් සුබ්‍රමනියම් කලාපීය අධ්‍යයනයක ශ්‍රී ලංකාවේ සහ මාලදිවයින් කොටස අධ්‍යයනය කරතී

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා පාරිභෝගික ප්‍රවනතා වර්ධනයත් සමග මධ්‍යම පංතියේ පුළුල්වීමෙන් සුපිරි වෙළඳසල්වල විශාල ව්‍යාප්තියක් දක්නට ඇත. මෙම කර්මාන්තය තුළ කැපී පෙනෙන මට්ටමේ සිරස් සහ තිරස් අන්තර්ග්‍රහණය පාරිභෝගික සුභ සාධනය පිළිබඳ කනස්සල්ල මතු කරවයී මෙම ආයතනයේ පර්යේෂකයන් වන රවීන් ඒකනායක සහ කිත්මිණ හේවගේ ශ්‍රී ලංකාවේ නව වෙළඳ අංශයේ (Super Markets) තරගකාරිත්වයට එරෙහි භාවිතාවන් සීමා කිරීමේ නිවාරණ පියවර තක්සේරු කිරීමේ අධ්‍යයනයක් කළහ. කිත්මිණ හේවගේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශ්‍රවනාගාරයේ පැවති 2016 ලෝක පාරිභෝගික අයිතින් දින සාකච්ඡා මණ්ඩපයේ දී මෙම ගැටලු ගැන ඉදිරිපත් කෙළේය.

## ඉදිරිපත් කිරීම්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශ්‍රවනාගාරයේ දී මාර්තු 15 මෙම ආයතනය සංවිධානය කළ ''ලෝක පාරිභෝගික අයිතිවාසිකම් සාකච්ඡා මණ්ඩපයේ දි කිත්මිණ හේවගේ විසින් ''තරාදිය තුලනය කිරීම: සුපිරි වෙළඳ පොළ ගැනුම්කරුගේ බලය හීලෑ කිරීම'' ඉදිරිපත් කිරීම

## ලිපි/බ්ලොග්

සුවේන්ද්‍රිනී ජයරත්න සහ රවීන් ඒකනායක විසින් ''ඍජු විදේශ ආයෝජන ගෙන්වා ගැනීම: ආයෝජක හිතකාමී පහසුකම් අවශ්‍යතාවය'' මැයි 27 හා ජුනි 1 ඩේලි එෆ්ටී□ ඩේලි නිවුස්

'ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය සහ විදෙස් හිමිකාරිත්වය පිළිබඳ විවාදය' චන්තාල් සිරිසේන අගෝස්තු 19 සහ 21 ඩේලි මිරර්□ ඩේලි එෆ්ටී□ දි අයිලන්ඩ්




ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශ්‍රවනාගාරයේ පැවති ලෝක පාරිභෝගික අයිතීවාසිකම් දින සාකච්ඡා මණ්ඩපයේ දී පර්යේෂණ නිලධාරි කිත්මිණ හේවගේ ඉදිරිපත් කිරීම



# දරිද්‍රතාවය සහ අවදානම් සහිත භාවය

*ශ්‍රී ලංකාවේ බොහෝ පවුල් ආර්ථික කම්පන, දේශගුණික වෙනස්වීම් සහ ජීවන චක්‍රයේ සිද්ධීන් වැනි නොයෙකුත් අනතුරුවලට මුහුණ දීමේ අවදානමක් පවතින අතර ඉන් දුප්පත් නොවන අය දරිද්‍රතාවයටත් දුප්පතුන් අන්ත දරිද්‍රතාවයටත් පත් කෙරේ. එවැනි අභියෝගවලට මුහුණ දීමේ දී අනතුරු විශාලතම ප්‍රදේශයක් සහ දුප්පතුන්, වයස්ගත වූවන්, ස්ත්‍රීන් සහ ළමයින් ඇතුළත් අවදානමක් සහිත ජනතාව ආවරණය වන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් අවශ්‍යය. ඊට මුදල් හෝ භාණ්ඩ ලබා දීම වැනි සමාජ සහනාධාර ලබා දීමෙන් ඔබ්බට යන සමාජ රක්ෂණය සහ නිපුණතා සහ ජීවන මාර්ග සංවර්ධනය වැනි විස්තීර්ණ පිළිසුමක් අවශ්‍ය ය.*

පසුගිය දශකයේ දී ශ්‍රී ලංකාව දරිද්‍රතාවය අඩු කිරීමේ දී සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇති ශ්‍රී ලංකාව දරිද්‍රතා මට්ටම අඩකින් අඩු කිරීම, සැමට ප්‍රාථමික අධ්‍යාපනය ලබා දීම, අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමානත්වය ප්‍රවර්ධනය කිරීම, ළමා මරණ සංඛ්‍යාව අඩු කිරීම සහ මාතෘ සෞඛ්‍යය වැඩි දියුණු කිරීම වැනි සහශ්‍රක සංවර්ධන ඉලක්ක ගණනාවක් සාක්ෂාත් කර ගෙන ඇති ජාතික මට්ටමේ මෙම ජයග්‍රහණ අත්කර ගෙන ඇති නමුත් ආංශික සහ කලාපීය වශයෙන් සැලකිය යුතු අසමානතා දැකිය හැකියි වැඩි දුරටත් ආදායම් බෙදී යෑමේ විෂමතාවයත් නොයෙකුත් අනතුරුවලට සහ ආපදාවන්ට ලක්වීමේ අවදානමත් බරපතළ කනස්සල්ලට හේතු වේ ශ්‍රී ලංකාව ශ්‍රම වෙළඳ පොළණී සෞඛ්‍ය අංශය සහ සමාජ ආරක්ෂණ පද්ධතියට අභියෝග ගණනාවක් වන ජන සංඛ්‍යාව සීඝ්‍රයෙන් වයස්ගතවීමේ ගැටලුවට ද මුහුණ දී සිටී අභියෝගයන්ට විසඳුම් සෙවීමේ දී මෙම ගැටලු සහ පවතින පද්ධති සහ ප්‍රතිපත්ති ගැන ගැඹුරු අවබෝධයක් අවශ්‍ය යි මෙම සන්දර්භයේ දී දරිද්‍රතාවය සහ අවදානම් භාවය ගැන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය කරන පර්යේෂණ තිරසාර සංවර්ධන ඉලක්ක, දරිද්‍රතාවය සහ අසමානත්වය, සමාජ ආරක්ෂණය, මූල්‍ය ඇතුළත්වීම සහ වයස්ගතවීම ඇතුළත් ක්ෂේත්‍ර ගණනාවක් කෙරේ අවධානය යොමු කෙරේ.

ශ්‍රී ලංකාව 2030 දී තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට කැපව සිටී තිරසාර සංවර්ධන ඉලක්ක දරිද්‍රතාවය සහ කුසගින්න අවසන් කිරීමේ සිට නිරෝගී ජීවන තත්වයක් සහතික කිරීම, සියල්ලන්ට සාධාරණ සහ ගුණාත්මක අධ්‍යාපනය, ස්ත්‍රී පුරුෂ සමානත්වය සාක්ෂාත් කිරීම සහ පරිසරය සහ ස්වභාවික සම්පත් දක්වා ඉලක්ක 17කින් සමන්විතයි ගංගා තිලකරත්න ගේ නායකත්වයෙන් යුත් පර්යේෂණ කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ දී ජාතික මට්ටමෙන් ඇති බලපෑම් විමර්ශනය කිරීමට අධ්‍යයනයක් සිදු කළහී මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවට තිරසාර සංවර්ධන ඉලක්කවල අදාලත්වය සහ ක්‍රියාත්මක කිරීමේ දී මූල්‍ය, අධීක්ෂණය සහ දත්ත හිඩැස වැනි ක්ෂේත්‍රවල ඇති අභියෝග පරීක්ෂා කරයී මෙම අධ්‍යයනයට අරමුදල් සපයන ලද්දේ බංග්ලාදේශ් දකා හි පශ්චාත් සහශ්‍රක සංවර්ධන ඉලක්ක, අන්තර්ජාතික සංවර්ධන ඉලක්ක පිළිබඳ දකුණේ හඬ ලේකම් කාර්යංශය විසිනී විමල් නානායක්කාර, සුනිමලී මදුරාවල සුවේන්ද්‍රිනී ජයරත්න සහ කාංචනා වික්‍රමසිංහ පර්යේෂණ කණ්ඩායමේ අනෙක් සාමාජිකයන් ය. ඊට අමතරව තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ අභියෝග සහ මූල්‍යයනය පිළිබඳව විමසා බලන සංක්ෂිප්ත ප්‍රතිපත්ති වාර්තා දෙකක් 2016 ආර්ථිකයේ තත්වය වාර්තාවට සකස් කරන ලදී.

මූල්‍ය ඇතුළත්වීම – සියලු දෙනාට ඔරොත්තු දෙන මිලකට සහ චිරස්ථායි ආකාරයට ගුණාත්මක මූල්‍ය සේවාවන් පරාශයක් ලබා ගැනීමට සැලසීම – දරිද්‍රතාවය සහ අවදානම විසඳීමේ වැදගත් උපාය මාර්ගයකි. ගංගා තිලකරත්න පැල්ග්‍රේව් මැක්මිලන් ප්‍රකාශනයක් වන 'ආසියාවේ මූල්‍ය ඇතුළත්වීම: ගැටලු සහ ප්‍රතිපත්ති අවධානය' ට මූල්‍ය ඇතුළත්වීමේ වත්මන් තත්වය සහ ගැටලු විමසා බලන පරිච්ඡේදයක් සැපයුවාය. වැඩි දුරටත් ගංගා තිලකරත්න සහ චින්තනී සූරියමුදලි 2016 ජූලි සිට ක්‍රියාත්මක ක්ෂුද්‍ර මූල්‍ය නියාමන පනතේ හොඳ නරක විමසා බැලෙන බ්ලොග් ලිපියක් ද පළ කළහ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙන් ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර රක්ෂණ අංශය විශ්ලේෂණය කෙරෙන අධ්‍යයන දෙකක් ද සිදු කර ඇත. මනෝජ් තිබ්බොටුවාව, දිලානි හිරිමුතුගොඩගේ සහ සමන්ති බණ්ඩාර යන අයගෙන් යුත් කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර රක්ෂණ ඉල්ලුමේ ගතිකයන් අවබෝධ කර ගැනීමේ අධ්‍යයනයක් සිදු කළහ. දුප්පතුන්ට රක්ෂණ ඔප්පු ලබා ගැනීම සහ ඔරොත්තු දීම පුළුල් කරන නව්‍ය පිළිසුම් ගොඩනැගීමේ යෝජනා සකස් කිරීම ද මෙම අධ්‍යයනයේ අරමුණය. මෙම අධ්‍යයනයට අරමුදල් සපයන ලද්දේ අන්තර්ජාතික මූල්‍ය සංස්ථාව (International Finance Corporation) මගිනි. ඊට අමතරව මෙම ආයතනයේ පර්යේෂණ කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ අන්‍යෝන්‍ය සහ සමුපකාර ක්ෂුද්‍ර රක්ෂණයේ වත්මන් සන්දර්භය පිළිබඳව විශේෂයෙන්ම ඉල්ලුම, සැපයුම සහ නියාමන ලක්ෂණ කෙරේ අවධානය යොමු වූ සවිස්තරාත්මක විශ්ලේෂණයක් ලබා දීමට සහ මෙම අංශයේ වර්ධනයට සහ පුළුල්වීමට ඇති ගැටලු සහ සීමාවන් හඳුනා ගැනීමට 'ශ්‍රී ලංකාවේ අන්‍යෝන්‍ය ක්ෂුද්‍ර රක්ෂණය පිළිබඳ තත්වය විනිශ්චය කිරීම'' යනුවෙන් අධ්‍යයනයකට මුල පිරූහ. මෙම අධ්‍යයනය කරන ලද්දේ ගංගා තිලකරත්න, චින්තනී සූරියමුදලි, මානවී අබේවික්‍රම සහ අනර්කලී පෙරේරා විසිනි.

රටේ දරිද්‍රතාවය, අසමානත්වය සහ අවදානම විසඳීමේ දී විස්තීර්ණ සමාජ ආරක්ෂණ පද්ධතියක් අතිශයෙන් වැදගත් යි ගංගා තිලකරත්න සහ චින්තනී සූරියමුදලි ශ්‍රී ලංකාවේ ආහාර පදනම් සුරක්ෂිත ජාල ( FBSN ) වැඩ සටහන් ගැන අධ්‍යයනයක් නිම කළහ. එම අධ්‍යයන 1940 සිට ආහාර සලාක, ආහාර සහනාධාර සහ ආහාර මුද්දර වැනි ආහාර පදනම්

සුරක්ෂිත ජාල වැඩ සටහන්වල සිට මෑත වසරවල මුදල් ලබා දීම දක්වා විකාශය විශ්ලේෂණය කරයි් එය වැඩි දුරටත් පසුගිය දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ ආහාර පදනම් සුරක්ෂිත ජාල වැඩ සටහන්වල වෙනස්කම්වලට හේතු වූ සාධක සහ ඒවායේ බලපෑම විමර්ශනය කරයි් මෙම අධ්‍යයනය ඊජිප්තුව□ ඉන්දියාව□ ඉන්දුනීසියාව□ මැක්සිකෝව□ ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය වැනි රටවල සිද්ධි අධ්‍යනයන් ඇතුළත්වන ලෝක බැංකුවේ අරමුදල් ලබන බහුවිධ රාජ්‍ය ව්‍යාපාතියේ කොටසකි්

ශ්‍රී ලංකාව ජන විද්‍යාත්මක සංක්‍රාන්තියකට මුහුණ දෙමින් සිටින නිසා වැඩිවන වයස්ගත ජන සංඛ්‍යාවේ සමාජ ආරක්ෂණය සහ සෞඛ්‍ය අවශ්‍යතා සහ වයස්ගත වූවන් අතර දරිද්‍රතාවය වැඩිවීමේ අවදානම පිළිබඳව කටයුතු කිරීමේ අභියෝගයට මුහුණ දීමට සිදු වනු ඇති් ශ්‍රී ලංකාවේ වයස්ගත වූවන්ගේ තත්වය සොයා බැලීමට සහ ශ්‍රී ලංකාවේ වයස්ගත වූවන්ගේ ශ්‍රම බලකා සහභාගිත්වය තීරණය කෙරෙන සාධක සහ සේවා නියුක්ති තත්වය හඳුනා ගැනීමට ගංගා තිලකරත්න□ අනර්කලී පෙරේරා සහ චින්තනී සූරියමුදලි අධ්‍යයනයක් ආරම්භ කර ඇති්

ජාතික මට්ටමේ දරිද්‍රතාවය අඩු කිරීමේ ප්‍රගතියක් අත්කරගෙන ඇති නමුත් අසමානතාවය සහ අවදානම් බව මෙන්ම කලාපීය මට්ටමේ අසමානතා පසුගිය දශක කීපය තුළ අවධානයට යොමු වූ ගැටලු යි් රටේ දරිද්‍රතාවය සමනය කිරීමේ උපාය මාර්ග සහ වැඩ සටහන් නොයෙකුත් අකාර්යක්ෂම තාවයන්ගෙන් යුක්තයි් 2016 ආර්ථිකයේ තත්වය වාර්තාවට සකස් කළ පරිච්ඡේදයකින් ගංගා තිලකරත්න සහ චින්තනී සූරියමුදලි දරිද්‍රතාවය සමනය කිරීමේ ප්‍රධාන වැඩ සටහන්වල□ විශේෂයෙන්ම දිවි නැගුම වැඩ සටහනේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කරන්නේ කෙසේද හා දරිද්‍රතා සමනය කිරීමේ මුල පිරුම් සඳහා සම්පත් සොයා ගන්නා ක්‍රම විමසා බලති් වැඩි දුරටත් ආසියානු සංවර්ධන බැංකුවේ 'ශ්‍රී ලංකා හවුල්කාරිත්ව උපාය මාර්ගය 2017 – 2021' සඳහා පසුබිම් අධ්‍යයනයක් වශයෙන් රටේ දරිද්‍රතා තත්වය□ එහි සමාජ ආරක්ෂණ පද්ධතිය සහ සියල්ලන් ඇතුළත් කර ගන්නා වර්ධනයට ඇති බාධා විශ්ලේෂණය කරමින් දරිද්‍රතා තක්සේරු වාර්තාවක් සකස් කර ඇති් ගංගා තිලකරත්න ඔක්තෝබර් මස බංග්ලාදේශ් හි පැවති නම වැනි දකුණු ආසියානු ආර්ථික නායක හමුවේ 'ආසියාවේ අසමානතාවය අඩුකිරීම: තීරණාත්මක ගැටලු සහ ප්‍රතිපත්ති තේරීම්'' පිළිබඳ සැසියේ සාකච්ඡා මණ්ඩප සාමාජිකාවක් වුවායි් එහි දී ඇය 'ශ්‍රී ලංකාවේ අසමානත්ව තත්වය සහ අසමානතාවය විසඳීමේ උපාය මාර්ග' ගැන සාකච්ඡා කළායි්



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ප්‍රධාන ආචාර්ය ගංගා තිලකරත්න මාර්තු 14 – 16 දක්වා එක්සත් ජනපදයේ වොෂින්ටන්□ ලෝක බැංකුව සංවිධානය කළ ''ආහාර පදනම් ආරක්ෂිත ජාල'' වැඩ මුළුවේ දී ''ශ්‍රී ලංකාවේ ආහාර පදනම් ජාල: මුදල් පැවරීම් දක්වා විකාශය සහ සංක්‍රාන්තිය'' පිළිබඳ ඉදිරිපත් කිරීමක් කළාය



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ප්‍රධාන ආචාර්ය ගංගා තිලකරත්න ඔක්තෝබර් 15 සහ 16 බංග්ලාදේශ් හි දකා නගරයේ පැවති නම වැනි දකුණු ආසියානු ආර්ථික නායක හමුවේ දී දකුණු ආසියාවේ ''අසමානතාවය අඩු කිරීම: මූලික ගැටලු සහ ප්‍රතිපත්ති විකල්ප'' පිළිබඳ සැසියේ සාකච්ඡා මණ්ඩප සාමාජිකාවක් ලෙස



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ප්‍රධාන ආචාර්ය ගංගා තිලකරත්න සෙනිගාල් ඩකාර් හි 2016 නොවැම්බර්14 – 15 දක්වා සෙනිගාල් Agricole et Rurale හි පැවති පශ්චාත් සහශ්‍රක සංවර්ධන ඉලක්ක අන්තර්ජාතික ඉලක්ක සහ මුලපිරුම් දැක්ම උපාය මාර්ගික රැස්වීම සංවිධානය කරන ලද්දේ දකුණු හඬ විසිනි

## ප්‍රකාශන

එක්සත් රාජධානියේ පල්ග්‍රේව් මැක්මිලන්□ එස්. ගෝපාලන් සහ ටී කිකුචි සංස්කරණයේ Financial Issues and Policy Concerns 2016 තිලකරත්න ජී. ශ්‍රී ලංකාවේ මූල්‍ය ඇතුළත් භාවයඃ වත්මන් තත්වයසහ ගැටලු ලිපිය

එක්සත් රාජධානිය රූට්ලෙජ් 2016ඃ සංස්කරණය ඩී භට්ටාචාර්ය සහ ඒ ඕඩොනෙස් - ල්ලානොස් පශ්චාත් 2015 අන්තර්ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයඃ දකුණේ දැක්ම හි ''ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණය සහ සහශ්‍රක සංවර්ධන ඉලක්කඃ පශ්චාත් 2015 සඳහා න්‍යාය පත්‍රයට ඇති බලපෑම් තිලකරත්න ජී.

සියල්ලන් ඇතුළත් කර ගන්නා වර්ධනය සඳහා සේවා නියුක්තිය සහ සමාජ ආරක්ෂණය අංක 3 නව දිල්ලිය 2015. තිලකරත්න ජී සහ එස් ජයවර්ධන සැපයූ ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණයඃ වත්මන් තත්වය සහ ශ්‍රම වෙළඳපොළ නිමැවුම්ඃ SARNET කාර්ය පත්‍රිකාව

## ඉදිරිපත් කිරීම්

සමරකෝන් එස් සහ එන් අරුණතිලක ශ්‍රී ලංකාවේ වයස්ගත පුද්ගලයන් සඳහා ආදායම් සුරක්ෂිත භාවය□ SDD –SPPS ව්‍යාපෘතියී කාර්ය පත්‍රිකා මාලාව UNESCAP බැංකොක් 2015

ජනවාරි 7 – 8 කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ පැවති ''ශ්‍රී ලංකාව තිරසාර සහ සියල්ලන් ඇතුළත් කර ගන්නා




පර්යේෂණ ප්‍රධාන ආචාර්ය ගංගා තිලකරත්න 2016 ශ්‍රී ලංකා ආර්ථික මණ්ඩපයේ දී ඇයගේ ඉදිරිපත් කිරීම

සංවර්ධනයක් කෙරේ යොමු කිරීම'' පිළිබඳ 2016 ශ්‍රී ලංකා ආර්ථික මණ්ඩපයේ දී ගංගා තිලකරත්න 'ශ්‍රී ලංකාවේ සමාජය ඇතුළත් කර ගැනීමඃ දරිද්‍රතාවය සහ වයස්ගතවීම' ඉදිරිපත් කිරීම

මාර්තු 14 – 16 එක්සත් ජනපදය වොෂින්ටන් ලෝක බැංකුව සංවිධානය කළ ආහාර පදනම් ආරක්ෂිත ජාල' පිලිබඳ වැඩ මුළුවේ දී ගංගා තිලකරත්න ''ශ්‍රී ලංකාවේ ආහාර පදනම් ආරකෂිත ජාලඃ මුදල් පැවරීම් දක්වා විකාශය සහ සංක්‍රාන්තිය'

ඔක්තෝබර් 15 සහ 16 බංග්ලාදේශ් දකා හි නම වැනි දකුණු ආසියානු ආර්ථික නායක හමුවේ දී දකුණු ආසියාවේ අසමානතාවය අඩු කිරීමඃ තීරණාත්මක ගැටලු සහ ප්‍රතිපත්ති විකල්ප' පිළිබඳ සැසියේ දී ගංගා තිලකරත්න සාකච්ඡා මණ්ඩපයේ සාමාජිකාවක් වූවාය

දෙසැම්බර් 13 සිට 15 දක්වා තායිලන්තයේ බැංකොක් හි TTI කලාපීය රැස්වීමේ දී තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා සමූහ දත්ත ( Big Data ) යොදා ගැනීමඃ ගැලපෙන මෙවලම් සහ තාක්ෂණය යොදා ගැනීම' සැසියේ දී ගංගා තිලකරත්න සාකච්ඡා මණ්ඩප සාමාජිකාවක් වූවාය




පර්යේෂණ ප්‍රධානි ආචාර්ය ගංගා තිලකරත්න මණ්ඩපයේ දී ඇයගේ ඉදිරිපත් කිරීමේ දී

ශ්‍රී ලංකා කෘෂිකර්ම ආර්ථික විද්‍යා 10 වැනි වාර්ෂික පර්යේෂන මණ්ඩපයේ දී ගංගා තිලකරත්න ''කෘෂිකාර්මික පවුල්වල දරිද්‍රතාවය□ අවදානම්බව සහ සමාජ සුභ සාධනය' ගැන ඉදිරිපත් කිරීමක් කළාය

## බ්ලොග්/ ලිපි

දෙසැම්බර් 8 ශ්‍රී ලංකාව□ කොළඹ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය SAEA සමග සංවිධානය කළ ආර්ථික සංගමය (SAEA)

ඔක්තෝබර් 16 දි අයිලන්ඩ්□ ඩේල් මිරර්□ Talking Economics Blog හි ගංගා තිලකරත්න සහ චින්තනී සූරියමුදලි 'ශ්‍රී ලංකාවේ දුප්පතුන් සඳහා වූ මූල්‍ය සේවාවන් නියාමනයඃ දිගු කලක් තිස්සේ අපේක්ෂාවෙන් සිටි ක්ෂුද්‍ර මූල්‍ය පනත පිලිබඳ සමීප බැල්මක්'

ජනවාරි 06 Talking Economics Blog හි විමල් නානායක්කාර විසින් 'සහශ්‍රක සංවර්ධන ඉලක්කවල සිට තිරසාර සංවර්ධන ඉලක්ක දක්වාඃ ශ්‍රී ලංකාව ඊළඟ පියවරට සූදානම් ද?'

මාර්තු 3 Talking Economics Blog හි විමල් නානායක්කාර විසින් '2030 වන විට ශ්‍රී ලංකාවට දරිද්‍රතාවය තුරන් කොට ආදායම් අසමානතාවය අඩු කළ හැකිද?'

ජුලි 28 Talking Economics Blog හි විමල් නානායක්කාර විසින් 'තිරසාර සංවර්ධන ඉලක්කඃ තිරසාර සංවර්ධන ඉලක්ක කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව තවමත් නිසි ගමන් මාර්ගයේ ද?'

# පරිසරය ස්වභාවික සම්පත් සහ කෘෂිකර්මාන්තය

ශ්‍රී ලංකාව ආර්ථික ප්‍රතිශෝධන මාවතට පිවිසෙන්නේ ලෝකය තිරසාර සංවර්ධන ඉලක්ක යුගයකට අවතීර්ණ වෙමින් සිටියදීයී තිරසාර සංවර්ධන ඉලක්කවල ප්‍රධාන අරමුණ වන්නේ ස්වභාවික සම්පත් සහ පරිසර පද්ධති සේවාවන් කල් පවත්නා ආර්ථික සංවර්ධනය සඳහා බුද්ධිමත්ව භාවිතා කිරීම සහතික කිරීම යී පරිසරය□ ස්වභාවික සම්පත් හා කෘෂිකර්මය තිරසාර සංවර්ධනයේ වැදගත් ලක්ෂණ වන්නේ මෙම අංශ ආහාර නිෂ්පාදනය□ අපනයන ඉපැයුම්□ ජලය සහ වන නිෂ්පාදන□ කර්මාන්තවලට අමුද්‍රව්‍ය සැපයීම සහ රැකියා සැපයීම යනාදි වශයෙන් ජාතික ආර්ථිකයට වැදගත් දායකත්වයක් ලබා දෙන නිසාය

තිරසාර සංවර්ධනය අත්කර ගැනීම බුද්ධිමත් ප්‍රතිපත්ති තීරණවලින් මගපෙන්වනු ලැබීම  සහ ලබා ගත හැකි ශාක්ෂි සහ තර්කානුකූල විශ්ලේෂණවලික් දැනුවත්වීමේ අවශ්‍යතාවයක් ඇති සියුම් තුලනය කිරීමකී

## දේශගුණික වෙනස්වීම

ගෝලීය දේශගුණික වෙනස්වීමේ තර්ජනය මතුවෙමින් පැවතීමෙන් අඩුවෙන් කාබන් මුදා හරින සහ දේශගුනික ප්‍රත්‍යාවස්ථිති විය යුතු නිසා වර්ධනයට අතිරේක කොන්දේසි පැනවේ ශ්‍රී ලංකාවේ ප්‍රතිශෝධන න්‍යාය පත්‍රය මෙම අවධානයන් වෛකල්පික දෙයක් නොව අනිවාර්ය බව බරපතළ ලෙස සැලකිල්ලට ගැනිමට බලකෙරේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට දේශගුණික වෙනස්වීම් ප්‍රතිපත්ති සකස් කිරීමේ දී සෘජුවම දායකවීමට හැකි වියී ශ්‍රී ලංකාවේ දේශගුණිත වෙනස්වීමේ බලපෑම් සඳහා ජාතික උපයුක්තන සැලැස්මක් 2016 – 2025 සකස් කිරීමට මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යංශය විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට භාර දෙන ලදී එම සැලැස්මෙන් උපයුක්තන අවශ්‍යතා□ විකල්ප□ පියවර සමග වගකිව යුතු ආයතන සහ මූලික අවදානම් අංශ නමයක් සඳහා දේශගුණික උපයුක්තනය සඳහා මූලික ක්‍රියාත්මක දර්ශක ඉදිරිපත් කරයී ව්‍යාපෘතිය අතුල සේනාරත්න විසින් මෙහෙයවන ලද අතර කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන් වූයේ කාංචනා වික්‍රමසිංහ සහ චතුර රොඩ්‍රිගෝ යී

එක අතකින් ගොවීන් සහ අනෙක් අතට ප්‍රතිපත්ති සම්පාදකයන් අතර දැනුම සහ තොරතුරු හුවමාරුවීමේ අසමමිතිකයන් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති විය හැකි සන්නිවේදන හිඩැස් දේශගුණික වෙනස්වීමට උපයුක්තන කිරීමේ දී සමස්ත ක්‍රියාවලියේ අකාර්යක්ෂමතාවයන් ඇති කළ හැකියී මෙම හිඩැස් ජයගත හැකි වන්නේ ප්‍රාදේශීය දැනුම් පද්ධතීන් ගේ ශක්තීන් හා දේශගුණ විද්‍යාවේ ආදර්ශන තාක්ෂණයේ ප්‍රගමනයන් යොදා ගතහැකි සංයුක්ත දේශගුණික කළමනාකරණ පද්ධතීන් ( ICIMS ) ස්ථාපනය කිරීමෙනී මෙම ආයතනයේ ප්‍රධානත්වයෙන් යුත් පර්යේෂකයන්ගේ එකතුවක් සංවර්ධනය වන වෙනත් කලාපවල ද යොදා ගැනීමේ අවකාශයක් සහිතව ශ්‍රී ලංකාවේ අවදානමක් ඇති ගොවි ප්‍රජාව සඳහා ප්‍රතිනිර්මාණය කළ හැකි ICIMS ආදර්ශන හඳුනා ගැනීමට සහ නියැදි අත්හදා බැලීමේ ක්‍රියාත්මක පර්යේෂණ වැඩ සටහනක් දියත් කරන ලදී මෙම පර්යේෂණ ව්‍යාපෘතිය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව□ ජනතක්ෂන්□ සංවර්ධන සහ පරිසර ආර්ථික විද්‍යාව සඳහා වූ දකුණු ආසියානු ජාලයේ ( SANDEE ) සම්බන්ධතාවය ඇතිව අප ආයතනය විසින් සිදු කරන ලදී ඊට අරමුදල් සපයන ලද්දේ තින්ක් ටෑන්ක් මුලපිරුම ( TTI ) සහ කැනඩාවේ අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ කේන්ද්‍රයේ ( IDRC ) අවස්ථා අරමුදලේ (Opportunity Fund ) මූල්‍ය ආධාර යටතේයී උචිත දේශගුණික තොරතුරු ලබා දීම සහ භාවිතාව වැඩි කිරීමෙන් අදාල සියලු පාර්ශ්වයන්ගේ සමස්ත උපයුක්තන ධාරිතාව වැඩි දියුණු කරන අතර දේශගුණික අනතුරුවලට ගොවි ප්‍රජාව ලක්වීමේ අවදානම අඩු කළ හැකි මැදිහත්වීම් ගෙනහැර දැක්විමට මෙම ව්‍යාපෘතිය අදහස් කරයී තීරණ කාර්යක්ෂමව උපයුක්තන කිරීම සඳහා දේශගුනික තොරතුරු සහ සන්නිවේදන හිඩැස් පියවීමේ ප්‍රවිචාරණ වැඩ මුළුවක්: සංයුක්ත දේශගුණික තොරතුරු කළමනාකරණ පද්ධතියක්□ කලාපයේ දේශීය සහ කලාපීය විශේෂඥයන්ගේ සහභාගිත්වයෙන් 2016 ජුනි මස පැවැත්විණී අතුල සේනාරත්නගේ නායකත්වයෙන් යුත් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කණ්ඩායම මනෝජ් තිබ්බොටුවාව□ කාංචනා වික්‍රමසිංහ සහ දිලානි හිරිමුතුගොඩගේ යන අයගෙන් සමන්විත විය මෙම පර්යේෂණයට අරමුදල් ලබා දෙන ලද්දේ අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ කේන්ද්‍රය විසිනී (IDRC )

> *ස්වභාවික ප්‍රාග්ධන සම්පත් ක්ෂයවීමට හේතුවන වර්ධනය දීර්ඝ කාලීන වශයෙන් පවත්වා ගත නොහැකි නිසා සමත් වූවක් නොවේ ජනාවාසයට හිතකර සර්ම කලාපීය පරිසරයකින් පොහොසත් ශ්‍රී ලංකාව පුරාම ජනතාවගේ සුභ සිද්ධිය සඳහා යොදා ගත හැකි පරිසර පද්ධතින් ගණනාවකින් සමන්විතයී ඉමහත් වූ ස්වභාවික සම්පත් ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද කාලීන වේගවත් වර්ධනය දියත් කිරීමට අවශ්‍යයෙන්ම ශක්තිමත් වේදිකාවකී මෙම ස්වභාවික දායාදය ජනතාවගේ ජීවන තත්වයේ අපේක්ෂිත වැඩි දියුණුව ළඟා කර ගැනීමට□ වඩාත් වැදගත්ව අනාගත පරම්පරාවල සුභසිද්ධිය සඳහා පවත්වා ගත හැකිද යන්න රඳා පවතින්නේ එය කෙතරම් සංවේදීව යොදා ගන්නේ ද යන්න මත යී මෑතකදී තිරසාර යන අදහස වෙනුවට වඩාත් ප්‍රායෝගික සංකල්පයක් වන 'හරිත වර්ධනය' වැනි යෙදුම් ප්‍රචලිතයී හරිත වර්ධනය වෙනුවෙන් පෙනී සිටින අය ස්වභාවික ධන සම්පත්වල දීර්ඝ කාලීන පැවැත්ම සහතික කරන වර්ධන මංපෙත් ගවේෂණය කරතී කෙසේ වුවත් ශ්‍රී ලංකාවේ දැනට ස්වභාවික ධන සම්පත් යොදා ගැනීම හරිත වර්ධනයට අවශ්‍ය වූ තත්වයන් සපුරාලන්නේ නැති බවට අපමණ සාක්ෂි පවතී හරිත වර්ධනය සඳහා වූ ප්‍රතිපත්ති/ උපාය මාර්ග පුළුල් ක්ෂේත්‍ර තුනක් ආවරණය වේ: (i ) නව්‍යකරණය සහ නිවැරදි විසඳුම් යොදා ගැනීම (ii ) දිරිගැන්වීම් නිවැරදි කිරීමේ ප්‍රතිපත්ති සහ (iii ) නිවැරදි ආයතන ඇති කිරීම සඳහා ප්‍රතිපත්ති යනුවෙනි*

කාංචනා වික්‍රමසිංහ ගෝලීය සංවර්ධන ජාලයේ (GDN ) මූල්‍ය සහ තාක්ෂණ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ

ගොවීන් සඳහා දේශගුණික රක්ෂණ ක්‍රමයක් පිළිබඳ අධයයනය දිගටම සිදු කළාය. මෙම අධ්‍යයනයේ මූලික සොයා ගැනීම් ඉදිරිපත් කිරීම සඳහා සහ අධ්‍යයනයේ දෙවන අදියර සඳහා පාර්ශ්වකරුවන්ගේ අදහස් සහ යෝජනා ලබා ගැනීමට පාර්ශ්වකරුවන්ගේ වැඩ මුළුවක් මෙම ආයතනය විසින් සංවිධානය කරන ලදී. කාංචනා වික්‍රමසිංහ මෙම සොයා ගැනීම් රටේ ප්‍රධාන විශේෂඥයන් ගණනාවක් සහභාගි වූ කෘෂිකාර්මික ආර්ථික විද්‍යාඥයන්ගේ 10 වැනි වාර්ෂික සාකච්ඡා මණ්ඩපයේ දී ඉදිරිපත් කළාය. ඊට අමතරව ආයතනයේ කාර්ය මණ්ඩලය දේශගුණික වෙනස්වීමට අදාල ක්‍රියාකාරකම් ගණනාවකට සහභාගි වූහී ඊට අතුල සේනාරත්න 'දකුණ - දකුණ සහයෝගිතාවය පිළිබඳ අන්තර්ජාතික සමුළුවේ දී 'දේශගුණික වෙනස්වීම් සහ දකුණ - දකුණ සහයෝගිතාවය' සහ ජෝර්ජියා රාජ්‍ය විශ්ව විද්‍යාලයේ පැවති 12 වැනි අන්තර්ජාතික ක්ෂුද්‍ර රක්ෂණ සමුළුව සඳහා ආර්ථික විශ්ලේෂණ අවදානම් විශ්ලේෂණ කේන්ද්‍රය (CEAR) සංවිධානය කළ ශාස්ත්‍රඥයන්ගේ පූර්ව සමුළුවේ දී 'ශ්‍රී ලංකාවේ වගා රක්ෂණ තක්සේරුවක්' ඉදිරිපත් කිරීමද ඇතුළත් යී අතුල සේනාරත්න මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යංශයේ දේශගුණික වෙනස්වීම් පිළිබඳ ලේකම් කාර්යංශයේ ප්‍රකාශනයක් වන 'ශ්‍රී ලංකාවේ කාලගුණික වෙනස්වීම් පිළිබඳ සඟරාවේ කර්තෘ මණ්ඩල සාමාජිකයෙක් ද වේ ආයතනයේ දේශගුණික වෙනස්වීම් ප්‍රතිපත්ති පර්යේෂණයට ආපදා අනතුරු අඩු කිරීම සහ නාගරික සැලසුම් කිරීමේ ලක්ෂණ ද ඇතුලත් ය. එක්සත් ජාතින්ගේ සංවර්ධන අරමුදලේ මූල්‍ය සහාය ඇතිව මෙම ආයතනය ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයට අදාලව දේශගුණික උපයුක්තන සහ ආපදා අනතුරු අඩු කිරීමේ ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක් ද සිදු කරමින් සිටී. එම අධ්‍යයනයෙන් එම අංශය සඳහා පාඩු සහ හානි තක්සේරු කිරීමේ යාන්ත්‍රණයක් ද යෝජනා කරයී එක්සත් ජාතීන්ගේ හැබිටැට් (Habitat) ආයතනයේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධනයේ දී දේශගුණික වෙනස්විම් ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම අවධානය යොමු කරයි. මෙම අධ්‍යයන සිදු කරනුයේ අතුල සේනාරත්න සහ කාංචනා වික්‍රමසිංහ

## හරිත ආර්ථිකය

සමහර ආසියානු වර්ධන කේන්ද්‍රවල අත්දැකිමෙන් විශාල පරිසර කැප කිරීමකින් අත් කර ගන්නා වර්ධනයෙන් අපේක්ෂා කරන ගුණාත්මක ජීවිතය නොලැබෙන බව දක්වයී පරිසරය සුරැකීම ජනතා ජීවන මට්ටම පරිණාමයේ දී අත්‍යවශ්‍ය වූවකි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය හරිත ආර්ථිකයට අදාල ගැටලු ගැන දිගටම පර්යේෂණ කරයි. ශ්‍රී ලංකාවේ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන සංචාරක කර්මාන්තයේ චිරස්ථායි භාවය පවත්වා ගැනීමේ ලක්ෂණ සහතික කිරීම කෙරේ වැඩි අවධානයක් යොමු කරයි. ශ්‍රී ලංකාවේ හෝටල් අංශයේ පරිසර කළමනාකරණයේ ලක්ෂණ පිළිබඳව වත්මන් තත්වය සහ ගැටලු ගැන සංවර්ධනය සහ පරිසර ආර්ථිකය සඳහා වූ දකුණු ආසියානු ජාලය ( SANDEE ) විසින් ප්‍රකාශ කරන ලද 'ශ්‍රී ලංකාවේ හෝටල් කර්මාන්තයේ පරිසර කළමනාකරණ භාවිතා උපයුක්තනය' යන මැයෙන් වූ කාර්ය පත්‍රිකාවේ ඉස්මතු කර ඇතී මෙම පත්‍රිකාවට පදනම්ව ඇත්තේ SANDEE ආයතනයේ තාක්ෂණ සහ මූල්‍ය සහාය යටතේ අප ආයතනයේ කාංචනා වික්‍රමසිංහ විසින් කළ පර්යේෂණයයි. බලශක්ති කළමනාකරණයට අදාල සුවිශේෂී ලක්ෂණ බලශක්ති අමාත්‍යංශයේ පර්යේෂණ සඟරාවේ පළ කළ ' ශ්‍රී ලංකාවේ හෝටල් අංශයේ බලශක්ති කළමනාකරණය: ප්‍රශස්ත භාවිතා උපයුක්තනය' ලිපියේ කාංචනා වික්‍රමසිංහ ඉස්මතු කර ඇතී මෙම ලිපියෙන් ඉදිරිපත් කරන විශ්ලේෂණය අනුව කුඩා හෝටල් නිදහස් හෝටල් සහ අලුත් හෝටල් ප්‍රශස්ත බලශක්ති කළමනාකරණ භාවිතා යොදා ගැනීම සඳහා ප්‍රතිපත්ති දිරිගැන්වීම් තිබිය යුතුය. කාංචනා වික්‍රමසිංහ හෝටල් අංශයේ ප්‍රශස්ත පරිසර කළමනාකරණ භාවිතාවන් ප්‍රවර්ධනය කිරීමේ දී ඇති




කොළඹ ගලදාරි හි පැවති 'තීරණ කාර්යක්ෂමව උපයුක්තනය සඳහා දේශගුණික තොරතුරු සහ සන්නිවේදන හිඩැස් පියවීම' කලාපීය ප්‍රව්චාරණ වැඩ මුළුව

සුවිශේෂී බාධක සහ එවැනි මුලපිරුම් අලෙවි කිරීමේ දී අදාල ගැටලු කේම්බ්‍රිජ් ස්කොලර්ස් පළ කළ 'ගෝලීය දකුණේ තිරසාර සංචාරක කර්මාන්තයඃ ප්‍රජාවන් පරිසරය සහ අත්දැකීම්' කෘතියේ පත්‍රිකා දෙකකින් ඉදිරිපත් කරයි

සමහර ප්‍රදේශවල සංචාරක කර්මාන්තයේ මෑතක වූ සංවර්ධනයත් සමග චිරස්ථායි ලක්ෂණ කෙරේ ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීමේ මදකම නිසා පාරිසරික සහ සමාජයීය ගැටලු ගණනාවක් මතුව ඇති ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය කල්පිටිය ප්‍රදේශයේ කොරල් පර ආශ්‍රිතව කරන ලද අධ්‍යයනයකින් මෙම ක්ෂේත්‍රය අවධානයට ලක් කර ඇති සංචාරක සහ විනෝදාස්වාදය පිළිබඳ කර්මාන්තයේ සංවර්ධනයත් සමග මෙම ප්‍රදේශයේ ප්‍රාදේශීය ආර්ථිකය පරිණාමයට පත්වෙමින් පවතින බව එම අධ්‍යයනයෙන් පෙන්නුම් කරයි මෙම ආයතනයේ කාංචනා වික්‍රමසිංහ අතුල සේනාරත්න සහ ලෝක සංරක්ෂණ සංගමයේ ( IUCN) අර්ජන් රාජසූරිය සකස් කරන ලද පත්‍රිකාවෙන් පරිසර පද්ධති සේවා කෙරේ නිෂේධනීය බලපෑම් ඇති කළ හැකි ක්‍රියාකාරකම් පාලනයට යටත් කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කෙරේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කාර්ය මණ්ඩලය පාරිසරික තිරසාර භාවය සහ හරිත ආර්ථිකය ගැන සම්බන්ධවීමට අමතරව කාංචනා වික්‍රමසිංහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සංගමයේ 10 වැනි වාර්ෂික සාකච්ඡා මණ්ඩපයේ දී පත්‍රිකාවක් ඉදිරිපත් කළ අතර එය ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංගමයේ වාර්ෂික වාර්තාවේ ද පළවිය් වැඩි දුරටත් අතුල සේනාරත්න ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනයේ දී බලශක්ති සුරක්ෂිත භාවය තිරසාර සංවර්ධනය සහ හරිත ගිණුම් තැබීම' යනුවෙන් ප්‍රසිද්ධ දේශනයක් පැවැත් වූයේයි

## ආහාර සුරක්ෂිත භාවය

තිරසාර සංවර්ධන ඉලක්ක 2 ( SDG 2 ) සාගින්න අවසන් කිරීමට ආහාර සුරක්ෂිත භාවය සාක්ෂාත් කිරීමට සහ පෝෂණය වැඩි දියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනී පසුගිය වසර 15 තුළ සහශ්‍රක සංවර්ධන ඉලක්ක සමයේ ශ්‍රී ලංකාව කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගත් නමුත් සැලකිය යුතු අභියෝග තවමත් පවතී මෙම අභියෝග හඳුනා ගැනීමට සහ ඒවා තිරසාර ප්‍රතිපත්ති විසඳුම්වලින් ආමන්ත්‍රණය කිරීමට පර්යේෂණ සැලකිය යුතු ප්‍රමාණයක් මුල පුරා ඇති මනෝජ් තිබ්බොටුවාව ගේ ප්‍රධානත්වයෙන් යුත් පර්යේෂණ කණ්ඩායමක් ලෝක ආහාර වැඩ සටහනේ WFP ) අරමුදල් සහාය ඇතිව ශ්‍රී ලංකාවේ ජාතික ආහාර සහ පෝෂණ සුරක්ෂිතා තත්වය පුනරීක්ෂණය කිරීමට අධ්‍යයනයක් ආරම්භ කර ඇති මෙම අධ්‍යයනයෙන් රටේ ආහාර සහ පෝෂණ සුරක්ෂිත භාවය සාක්ෂාත් කර ගැනීමේ දී ඇති අභියෝග හඳුනා ගැනීමට සහ තිරසාර සංවර්ධන ඉලක්ක 2 සාක්ෂාත් කර ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් අපේක්ෂා කෙරේ මෙම පර්යේෂණ කණ්ඩායමට ආයතනයේ දිලානි හිරිමුතුගොඩගේ සහ HARTI ජන ලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව MRI SAPRI සහ ලෝක ආහාර වැඩ සටහන යන ආයතනවල පර්යේෂකයන් කීප දෙනෙකු ඇතුළත් යි අන්තර්වාර සොයා ගැනීම් ආණ්ඩුවේ ඇමතිවරුන් ලේකම්වරුන් සහ රජයේ වෙනත් නිලධාරීන් ශාස්ත්‍රඥයන් සහ රාජ්‍ය නොවන සංවිධාන බහුජන සංවිධාන සහ පුද්ගලික අංශයේ වෙනත් පාර්ශ්වකරුවන් ඇතුළත් සාකච්ඡා මණ්ඩප කීපයක දී ඉදිරිපත් කරන ලදී

ප්‍රධාන ආහාර ද්‍රව්‍යවල ඉල්ලුමට සහ සැපයුමට බලපාන සාධක සහ ඊට සම්බන්ධිත වටිනාකම් දාමයන් අවබෝධ කර ගැනීම උචිත තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ දී තීරණාත්මක යි අතුල සේනාරත්න මනෝජ් තිබ්බොටුවාව කාංචනා වික්‍රමසිංහ සහ දිලානි හිරිමුතුගොඩගේ යන අයගෙන් සමන්විත ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා පදනමේ අරමුදල් යොදා ගෙන ශ්‍රී ලංකාවේ සහල් මාළු සහ කිරි නිෂ්පාදනවලට අදාල සැපයුම් සහ මිල හැසිරීම පිළිබඳ වසර තුනක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළහී පර්යේෂණයේ අන්තර්වාර සොයා ගැනීම් පර්යේෂණ කණ්ඩායම පාඩම් බෙදා ගැනීමේ සහ ප්‍රතිපත්ති ප්‍රචාරණ වැඩ මුළුවේ දී ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග හුවමාරු කර ගත්හ

## කෘෂිකාර්මික වටිනාකම් දාමයන්

ආහාර වටිනාකම් දාම සංවර්ධනය ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමේ දී සහ තිරසාර සංවර්ධනය සාක්ෂාත්කර ගැනීමේ දී ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ එමෙන්ම ජාතික කෘෂිකාර්මික සහ ආහාර ප්‍රතිපත්ති සහ තිරසාර සංවර්ධන ඉලක්ක න්‍යාය පත්‍රයෙන් දක්වන ලද රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීමට ජාතික ආහාර වටිනාකම් දාම සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ දැනෙන අවශ්‍යතාවයක් ද ඇති ශ්‍රී ලංකාවේ ආහාර වටිනාකම් දාම සංවර්ධනය සඳහා මූලික අවස්ථා ගැන සංවාදයක් පහසු කිරීමට සහ සාර්ථක ආහාර වටිනාකම් දාමයක් සඳහා පදනමක් සැපයීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයන් විසින් මූලික කර්මාන්ත අමාත්‍යාංශය සමග ඒකාබද්ධව අන්තර්ජාතික ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයේ ( IFPRI ) මූල්‍ය සහාය ඇතිව ආහාර වටිනාකම් දාම සංවර්ධනය පිළිබඳ ජාතික වැඩ මුළුවක් සංවිධානය කරන ලදී අතුල සේනාරත්න මනෝජ් තිබ්බොටුවාව ජානක විජයසිරි චතුර රොඩ්‍රිගෝ දිලානි හිරිමුතුගොඩගේ සහ දුෂාන්ති දයානන්ද යන මෙම ආයතනයේ පර්යේෂකයෝ විවිධ සැසිවලදී තම අත්දැකීම් බෙදා ගත්හ

කෘෂිකර්මයට ඵලදායිතාවය නගා සිටුවීමට දරිද්‍රතාවය අඩු කිරීමට ආහාර සුරක්ෂිත භාවය වැඩි කිරීමටත් ඒ තුළින් තිරසාර සංවර්ධන ප්‍රයත්න ශක්තිමත් කිරීමේ ඉඩ ප්‍රස්ථා පවතින නිසා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය නගා සිටුවීමේ දී කෘෂිකර්මාන්තයේ ආයෝජන තීරණාත්මක භූමිකාවක් ඉටු කරයි කෘෂිකාර්මික සංවර්ධනයේ පිළිගත හැකි වර්ධන මට්ටමක් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය අයෝජනය දැනට පවතින ආයෝජන ප්‍රවනතාවයන් බෙහෙවින් ඉක්මවා යන නිසා කෘෂිකාර්මික ආයෝජන මූල්‍යයනයේ අභියෝග ගැන සැක සංකා පවතී අතුල සේනාරත්න සහ කාංචනා වික්‍රමසිංහගෙන් සමන්විත පර්යේෂණ කණ්ඩායමක් ආහාර සුරක්ෂිතතාවය කෙරේ දේශගුණික වෙනස්වීම්වල බලපෑම හඳුනා ගැනීමට විශේෂ අවධානය යොමු කරමින් කෘෂිකර්මයේ ආහාර වගා අංශය කෙරේ යොමුව කෘෂිකර්මයේ රාජ්‍ය ආයෝන පරික්ෂා කරති මෙම අධ්‍යයනයෙන් කෘෂිකර්මයේ

අනාගත රාජ්‍ය ආයෝජන දිශාව ගැන අදහස් කීපයක් හෙළි කෙරේ ඊට අමතරව 2016 ආර්ථිකයේ තත්වය ප්‍රකාශනයේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පරිච්ඡේදයේ දී මනෝජ් තිබ්බොටුවාව සහ දිලානි හිරිමුතුගොඩගේ කෘෂිකාර්මික ආයෝජනය පිළිබඳව වාර්තා කරමින් දූනට ඇති සම්පත් වඩාත්



මාරවිල පැවති පාඩම් බෙදා ගැනීමේ සහ ප්‍රතිපත්ති ප්‍රචාර වැඩ මුළුවට සහභාගි වූවන්

කාර්යක්ෂම ආකාරයට වාසියක් සැලසෙන ආකාරයෙන් යොදා ගැනීමට ඇති නව්‍ය ආර්ථික දිරිගැන්වීම් විමසා බලති.

ඉඩම් හා වතුර හිඟකම වැඩිවීම සහ දේශගුණික වෙනස්වීම් වැනි අභියෝග හමුවේ කෘෂිකාර්මික නිමැවුම් වැඩි කිරීමට ඇති විකල්පය වන්නේ කෘෂිකර්මයේ ඵලදායිතාවය වැඩි කිරීමයි ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සාක්ෂාත් කර ගත යුත්තේ නොකඩවා කෙරෙන ආයෝජන තුළින් නව තාක්ෂණය හඳුන්වා දීමෙනි හොඳින් ස්ථාපනය කළ බුද්ධිමය දේපොළ අයිතින් පද්ධතියකින් නව්‍යකරණය□ තාක්ෂණ පැවරීම්□ නිෂ්පාදන සංවර්ධනය□ නව පැලෑටි වර්ග අභිජනනය යනාදිය දිරිමත් කිරීමට හේතු වනු ඇති ශ්‍රී ලංකාවේ පැලෑටි වර්ග සහ ගොවීන්ගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කිරීමේ බුද්ධිමය දේපොළ අයිතිවාසිකම් පිළිබඳව මෙම ආයතනය කළ අධ්‍යයනයකින් ගැටලු හඳුනා ගැනීමට□ පවතික ප්‍රතිපත්ති සහ ගොවීන්ගේ සම්ප්‍රදායික දැනුම සහ වී වර්ග පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ප්‍රතිපත්ති හිඩැස් හඳුනා ගැනීමට උත්සාහ කරයි. මෙම අධ්‍යයනයට අරමුදල් ලබා දුන්නේ ජාතික විද්‍යා පදනමෙනි (NSF ) මෙම අධ්‍යනයේ සොයා ගැනීම් ශ්‍රී ලංකාවේ සබරගමුව විශ්ව විද්‍යාලය සංවිධානය කළ කෘෂිකාර්මික විද්‍යාවේ තුන්වැනි අන්තර්ජාතික සමුළුවේ දී සහ තවත් විවිධ සාකච්ඡා මණ්ඩපවලදී ඉදිරිපත් කරන ලදී. මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් පදනම් කොට කාර්ය පත්‍රිකාවක් ද ප්‍රකාශ කරන ලදී. එම පර්යේෂණ කණ්ඩායමට දිලානි හිරිමුතුගොඩගේ සහ පරාක්‍රම සමරතුංග අයත්ය.

පර්යේෂණ සහ පතුරුවා හැරීමේ ක්‍රියාකාරකම්වලට අමතරව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් කීප දෙනකුම උපදේශක මට්ටමෙන් කෘෂිකාර්මික ප්‍රතිපත්ති සංවර්ධනයට දායක වූහ් අතුල සේනාරත්න 2016 දී ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සංගමයේ ( SLAEA) සභාපති වශයෙන් කටයුතු කෙළේයී ඔහු ශ්‍රී ලංකාවේ ප්‍රමිති ආයතනයේ කෘෂිකර්මය පිළිබඳ අංශීය කොමිටියේ සාමාජිකයෙකු ලෙස ද මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යංශය සංවිධානය කළ නිල් කොළ යුග සම්මන්ත්‍රණයේ දී ශ්‍රී ලංකාවේ NEXT නිල් කොළ ආර්ථිකය පිළිබඳ විශේෂ සැසියේ සාකච්ඡා මණ්ඩප සාමාජිකයෙකු ලෙස ද කටයුතු කෙළේයී මනෝජ් තිබ්බොටුවාව ශ්‍රී ලංකාවේ තේ පර්යේෂණ ආයතනයේ ආර්ථික පර්යේෂණ - තාක්ෂණ ඇගයීමේ කොමිටියේ සාමාජිකයෙකු ලෙස ද□ මූලික කර්මාන්ත අමාත්‍යංශය සහ අන්තර්ජාතික ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය (IFPRI) සඳහා ආහාර සුරක්ෂිත භාවය සහ ශ්‍රී ලංකාවේ ආහාර වටිනාකම් දාම සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කෙළේයී ඔහු ආසියානු සංවර්ධන බැංකුව සංවිධානය කළ ශ්‍රී ලංකාවේ හේතු විනිශ්චය කිරීමේ අධ්‍යයක ප්‍රචාරණ වැඩ මුළුවේ දී ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය නවීකරණයේ අභියෝග සහ අවස්ථා පිළිබඳ සාකච්ඡාවටද සහභාගි වූයේය.

## ප්‍රකාශන

කාංචනා විත්‍රමසිංහ විසින් ශ්‍රී ලංකාවේ හෝටල් කර්මාන්තයේ පාරිසරික කළමනාකරන භාවිතා යොදා ගැනීම□ කාර්ය පත්‍රිකා අංක 114 – 16, නේපාලයේ කත්මණ්ඩු හි සංවර්ධනය සහ පරිසර ආර්ථිකය සඳහා වූ දකුණු ආසියානු ජාලය (SANDEE)

කාංචනා වික්‍රමසිංහ විසින් පාරිසරික තිරසාර ලක්ෂණ□ 2016 ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංගමයේ වාර්ෂිකයේ දී

දිලානි හිරිමුතුගොඩගේ සහ පරාක්‍රම සමරතුංග විසින් නව පැලෑටි වර්ග සහ ගොවීන්ගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කිරීමේ බුද්ධිමය දේපොළ අයිතිවාසිකම්: ශ්‍රී ලංකාවේ වී පිළිබඳව□ 2016 කාර්ය පත්‍රිකා අංක 24, කොළඹ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.

කාංචනා වික්‍රමසිංහ කේ 2016, එම් අස්ලාම්□ ඇම් ජේ ඇම් කූපර්□ ඇන් ඕත්මන්□ ඒ ඒ ලී (Eds ) ශ්‍රී ලංකාවේ හෝටල් අංශයේ පාරිසරික කළමනාකරණ භාවිතා යොදා ගැනීමට ඇති බාධක□ ඒ රී නිව්කාසල් හි කේම්බ්‍රිජ් ස්කොලර්ස් ප්‍රකාශන ය ගෝලීය දකුණේ තිරසාර සංචාරක කර්මාන්තය: ප්‍රජාවන්□ පරිසරය සහඅත්දැකීම් (පිටු 209 සිට 221 )

කාංචනා වික්‍රමසිංහ විසින් ශ්‍රී ලංකාවේ හෝටල් අංශයේ බලශක්ති කළමනාකරණය: ප්‍රශස්ත භාවිතා යොදා ගැනීම□ ශ්‍රී ලංකාව බලශක්ති බලගැන්වූ ජාතියක් පර්යේෂණයේ සොයා ගැනීම් 2015 කාංචනා වික්‍රමසිංහ□ අතුල සේනාරත්න සහ ඒ රාජසූරිය (2014) විසින් කොරල්පර පරිසර පද්ධති සේවා සංරක්ෂණය කිරීම හා ආර්ථික විභවයන් භාවිතයට ගැනීම□ බලශක්ති අමාත්‍යංශයේ පර්යේෂණ සඟරාව වෙළුම 01 Wildlife වෙළුම 09 අංක 1

දිලානි හිරිමුතුගොඩගේ සහ අතුල සේනාරත්න විසින් වෙළඳ පොළ ලබා ගැනීම සහ පිවිසීම වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකාවේ මත්ස්‍ය වටිනාකම් ජාලයේ විශ්ලේෂණයක්: 2016 සංක්ෂිප්ත ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ආර්ථික සංගමයේ 10 වැනි වාර්ෂික පර්යේෂණ සාකච්ඡා මණ්ඩපය.

## ඉදිරිපත් කිරීම්

අතුල සේනාරත්න විසින් දේශගුණික වෙනස්වීම් සහ දකුණු – දකුණු සහයෝගිතාවය මාර්තු 10 – 11 ඉන්දියාව නවදිල්ලියේ සංවර්ධනය වන රටවල් සඳහා පර්යේෂණ සහ තොරතුරු පද්ධති (RIS) සංවිධානය කළ දකුණු – දකුණු සහයෝගිතවය පිළිබඳ අන්තර්ජාතික සමුළුවේ දී

මනෝජ් තිබ්බොටුවාව විසින් 'ජාතික සංයුක්ත ආහාර සුරක්ෂිත භාවය සහ පෝෂණ ප්‍රතිපත්තිය' අප්‍රේල් 6 ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශ්‍රවනාගාරයේ දී මූලික කර්මාන්ත අමාත්‍යංශය සහ අන්තර්ජාතික ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය සංවිධානය කළ ''ආහාර වටිනාකම් වටිනාකම් දාම සංවර්ධනය'' ජාතික වැඩ මුළුවේ දී

දිලානි හිරිමුතුගොඩගේ විසින් ශ්‍රී ලංකාවේ කෘෂි ආහාර වටිනාකම් ජාලඃ කිරි සහ මත්ස්‍ය වටිනාකම් දාම අප්‍රේල් 6 ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශ්‍රවනාගාරයේ දී මූලික කර්මාන්ත අමාත්‍යංශය සහ අන්තර්ජාතික ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය සංවිධානය කළ ''ආහාර වටිනාකම් වටිනාකම් දාම සංවර්ධනය'' ජාතික වැඩ මුළුවේ දී

ජානක විජේසිරි විසින් ශ්‍රී ලංකාවේ ආහාර වටිනාකම් දාමයේ කෘෂි ආහාර ප්‍රමිතීන්ගේ වැදගත්කම අප්‍රේල් 6 ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශ්‍රවනාගාරයේ දී මූලික කර්මාන්ත අමාත්‍යංශය සහ අන්තර්ජාතික ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය සංවිධානය කළ ''ආහාර වටිනාකම් වටිනාකම් දාම සංවර්ධනය'' ජාතික වැඩ මුළුවේ දී

අතුල සේනාරත්න විසින් ජෛව විවිධත්ව සන්ධාන අතර වැඩි ශක්තියකින් ( Synergy ) කටයුතු කිරීමට ජාතික සූදානමඃ අගෝස්තු 8 – 9 කොළඹ ගලදාරි හෝටලයේ දී ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය සහ UNEP ඒකාබද්ධව සංවිධානය කළ වැඩි ශක්තීන් ගැන කටයුතු කිරීම□ තිරසාර සංවර්ධන ඉලක්ක සහ මූල්‍යනය□ ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ගය සහ ක්‍රියාත්මක සැලැස්ම පිළිබඳ වැඩ මුළුවේ දී

කාංචනා වික්‍රමසිංහ විසින් 'දේශගුනික රක්ෂණය සම්බන්ධයෙන් පවතින අනතුරු කළමණාකරණ උපාය මාර්ග සහ තත්වයන් සහ ගැටලු' සැප්තැම්බර් 13 මෙම ආයතකයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී ''ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ ගොවීන්ගේ දේශගුණික රක්ෂණය සඳහා ඇති ඉල්ලුම පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අධ්‍යයනයේ සොයා ගැනීම්' පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ රැස්වීමේ දී

මනෝජ් තිබ්බොටුවාව ආහාර සුරක්ෂිත භාවය සහ පෝෂණය පිළිබඳ ජාතික උපාය මාර්ග පුනරීක්ෂණය ඔක්තෝබර් 16 කොළඹ බණ්ඩාරනායක අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාවේ දී SAPRI සහ WFP සංවිධානය කළ විවිධ පාර්ශ්වකරුවන්ගේ ප්‍රථම රැස්වීමේ දී

දිලානි හිරිමුතුගොඩගේ විසින් 'ආහාර සුරක්ෂිත භාවයේ ගතිකත්වය සහ අනාගත අභියෝග' ඔක්තෝබර් 19 කොළඹ අන්තර්ජාතික අධ්‍යයනය සඳහා වූ බණ්ඩාරනායක කේන්ද්‍රය (BCIS සංවිධානය කළ 2016 ලෝක ආහාර දිනය පිළිබඳ සම්මන්ත්‍රණයේ දී

මනෝජ් තිබ්බොටුවාව ' ආහාර සුරක්ෂිත භාවය සහ පෝෂණය පිළිබඳ ජාතික උපාය මාර්ග පුනරීක්ෂණය ඔක්තෝබර් 28 කොළඹ BMICH හිදී SAPRI සහ WFP සංවිධානය කළ පළමු ක්‍රියාත්මක කණ්ඩායමේ රැස්විමේ දී

කාංචනා වික්‍රමසිංහ විසින් ශ්‍රී ලංකාවේ සහල් සහ මාළු සැපයුම් විශ්ලෙෂනයක්□ නොවැම්බර් 03 සහ 04 මාරවිල ක්ලබ් පාම් බේ හෝටලයේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍ය සංගමයේ සහාය ඇතිව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ ජාතික විද්‍යා පදනම සංවිධානය කළ සහල්□ මාළු සහ කිරි නිෂ්පාදන විවිධ වෙළඳ පොළ විශ්ලේෂණයකී ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිත භාවය සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති විකල්ප පිළිබඳ පාඩම් බෙදා ගැනීමේ සහ ප්‍රතිපත්ති ප්‍රවිචාරණ වැඩ මුළුවේ දී

දිලානි හිරිමුතුගොඩගේ විසින් ශ්‍රී ලංකාවේ මාළු සහ කිරි නිෂ්පාදන වටිනාකම් දාමවිශ්ලේෂණයක් නොවැම්බර් 03 සහ 04 මාරවිල ක්ලබ් පාම් බේ හෝටලයේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍ය සංගමයේ සහාය ඇතිව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ ජාතික විද්‍යා පදනම සංවිධානය කළ සහල්□ මාළු සහ කිරි නිෂ්පාදන විවිධ වෙළඳ පොළ විශ්ලේෂණයකී ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිත භාවය සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති විකල්ප පිළිබඳ පාඩම් බෙදා ගැනීමේ සහ ප්‍රතිපත්ති ප්‍රවිචාරණ වැඩ මුළුවේ දී

මනෝජ් තිබ්බොටුවාව විසින් ශ්‍රී ලංකාවේ සහල් සහ මාළු නිෂ්පාදන සඳහා පාරිභෝගික ඉල්ලුම නොවැම්බර් 03 සහ 04 මාරවිල ක්ලබ් පාම් බේ හෝටලයේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍ය සංගමයේ සහාය ඇතිව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ ජාතික විද්‍යා පදනම සංවිධානය කළ සහල්□ මාළු සහ කිරි නිෂ්පාදන විවිධ වෙළඳ පොළ විශ්ලේෂණයකී ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිත භාවය සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති විකල්ප පිළිබඳ පාඩම් බෙදා ගැනීමේ සහ ප්‍රතිපත්ති ප්‍රවිචාරණ වැඩ මුළුවේ දී




පර්යේෂණ ප්‍රධාන ආචාර්ය මනෝජ් තිබ්බොටුවාව ආහාර වටිනාකම් දාම සංවර්ධනය පිළිබඳ ජාතික වැඩ මුළුව අමතමින්

කාංචනා වික්‍රමසිංහ විසින් දේශගුණයෙන් ඇති කෙරෙන අනතුරුවලින් ගොවීන් ආරක්ෂා කිරීම: ශ්‍රී ලංකාවේ වගා රක්ෂණයේ තක්සේරුවක් නොවැම්බර් 14 ශ්‍රී ලංකාවේ කොළඹ දී පැවැත් වූ 12 වැනි අන්තර්ජාතික ක්ෂුද්‍ර රක්ෂණ සමුළුව ජෝර්ජ් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ ආර්ථික අනතුරු විශ්ලේෂණය සඳහා වූ කෙන්ද්‍රය (CEAR) සංවිධානය කළ ශාස්ත්‍රඥ පූර්ව සමුළුවේ දී

දිලානි හිරිමුතුගොඩගේ විසින් ආහාර සුරක්ෂිත භාවයේ සහ පෝෂණයේ ජාතික උපාය මාර්ගික පුනරීක්ෂණය: සාගින්න සහමුලින්ම තුරන් කිරීම: පසුබිම සහ වර්තමාන තත්වය, නොවැම්බර් 22 ලෝක බැංකු කාර්ලයේ ප්‍රදානක ආයතනවල ගෝලීය මණ්ඩපයේ දී

අතුල සේනාරත්න බලශක්ති සුරක්ෂිත භාවය, තිරසාර සංවර්ධනය සහ හරිත ගිණුම් තැබීම, නොවැම්බර් 23, කොළඹ විද්‍යා මාවතේ ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනයේ දී

ශ්‍රී ලංකාවේ දේශගුණික අනතුරු කළමනාකරණ උපාය මාර්ගයක් ලෙස වගා රක්ෂණයේ භූමිකාව දෙසැම්බර් 9 කොළඹ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ HARTI එකතුව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සංගමය සංවිධානය කළ එම සංගමයේ 10 වැනි වාර්ෂික පර්යේෂණ මණ්ඩපයේ දී

මනෝජ් තිබ්බොටුවාව වතු කම්කරුවන්ට ප්‍රමාණවත් වැටුපක් ලැබෙන්නේ ද? ශ්‍රී ලංකාවේ වතු අංශය සඳහා ජීවත්වීමට සරිලන වේතනයක් ගණනය කිරීම, දෙසැම්බර් 9 කොළඹ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ HARTI එකතුව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සංගමය සංවිධානය කළ එම සංගමයේ 10 වැනි වාර්ෂික පර්යේෂණ මණ්ඩපයේ දී

දිලානි හිරිමුතුගොඩගේ විසින් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය වටිනාකම් දාමය විශ්ලේෂණය කිරීමක් දෙසැම්බර් 9 කොළඹ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ HARTI එකතුව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සංගමය සංවිධානය කළ එම සංගමයේ 10 වැනි වාර්ෂික පර්යේෂණ මණ්ඩපයේ දී

මනෝජ් තිබ්බොටුවාව විසින් ශ්‍රී ලංකාවේ කුළුබඩු වටිනාකම් දාම විශ්ලේෂණයක් දෙසැම්බර් 15, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මහ ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලා 134 දී JICA විසින් සංවිධානය කළ ආරම්භක රැස්වීමේ දී

## බ්ලොග්/ලිපි

මාර්තු 22 ඩේලි එෆ්ටී අතුල සේනාරත්න සහ චතුර රොඩ්‍රිගෝ විසින් ශ්‍රී ලංකාවට වඩාත් හොඳ ජලය, තිරසාර කෘෂිකර්මය සහ වඩාත් හොඳ දිවියක්

ජුනි 08 Talking Economics Blog අතුල සේනාරත්න විසින් නිරෝගී සමුද්‍රයක්, නිරෝගී ග්‍රහලෝකයක්, ස්වභාවික ආපදාවන්ගේ සමුද්‍ර සුන්බුන් පිරිසිඳු කිරීම,

ජුනි 29 Talking Economics Blog කාංචනා වික්‍රමසිංහ විසින් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්කවල හරිත අරමුණු ක්‍රියාත්මක කිරීම

අගෝස්තු 08 Talking Economics Blog කාංචනා වික්‍රමසිංහ විසින් ශ්‍රී ලංකාවේ හෝටල්වල නව තරු ශ්‍රේණිගත කිරීමේ දී හරිත පැහැය

සැප්තැම්බර් 27, Talking Economics Blog කාංචනා වික්‍රමසිංහ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සියල්ලන්ට පිවිසිය හැකි කරවීම

නොවැම්බර් 03 දි අයිලන්ඩ් දිලානි හිරිමුතුගොඩගේ බුද්ධිමය දේපොළ අයිතිවාසිකම් ශ්‍රී ලංකාවේ පරිසර සංචාරය නගා සිටුවීමේ මෙවලමක් ලෙස

නොවැම්බර් 22 Talking Economics Blog කාංචනා වික්‍රමසිංහ වගා රක්ෂණය: එය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ හැකි ද?

# පර්යේෂණ කණ්ඩායම් නායකයෝ



වමේ සිට දකුණට: ගංගා තිලකරත්න  Phd (Manchester) ජානක විජේසිරි Phd (Monash) නිෂා අරුණතිලක Phd (Duke) සමන් කැලේගම Phd (Oxon) බිලේෂා වීරරත්න Phd (CUNY) දුෂ්ණි වීරකෝන් Phd (Manchester) අතුල සේනාරත්න Phd (Deakin) මනෝජ් තිබ්බොටුවාව Phd ( Western Australia)

# පර්යේෂණ කාර්ය මණ්ඩලය




1. කාංචනා වික්‍රමසිංහ M Econ (Colombo) පර්යේෂණ ආර්ථික විද්‍යාඥ 2. ප්‍රියන්කා ජයවර්ධන M Econ (Colombo) පර්යේෂණ ආර්ථික විද්‍යාඥ 3. විමල් නානායක්කාර Bsc Peradeniya ජ්‍යෙෂ්ඨ බාහිර ප්‍රධාන 4. ජී ඩී දයාරත්න BA Peradeniya සෞඛ්‍ය ප්‍රතිපත්ති වැඩ සටහන 5. කිත්මිණ හේවගේ Msc (UCL) පර්යේෂණ නිලධාරි 6. නිපුණි පෙරේරා BA (Colombo) පර්යේෂණ නිලධාරි 7. නෙළුකා ගුණසේකර BA (Colombo) පර්යේෂණ නිලධාරි

# පර්යේෂණ කාර්ය මණ්ඩලය




1. සුනිමලී මදුරාවල M Econ (Colombo) පර්යේෂණ නිලධාරි 2. සමන්ති බණ්ඩාර M Sc (Chulalongkorn) පර්යේෂණ නිලධාරි 3. දිලානි හිරිමුතුගොඩගේ Mecon (Colombo) පර්යේෂණ නිලධාරි 4. සුවේන්ද්‍රිනි ජයරත්න M A (ANU) පර්යේෂණ නිලධාරි 5. යොලන්තිකා ඇල්ලෙපොළ MSc ( LSE) පර්යේෂණ සහකාර 6. චින්තනී සූරියමුදලි BA (Colombo) පර්යේෂණ සහකාර 7. අනර්කලී පෙරේරා BA (MHC ) පර්යේෂණ සහකාර 8. විශ්වනාදන් සුබ්‍රමනියම් BSc (Birmingham Southern- U S A පර්යේෂණ සහකාර

# ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සීමාවාසික වැඩ සටහන 2016

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය දැනට ඇතුළත්ව සිටින ශිෂ්‍යයන්ට හෝ ආර්ථික විද්‍යාවෙන් හෝ අදාල ක්ෂේත්‍රවලින් මෑතකදී උපාධිලත් අයට කෙටි කාලීන සීමාවාසික වැඩ සටහන් ලබා දේ. ඉන් නිශ්චිත පර්යේෂණ ව්‍යාපෘතියක ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෙකු සමග වැඩ කිරීමට හෝ පර්යේෂණ ක්ෂේත්‍රයේ පුළුල් අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාවක් සැලසේ ආර්ථික සංවර්ධන ගැටලු ගැන උනන්දුවක් දක්වන අයැදුම්කරුවන් සඳහා විවෘත මෙම අවස්ථා සාමාන්‍යයෙන් මාස 2-6ක් අතර කාලයක් සඳහා වේ.

| | |
|---|---|
| මිනිදුල බාලසූරිය | කොළඹ විශ්ව විද්‍යාලය |
| ශ්‍රී දයාලිනි සිවලිංගම් | කොළඹ විශ්ව විද්‍යාලය |
| පමෝක්‍ය මාරඹේ | ලන්ඩන් විශ්ව විද්‍යාලය, රෝයල් ඉන්ස්ටියුට්, කොළඹ |
| ෂොන්ටාල් සිරිසේන | යුනිවර්සිටි කොලෙජ්, ලන්ඩන් |
| විශ්ව සුබ්‍රමනියම් | බර්මින්හැම්- සදර්න් කොලෙජ්,( Bsc) බර්මින්හැම්, ඇලබාමා |
| අබිනව් පන්ඩේ | අර්ල්හැම් කොලෙජ්, රිච්මන්ඩ් ඉන්දියානා |
| මිචල්යා ලින්ඩ්බර්ග් | ටුලේන් විශ්ව විද්‍යාලය, නිව් ඔර්ලියොන්ස්, ඒපී |
| සත්‍යා කරුණාරත්න | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය/ලන්ඩන් විශ්ව විද්‍යාලය, රෝයල් ඉන්ස්ටියුට් |
| කිෂාණි සෙනවිරත්න | ලන්ඩන් විශ්ව විද්‍යාලය, රෝයල් ඉන්ස්ටියුට්, කොළඹ |
| නවීන් වික්‍රමරත්න | කොළඹ විශ්ව විද්‍යාලය |
| දුවිඳු ඉලන්කෝන් | ලන්ඩන් විශ්ව විද්‍යාලය, රෝයල් ඉන්ස්ටියුට්, කොළඹ |

# බුද්ධි මණ්ඩල මුලපිරුම්

## TTI අරමුදල් සැපයූ වැඩ සටහන් 2016

2016 වසරේ දී TTI ආයතනය සංවිධානයේ පහත සඳහන් ක්‍රියාකාරකම්වලට සම අරමුදල් සහාය ලබා දෙන ලදී

### ප්‍රකාශන

ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ තත්වය 2016
ශ්‍රී ලංකාවේ බදු ක්‍රමයඃ වත්මන් ප්‍රවනතා සහ අනාගත දැක්ම
TE ඩයිජෙස්ට් (කලාප 2)
ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ නැවත නිර්වචනය කිරීම
පුද්ගලික ද රාජ්‍ය දඃ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා සපයන්නන් තෝරා ගැනීමේ නිර්ණායක
නව පැලැටි වර්ග සහ ගොවීන්ගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කිරීමේ දී බුද්ධිමය දේපොළ අයිතිවාසිකම්

### පර්යේෂණ ව්‍යාපෘති

ශ්‍රී ලංකාවේ ජනතාව ප්‍රමිතියක් නැති ආකාරයේ සේවාවන්හි යෙදීමට තීරණය කරන්නේ ඇයි?

වෙනත් ගෝලීය ආර්ථික බොහොමයක මෙන් ශ්‍රී ලංකාවේ ද සේවාවන් අනියම් සහ බාහිර කිරීමේ ප්‍රවනතාවය වැඩි වෙමින් පවති. නිදසුනක් වශයෙන් 2013 වන විට ශ්‍රී ලංකාවේ වැටුප් ලබන සේවකයන්ගෙන් අඩකට වඩා තාවකාලික/අනියම් හෝ ස්ථිර සේව්‍යයකු නැති ප්‍රමිතියක් නැති ආකාරයේ සේවයේ යෙදෙන වේතන ලබන සේවකයන් වියි ප්‍රමිතියක් නැති සේවා අඩු වැටුප්ද සමාජ ආරක්ෂණ ආවරණයක් නොලබන ස්ථාවර නොවන ආකාරයේ සේවා බව අධ්‍යයන්යෙන් හෙළි විය. වැඩි දුරටත් නිපුණතා හිඩැස්ද නුපුහුණු සේවකයන් මෙන්ම ස්ථිර රැකියා අවස්ථා සීමිතවීම වැනි ශ්‍රම සැපයම් අංශයේ ගැටලු ශ්‍රී ලංකාවේ ප්‍රමිතියක් නැති සේවා නියුක්තියේ වැඩිවීමට හේතු වේ.

### ශ්‍රී ලංකාවේ ජාතික මානව සම්පත් සහ සේවා නියුක්ති ප්‍රතිපත්තිය (NHREP) පුනරීක්ෂණය

'ජාතික මානව සම්පත් සහ සේවා නියුක්ති ප්‍රතිපත්තිය' පළමුවෙන්ම දියත් කරන ලද්දේ 2012 ඔක්තෝබර් මාසයේ දීය. ආණ්ඩුව වෙනස්වීමත් සමග එය වත්මන් ආණ්ඩුවේ සංවර්ධන රාමුවට ගැලපෙන ආකාරයට නැවත සකස් කිරීමට සිදු වියි මිනිස් බල සහ සේවා නියුක්ති දෙපාර්තමේන්තුවේ ආරාධනය අනුව TTI මුල පිරුමේ අරමුදල් සහාය ඇතිව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ජාතික මානව සම්පත් සේවා නියුක්ති ප්‍රතිපත්තිය නැවත කෙටුම්පත් කෙළේයි සංශෝධිත කෙටුම්පත පසුව 'ජාතික මානව සම්පත් සහ සේවා නියුක්ති ප්‍රතිපත්තිය පුනරීක්ෂණය මගපෙන්වීමට ස්ථාපනය කළ ජාතික මෙහෙයුම් කොමිටියෙන් වලංගු කරන ලදී.

### අන්තර්ජාතික වෙළඳාම් අමාත්‍යංශයේ වෙළඳ ප්‍රතිපත්ති රාමුව සංවර්ධනය කිරීම සඳහා අරමුදල

ඔවුන් කරන්නේ කුමක් ද? ශ්‍රී ලංකාවේ තරුණ ශ්‍රමය

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ (අ) තරුණයන් නිරතවී සිටින විවිධ ක්‍රියාකාරකම් සොයා ගැනීම සහ (ආ) තරුණයන් එම ක්‍රියාකාරකම්වල නිරතවීමට බලපෑ සාධක සොයා ගැනීමය. පදනම් වූ හේතු සාධක හඳුනා ගැනීමෙන් අපට ගැටලු විසඳීමට ඒ සඳහාම වූ ප්‍රතිපත්ති පියවර සැකසීමටත් රටේ ආර්ථික සංවර්ධනයට දායකවීමට හැකිවන ආකාරයට ඔවුන් ඵලදායී සේවා නියුක්තියට ගෙන ඒමටත් හැකි වේ.

### ලෝක ආර්ථික සාකච්ඡා මණ්ඩපය- පරිණාමීය කේන්ද්‍රය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාව පිළිබඳ ලෝක ආර්ථික සාකච්ඡා මණ්ඩපයේ පරිණාමීය සිතියම සකස් කිරීමේ උපදේශක වියි මෙම ව්‍යාපෘතිය අනාගත වර්ධනයට උත්තෝලනයක් කර ගත හැකි සහ සාකච්ඡා මණ්ඩපයේ මෙවැනි ක්ෂේත්‍රවල ඇති වෙනත් මුලපිරුම් හා සම්බන්ධ කළ හැකි රටේ දේශපාලන - ආර්ථික පරිණාමයේ ක්ෂේත්‍ර හතක් හඳුනා ගෙන ඇති මෙම ව්‍යාපෘතිය 2017 ජනවාරි මස ඩවෝස් හි පැවති ලෝක ආර්ථික සාකච්ඡා මණ්ඩපයේ දී අගමැති රනිල් වික්‍රමසිංහ මහතාට පිළිගන්වන ලදී.

### පුහුණු

පර්යේෂණ ආර්ථික විද්‍යාඥ ප්‍රියන්කා ජයවර්ධන විසින් STATA පුහුණුවද ව්‍යාප්ති විශ්ලේෂණයද බලපෑම් ඇගයීමද විසංයෝජන විශ්ලේෂණය සහ වටිනාකම් දාම විශ්ලේෂණය යන ක්ෂේත්‍රවල ක්‍රමවේදීය පුහුණුවක් සියලු පර්යේෂණ කාර්ය මණ්ඩලයට ලබා දුන්නාය.

සහාය කාර්ය මණ්ඩලයට වත්කම් කළමනාකරණයද විවිධ අනතුරු කළමනාකරණයද වාර්ෂික තොග සමීක්ෂණය සහ මූලික ඉංග්‍රීසි සන්නිවේදනය වැනි පුහුණු ලබා දුන් අතර ලේකම් සහ පරිපාලන නිපුණතා පිළිබඳ වැඩමුළුවට සහ ගොඩනැගිලි නඩත්තු කිරීම සහ උත්ප්‍රේරණ අලෙවි විධි ක්‍රම පිළිබඳ සම්මන්ත්‍රණයකට ද සහභාගි වූහ.

# සහාය සේවා
# මුදල් සහ පරිපාලනය

පර්යේෂණ ඒකකවලට සහාය සේවා ලබා දීමට මුදල් සහ පරිපාලන දෙපාර්තමේන්තුවක් පිහිටුවන ලදී. සහාය සේවාවන්ට අයත් වන්නේ මුදල්□ පරිපාලනය□ මානව සම්පත්□ නඩත්තු□ මෙහෙයවීම්□ ප්‍රවාහන සහ ප්‍රසම්පාදන සේවාවන් ය.

2016 වසර මෙම දෙපාර්තමේන්තුවට කැපී පෙනෙන වසරක් වන්නේ එහි පරිපාලන කටයුතු නිම කිරීම නිසායි 2016 වන තෙක් ආයතනයේ කාර්යාල ගොඩනැගිල්ල පිහිටි භූමිය පැවතියේ කල්බදු ක්‍රමය යටතේයි ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහ කාර්ය මණ්ඩලයේ සාමූහික ප්‍රයත්නය නිසා 2016 නොවැම්බර් මස ආයතනයට කාර්යාල භූමියේ හිමිකාරිත්වය ලබා ගතහැකි වියී එය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට ආණ්ඩුවේ ප්‍රදානයක් ලෙස ලැබිණ.

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් දෙසැම්බර් මස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහතික පත් මට්ටමේ පුහුණු ආයතනයක් ලෙස පිළිගන්නා ලදී. අගෝස්තු මස මෙම දෙපාර්තමේන්තුව නවිෂන් 2016 (Navision 2016 ) මූල්‍ය මෘදුකාංගය සාර්ථකව උත්ශ්‍රේණිගත තිරීමෙන් එම මෘදුකාංගයේ නවතම පිටපත මෙම රටේ සජීවීව යොදා ගන්නා පළමු ආයතනය විය.

මූල්‍ය වාර්තා කිරීමේ උසස් ගුණාත්මක තත්වයක් අත්කර ගැනීම සහ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය සාර්ථකව පිළිපැදීම නිසා 2015 දෙසැම්බර් 31න් අවසන් වන වාර්ෂික ගිණුම් වසර සඳහා විගණකාධිපතිගෙන් ''පිරිසිඳු විගණන මතයක්'' මෙම ආයතනයට ලබා ගත හැකි විය. කෙසේ වුවත් 2016 වසර මෙම දෙපාර්තමේන්තුවට අභියෝගාත්මක වසරක් වූයේ පසුගිය වසර හා සසඳන විට ව්‍යාපෘති ආදායම් පහත වැටීම නිසායි එහෙත් ආදායමේ එවැනි පහත වැටීමක් ආයතනයේ මුළු ආදායමට කැපී පෙනෙන බලපෑමක් නොවුයේ පොලී ආදායමේ සැලකිය යුතු වර්ධනයක් අත් වූ නිසාය. වැඩි දුරටත් ආයතනයේ අභ්‍යන්තර අරමුදල් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමෙන් ආදායම් හිඩැස පියවා ගත හැකි විය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සමායතන සමාජ වගකීම අනුව මුදල් සහ පරිපාලන දෙපාර්තමේන්තුව මැයි මාසයේ පැවති වැහි සුළං තත්වයෙන් හටගත් ගංවතුරෙන් සහ නාය යෑම්වලින් වින්දිතයන් වූ ජනතාවට කාර්ය මණ්ඩලයේ සහ ආයතනයේ සහාය ලබා දීමට මුල්ව කටයුතු කෙළේයී දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් කාර්ය මණ්ඩලය සහ ආයතනය සාමූහිකව ශ්‍රී ලංකා රතු කුරුස සංවිධානයට මුදල් සහ භාණ්ඩ ප්‍රධානය කළ අතර ඒවා අවතැන් වූවන් සහ වෙනත් ආකාරයෙන් වින්දිතයන් වූ අය අතර බෙදා හරින ලදී.

2016 වසරේ දී පර්යේෂකයන් පස් දෙනකු සහ සහාය කාර්ය මණ්ඩලයේ හත් දෙනකු ආයතනයෙන් සමුගත් අතර හත් දෙනෙකු ආයතනයේ පර්යේෂණ සහ සහාය කාර්ය මණ්ඩලයට එක් වූහ.



ඡයාරූපය:
(වමේ සිට දකුණට) □බර්නඩෙට් ප්‍රබාලොජිනි-පිළිගැනීම් නිලධාරිණී □ ජී බී ඇල් පූලියැද්ද-පරිපාලන නිලධාරි □නිලන්ති අලහකෝන්-ලේකම් □ රණුෂි ජයතිලක - ගණකාධිකාරි □ රේනුක විජේකෝන් - පහසුකම් කළමනාකාර නිලධාරි □ එරන්දි ගුරුගේ - මුදල් සහ පරිපාලන සහකාරී

අසුන් ගත්: (වමේ සිට දකුණට) □ තක්ෂිලා විතානගේ - ගිණුම් සහකාර □ ගයනි කල්දේරා - අධ්‍යක්ෂිකා මුදල් සහ පරිපාලන

## සහාය සේවා
## සන්නිවේද සහ ව්‍යාප්ති

සන්නිවේදන මාර්ග කාර්යක්ෂමව යොදා ගනිමින් පර්යේෂණ ව්‍යාප්තිය පුළුල් කිරීම ආයතනයේ මූලික අරමුණුවලින් එකකී එහි මුල් තැන ගනු ලබන්නේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සන්නිවේදන සහ ප්‍රකාශන ඒකකයී ආයතනයේ විවිධ පැතිමාන පර්යේෂණ ක්‍රියාකාරකම් ප්‍රකාශන□ මුද්‍රිත මාධ්‍ය□ ඩිජිටල් සහ සමාජ මාධ්‍ය මෙන්ම සිදුවීම් සහ සංවාද ඇතුළත් මාධ්‍යයන් හරහා බාහිර ලෝකයට පතුරුවා හැරේ

2016 වසරේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සන්නිවේදන උපාය මාර්ගය පර්යේෂණ කාර්ය මණ්ඩලය සමග ඵලදායි ක්‍රම වේදයක් හඳුනා ගැනීමට පැවති සාකච්ඡා වට කීපයකින් පසුව ගොඩනගා ගත් අතර එය සාර්ථකව ක්‍රියාත්මක කෙරිණී

### ප්‍රකාශන තුළින් පර්යේෂණ පතුරුවා හැරීම

ආයතනය තම පර්යේෂණවල සොයා ගැනීම් පතුරුවා හැරීමට සහ රටේ සමාජ ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධනයට අදාල ගැටලු ගැන ප්‍රතිපත්ති සම්පාදකයන් දැනුවත් කිරීමේ ප්‍රධාන ක්‍රම වේදයක් වන්නේ ප්‍රකාශනයී ප්‍රතිපත්ති ආයතනයේ ප්‍රකාශන නිෂ්පාදනය සහ බෙදා හැරීම අධීක්ෂණය කරන ආයතනයේ ප්‍රකාශන ඒකකය ඒවායේ ගුණාත්මක තත්වය පවත්වා ගැනිමට අමතරව දේශීය සහ විදේශීය වශයෙන් පුළුල් පිවිසීමක් සහ පාඨක සම්බන්ධතාවයක් පවත්වා ගැනීම තහවුරු කරයී

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රකාශන සාමාන්‍යයෙන් බෙදා හැරීම සිදු වන්නේ ආයතනය තුළදීම අලෙවියෙන් සහ දිවයින පුරා සිටින තෝරාගත් අලෙවිකරුවන් හරහායී ප්‍රකාශන අලෙවිකරුවන් සමස්ත අධීක්ෂණයට ලක් කිරීමට අමතරව ප්‍රකාශන ඒකකය විසින් අවශ්‍ය පසුවිපරම් කටයුතු ද වරින් වර සිදු කෙරේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රකාශන අලෙවි කිරීමේ ඉලක්ක සපුරා ගැනිමට විවිධ අලෙවි උපාය මාර්ග ද යොදා ගනී

### වෙනත් මාර්ග

ආයතනයේ ශාස්ත්‍රීය පර්යේෂණ ජාතික□ කලාපීය සහ අන්තර්ජාතික පාර්ශ්වකරුවන් වැනි ඉලක්ක කරගත් පාඨකයන් සමග ඵලදායීව සම්බන්ධවීමේ අරමුණෙන් ප්‍රතිපත්ති දැක්ම ( Policy Insights) වැනි වඩාත් පහසු ආකාරයෙන් ඉදිරිපත් කරයී 2016 වසරේ දී ආයතනය එහි ප්‍රකාශන සහ දැනට කෙරීගෙන යන පර්යේෂණ පදනම්ව ප්‍රතිපත්ති දැක්ම කලාප 8ක් නිකුත් කරන ලදී

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සමකාලීන වැඩ පිළිබඳව ප්‍රතිපෝෂණය ලබා ගැනීමට සහ සාකච්ඡා කිරීමට නිතිපතා පුනරීක්ෂණ රැස්වීම් පැවැත් වේ එමෙන්ම මූලික පාර්ශ්වකරුවන් සමග නොවිධිමත් වට මේස සාකච්ඡා පැවැත්වීම ද ආයතනයේ ව්‍යාප්ති වැඩ සටහන් අතර වේ ඊට අමතරව රූපවාහිනී වාර්තා වැඩ සටහන්□ නිතිපතා පැවැත්වෙන සාකච්ඡා මණ්ඩප සහ පරිවර්තනය කළ පොත්පත් බෙදා හැරීම වැනි විකල්පයන් තුලින් දේශීය භාෂා කතා කරන පාඨක පිරිස් ද සම්බන්ධ කර ගැනේ

### මාධ්‍යය සමග ගොඩනගා ගත් උපාය මාර්ගික සම්බන්ධතා තුළින් ව්‍යාප්ති වැඩී

වසර ගණනාවක් තිස්සේ ආයතනය ශ්‍රී ලංකාවේ මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය සමග සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගෙන ඇති දෘශ්‍යමානතාවය සහ පතුරුවා හැරීම ආයතනයේ මූලික ප්‍රමුඛතා නිසා මාධ්‍ය සමග ඇති උපාය මාර්ගික හවුල්කාරිත්වය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සමාජ - ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ ශ්‍රී ලංකාවේ සහ ඉන් ඔබ්බෙහි පුළුල් පාඨක පිරිසක් අතර ප්‍රචාරය කිරීමට බොහෝ දුරට ඉවහල් වියී පුවත් නිවේදන ආකාරයෙන් බෙදා හරින ආයතනයේ ප්‍රවෘත්ති මෙන්ම පර්යේෂණ ලිපි ද මාධ්‍යයේ හොඳ පිළිගැනිමක් පවතී ආයතනයේ සිදුවීම් සහ ක්‍රියාකාරකම්වලටද පුළුල් මාධ්‍ය ආවරණයක් ලැබේ

2016 වසරේ දී ආයතනය ඉංග්‍රීසි මාධ්‍යයෙන් බ්ලොග් ලිපි 40ක්□ සිදුවීම් සහ ප්‍රකාශන පදනම් පුවත් නිවේදන 09ක් සහ 2016 ආර්ථිකයේ තත්වය පදනම් ප්‍රතිපත්ති දැක්ම 10ක් නිකුත් කරන ලදී

### සිදුවීම්

ජුනි මස සංයුක්ත දේශගුණික තොරතුරු කළමනාකරණ පද්ධතියක් සඳහා කලාපීය ප්‍රවිචාරණ වැඩ මුළුව□ පෙබරවාරි ආහාර වටිනාකම් දාම සංවර්ධනය පිළිබඳ ජාතික වැඩ මුළුව සහ ඉන්දියානු සාගර වළල්ල සංගමයේ තල්මසුන් සහ ඩොල්පින් නැරඹීමේ වැඩ මුළුව යන සිදුවීම්වලට හොඳ ප්‍රතිචාරයක් ලැබිණී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙන් සහාය ලබා දුන් අනෙකුත් සිදුවීම් වන්නේ 2016 ලෝක පාරිභෝගික අයිතීන් දිනය□ ශ්‍රී ලංකවේ ආහාර සුරක්ෂිත භාවය පිළිබඳ ජාතික ප්‍රවිචාරණය සහ එ ජා ESCAP සමීක්ෂණ වාර්තාව නිකුත් කිරීම යී මේවා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශ්‍රවනාගාරයේ දී සිදු කෙරිණී

# සහාය සේවා
# සන්නිවේද සහ ව්‍යාප්ති

### මාර්ගගත මාධ්‍යය හරහා දැනුම පතුරුවා හැරීම

සම්ප්‍රදායික ව්‍යාප්ති මාධ්‍යයන්ට අමතරව ආයතනය පිලිබඳව පුළුල් උනන්දුවක් ඇති කිරීමට සහ සමාජ-ආර්ථික ප්‍රතිපත්ති ගැටලු ගැන මූලික දක්ම සන්නිවේදනය කිරීමට සමාජ සහ ඩිජිටල් මාධ්‍ය ගණනාවක් යොදා ගන්නා ලදී.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වෙබ් අඩවිය□ සමාජ මාධ්‍ය වේදිකා මෙන්ම Talking Economics හා ClimateNet දැනුම පතුරුවා හැරීම සඳහා යොදා ගත් මූලික මාර්ගගත වේදිකා යී ''දර්ස ලිපි'' මැද පිටු සහ ක්ෂණික ප්‍රතිචාර ලිපි නිතිපතා ඇතුළත් කළ බ්ලොග් පිටුව ව්‍යාප්ති වැඩ සටහන්වල ප්‍රධාන ආකාරය වියී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වෙබ් අඩවියට 200කට ආසන්න වෙබ් ඇතුළත් කිරීම් සිදු කළ අතර බ්ලොග් පිටුවේ ලිපි 44කට වැඩි සංඛ්‍යාවක් පළ විය. ( TE 41 CN 03 ) ඒවා මාධ්‍යයට නිකුත් කිරීමෙන් පසු ඒවායේ ද පළ විය.

2016 දෙසැම්බර් 1වන විට සමාජ මාධ්‍ය වේදිකාවේ ආයතනයේ ෆේස් බුක් පිටුවේ කැමති ප්‍රමාණය 409කින් වැඩි වී 1525ක්වූ අතර @ Talking EconomicsSL අනුගාමිකයන් 357කින් වැඩි වී 1172ත් විය.



ඡායාරූපයඃ සිටගත්:(වමේ සිට දකුණට) □ අයෝනි රංගල - සම්බන්ධීකරණ ලේකම්/මානව සම්පත් සහකාර □ අමේෂ් තෙන්නකෝන්- ප්‍රකාශන නිලධාරි □නයෝමි ජයකොඩි- ලේකම් □අසුන්තා පෝල් - ලේකම්
අසුන් ගත්ඃ (වමේ සිට දකුණට) ෂාමේන් විජේසිංහ - කළමනාකාරිනිය ප්‍රකාශන සහ සිදුවීම් □ දිෂ්නීකා පෙරේරා - කළමනාකාරිනිය සන්නිවේදන සහ උපාය මාර්ගික ව්‍යාප්ති

# සහායක සේවා
## පුස්තකාලය

ආයතනයේ පර්යේෂණ ක්‍රියාවලියේ සංයුක්ත අංගයක් ලෙස පුස්තකාලය එහි පර්යේෂකයන්ට සුවිශේෂී පර්යේෂණ සහාය ලබා දීමට කැප වී සිටී. 2016 වසරේ පුස්තකාලයේ ප්‍රධාන අවධානය වූයේ පර්යේෂකයන්ට ලබා දුන් සේවාවන් තක්සේරු කිරීම සහ ඒ අනුව එම සේවා ප්‍රමුඛතා ගත කිරීමය.

### පොත් එක්රැස් කිරීමේ සංවර්ධනය

2016 වසරේ දී පුස්තකාලය ලබා ගත් පොත් සංඛ්‍යාව වැඩි කොට ආයතනයේ පර්යේෂකයන් සහ සහෝදර පර්යේෂණ සංවිධාන සමග සමීපයෙන් වැඩ කිරීමෙන් සැලකිය යුතු පොත්පත් සංඛ්‍යාවක් එකතු කර ගන්නා ලදි. එහි මුද්‍රිත සහ විද්‍යුත් පොත් සහ පත්‍රිකා විශාල සංඛ්‍යාවක් එකතු කර ගැනිණි ප්‍රාදේශීය කලාපීය සහ අන්තර්ජාතික සඟරා 30කට අධික සංඛ්‍යාවකට දායක මුදල් ගෙවා ඇති ඊට අමතරව පුස්තකාලය පසුගිය වසර කිපය මුළුල්ලේ ජාතික කලාපීය සහ අන්තර්ජාතික සංවිධාන ගණනාවක් සමග ගොඩ නගා ගත් අගනා හුවමාරු වැඩ සටහන් හරහා හුවමාරු සහ ත්‍යාග වශයෙන් ප්‍රකාශන විශාල සංඛ්‍යාවක් ලබා ගත්තේයි 2016 වසරේ දී පුස්තකාලය පවත්වා ගෙන එන ශ්‍රී ලංකාවේ ආර්ථික සහ අංශීය ප්‍රතිපත්ති පිලිබඳ අංශයට මුද්‍රිත සහ විද්‍යුත් ප්‍රකාශන සහ ලිපි ලේඛන සැලකිය යුතු ප්‍රමාණයක් ඇතුළත් කෙරිණි.

### මාර්ග ගත සම්පූර්ණ පෙළ සහිත දත්ත බැංකුවට පිවිසීම ( Full- text Databases )

පුස්තකාලය IDRC/TTI ආයතනවල පරිත්‍යාගශීලී සහාය ඇතිව දත්ත බැංකු ගණනාවකට පිවිසීමේ පහසුකම ලබා සිටී. කෙසේ වුවත් මෙම දත්ත බැංකු ගණනාවක පොත් සඳහා පනවා ඇති සම්බාධක නිසා පුස්තකාලය 2016 සිට නැවතත් JSTOR දායක මුදල් ගෙවීම නැවත ආරම්භ කෙළේය.

TTI සහාය සහ නුදුරු අනාගතයේ දී IMF ඊ පුස්තකාලයට පිවිසීම අවසන්විමත් සමග මාර්ග ගත පූර්ණ පෙළ දත්ත බැංකුවට පිවිසීමේ පහසුකම ලබා දීම පුස්තකාලයට අභියෝගයක් වනු ඇති මෙම තත්වයට මුහුණ දීමට සූදානම්වීම සඳහා පුස්තකාලාධිපතිනිය සහ පුස්තකාල කොමිටිය විකල්ප උපාය මාර්ග සකසමින් සිටිති.

### සේවාවන් වැඩි දියුණු කිරීම

පුස්තකාලයේ වත්මන් විද්‍යුත් දැනුවත් සේවාවන් සහ අනෙකුත් භාවිත අධ්‍යාපන ක්‍රියාකාරකම් පිළිබඳව අලුත්ම තොරතුරු සහ සම්පත් ගැන පර්යේෂකයන් දැනුවත් කෙරිණ. මෙම අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ සේවාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස පුස්තකාල ඉන්ටර්නෙට් සේවාව මාර්ග ගත ප්‍රසිද්ධ පිවිසුම් නාමාවලිය (OPAC) දත්ත බැංකු භාවිතය වැඩි විය.

2016 වසරේ දී පර්යේෂකයන් බැහැර ගෙන ගිය නිබන්ධන පත්‍රිකා සහ කාර්ය පත්‍රිකා සහ මුද්‍රිත වාර ප්‍රකාශන සහ සඟරා (208) 452 කි. ඊට අමතරව අන්තර් පුස්තකාල හුවමාරු විශාල සංඛ්‍යාවක් (35) සහ ලේඛන ලබා දෙන ලෙස කළ ඉල්ලීම් (312) ඉටු කරන ලදී. මුද්‍රිත පොත් පත් ලබා දීමට අමතරව පර්යේෂකයන්ගේ ඉල්ලීම අනුව විද්‍යුත් ලේඛන 312කට ආසන්න සංඛ්‍යාවක් ඔවුන්ට ලබා දුන්නේය.

ඊ මේල් සහ දුරකතන විමසීම් විශාල සංඛ්‍යවකට ප්‍රතිචාර දැක්වීමට අමතරව මෙම පුස්තකාලය ජාතික සහ ජාත්‍යන්තර වෘත්තිකයෝ සහ ශිෂ්‍යයෝ විශාල සංඛ්‍යාවක් පාවිච්චි කරති සමස්ත පුස්තකාල ප්‍රතිපත්තිය නියම කිරීමේ දී සහ ආයතනයේ පුස්තකාලය වැඩි දුරටත් සංවර්ධනය කිරීමේ පුළුල් මග පෙන්වීම් පැහැදිලි කරන ආචාර්ය නිෂා අරුණතිලකගේ ප්‍රධානත්වයෙන් යුත් පුස්තකාල කොමිටිය උපදේශක භූමිකාවක් ඉටු කරයි. පර්යේෂකයන්ගේ ප්‍රමුඛ අවශ්‍යතා පුස්තකාලයාධිපතිනියට දැනුම් දෙන කොමිටිය ආයතනයේ සමස්ත ඉලක්ක සන්දර්භය තුළ පුස්තකාලයේ දිශානතිය දක්වයි.

### මානව සම්පත්

2016 වසරේ දී පුස්තකාලය ක්‍රියාත්මක වූයේ කාර්ය මණ්ඩලයේ හිඟයක් ඇතිවයි කාර්ය මණ්ඩලයේ සිටියේ පුස්තකාලයාධිපතිනිය සහ සහකාර පුද්තකාලයාධිපතිනිය යන දෙදෙනා පමණි. මේ නිසා පුස්තකාලයාධිපතිනියගේ පර්යේෂණ සහ පුස්තකාල සේවා සංවර්ධනය සඳහා වෙන් වූ කාලය නව්‍ය සහ භාවිතයට වඩාත් හිතකර පහසුකම් හඳුන්වා දීම වෙනුවට දත්ත ඇතුළත් කිරීම සහ ඉන්ට්‍රානෙට් සහ OPAC යාවත්කාලීන කිරීම වැනි වෙනත් වැඩට යෙදවීමට සිදු විය. එමෙන්ම සහකාර පුස්තකාලයාධිපතිනියට පුස්තකාල සහකාර ගේ වැඩ කටයුතු කිරීමට ද සිදු විය පුස්තකාල කාර්ය මණ්ඩලයේ සේවකයන් ඉවත්ව යෑමට හේතු වන්නේ අධික වැඩ ප්‍රමාණය බව පෙනී ගොස් ඇත.

# සහායක සේවා
# පුස්තකාලය

## පුස්තකාලය භාවිතා කරන්නන්ගේ සමීක්ෂණය

පුස්තකාලය තොරතුරු සේවා ගණනාවක් සහිත යාවත්කාලීන ඉන්ට්‍රානෙට් පවත්වා ගැනීම සහ පූර්ණ පෙළ සම්පත් සහ විද්‍යුත් මාර්ගයෙන් ලබා ගත හැකි වන්නේ කුමක්ද පිළිබඳ වත්මන් දැනුවත් සේවාවන් සහිත OPAC පවත්වා ගැනීම වැනි වසර ගණනාවක් තිස්සේ ගොඩනගන ලද නව්‍ය සේවාවන් පිළිබඳව සැලකිය යුතු ප්‍රමාණයක උත්සාහයක්, ශක්තියක් සහ ආයොජනයක් යොදා ඇත. කෙසේ වුවද පුස්තකාලයේ පවතින කාර්ය මණ්ඩල හිඟකම නිසා මෙම සේවාවන් සැපයීම ප්‍රමුඛතා ගත කිරීමට සිදුව ඇති එමනිසා පුස්තකාල කොමිටියේ උපදෙස් අනුව පුස්තකාලයේ සේවා ප්‍රමුඛතා හඳුනා ගැනීමට සහ පැහැදිලි කර ගැනීමට භාවිතා කරන්නන්ගේ සමීක්ෂණයක් සිදු කරන ලදී. ඉන්ට්‍රානෙට්, OPAC සහ විද්‍යුත් පුවත් පත් කොටස් පර්යේෂකයන් වැඩි දෙනකු වඩාත් වැඩියෙන් භාවිතා කරන වඩාත් වැදගත්යැයි සිතන බව සමීක්ෂණයේ සොයා ගැනීම්වලින් දක්වයි. ඊට අමතරව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයන් විශාල වශයෙන් ඉන්ට්‍රානෙට් සහ JSTOR වැනි වෙනත් දත්ත බැංකු හරහා ලබා දෙන විද්‍යුත් සම්පත් කෙරේ විශ්වාස කරන බවද හෙළි විය.



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පුස්තකාලධිපතිනිය ආචාර්ය ප්‍රෙමිලා ගමගේ අගෝස්තු 10 හා 11 වොෂින්ටනයේ කොංග්‍රස් පුස්තකාලයේ පැවති ඩිජිටල් සංරක්ෂණ පූර්ව සමුළුවට සහ අගෝස්තු 13 – 19 දක්වා ඔහයියෝ හි කොලොම්බස් නගරයේ පැවති IFLA ලෝක පුස්තකාල සහ තොරතුරු සමුළුවට සහභාගි වූවාය



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පුස්තකාලධිපතිනිය ආචාර්ය ප්‍රෙමිලා ගමගේ පෙබරවාරි 16 – 18 දිනවල සිංගප්පූරුවේ පැවති පුස්තකාල සංගම් සහ ආයතන අන්තර්ජාතික ෆෙඩරේෂණයේ (IFLA) ආසියා සහ ඕෂනියා කලාපීය ස්ථාවර කොමිටියේ මැද රැස්වීමට සහභාගි වූවාය



වමේ සිටඃ ආචාර්ය ප්‍රමිලා ගමගේ පුස්තකාලධිපතිනිය සහ නුරාධා බොතේජු සහය පුස්තකාලධිපතිනිය

# සහායක සේවා තොරතුරු පද්ධති

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ තොරතුරු පද්ධති ඒකකය ( ISU ) මෘදුකාංග□ දෘඪාංග□ ජාලගත කිරීම් සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය□ වෙබ් සංවර්ධනය□ පවත්වා ගැනීම සහ තොරතුරු පතුරුවා හැරීම□ දත්ත බැංකු සංවර්ධනය□ පවත්වා ගැනිම සහ කළමනාකරණය වැනි සියලු තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී කේන්ද්‍රීය කාර්ය භාරයක් ඉටු කරයි ඉන් ආයතනයට කලාපීය විශිෂ්ටතා කේන්ද්‍රයක් වශයෙන් තරගකාරීව සිටිමට සහාය ලබා දේ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා සපුරාලීමේ අරමුණෙන් සම්පූර්ණයෙන්ම අලුත් ප්‍රාදේශීය ක්ෂේත්‍ර ජාලයක් ( LAN ) සංකල්පගත කොට ක්‍රියාත්මක කරන ලදී සන්නිවේදනය□ සම්මන්ත්‍රණය සහ සම්බන්ධතාවය වැඩි දියුණු කරමින් IP දුරකතන සමග සංයුක්ත ඒකාබද්ධ සන්නිවේදන ජාලයක් පිහිටුවීමෙන් වෙන් වූ දුරකතන ජාලයක් පිහිටුවීමේ පිරිවැය අඩු කෙරිණ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2016 දී ආයතනයේ සර්වර් (SERVER) සඳහා ආපදා ගලවා ගැනීමේ පද්ධතියක් (Disaster Recovery System) ක්‍රියාත්මන කෙලේයි අලුතින් හඳුන්වා දුන් Virtual Private Networking පද්ධතිය පර්යේෂකයන්ට ආයතනයෙන් බැහැර නොයෙකුත් ස්ථානවල සිට (විදෙස් සම්මන්ත්‍රණයක දී ක්ෂේත්‍රයේ දී හෝ නිවසේ සිට වැඩ කරන විට) ආයතනයේ ජාලයට ආරක්ෂිතව පිවිස අවශ්‍ය සම්පත් ලබා ගැනීමට□ සොෆ්ට් පෝන් (Soft Phone) හරහා දුරස්ත සන්නිවේදනය කිරීමෙන් පර්යේෂකයන්ට සැබැවින්ම කණ්ඩායමක් ලෙස තොරතුරු හුවමාරුකර ගැනීමට සහ සම්බන්ධවිමට අවස්ථාව හිමි වේ.

දෘශ්‍ය සහ ශ්‍රව්‍ය සම්මන්ත්‍රණ පහසුකම් ද සංයුක්ත කර ඇති නිසා කාර්ය මණ්ඩලයට ඔවුන් සම්මන්ත්‍රණ ශාලාවේ හෝ ශ්‍රවනාගාරයේ සිටින විට මෙම පහසුකම යොදා ගත හැකියි Virtualization පද්ධතිය අනුව ක්‍රියා කරන නව සර්වර් පද්ධතීන් නිසා සර්වර් සංඛ්‍යාව අවම කිරීමට මෙන්ම විවිධ මෙහෙයුම් පද්ධතීන් යොදා ගැනිමට හා එකම සර්වරයක විවිධ යෙදවුම් භාවිතා කිරිමටත් හැකියි දෘශ්‍ය හා ශ්‍රව්‍ය සම්මන්ත්‍රණ පහසුකම ජාලයට සංයුක්ත කර ඇති නිසා මෙම පහසුකම් කාර්ය මණ්ඩලය සම්මන්ත්‍රණ ශාලාවල හෝ ශ්‍රවනාගාරයේ සිටින විට යොදා ගත හැකියි මෙම සර්වර් සඳහා බාධාවකින් තොරව විදුලි බලය ලබා ගැනිමට UPS දෙකක් සම්බන්ධ කර ඇත.



වමේ සිට දකුණට: □ නාලක ලියනපතිරණ - වෙබ් කළමනාකරු සහ පද්ධති පරිපාලක □නන්දක පොතුවැව- තොරතුරු පද්ධති ප්‍රධානි □රොෂාන් කලුආරච්චි - Web Developer සහ පද්ධති සහකාර

# අපගේ ප්‍රකාශන 2016



# අපගේ සීමාවාසික සම්මන්ත්‍රණ




දෙසැම්බර් 20 ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී එක්සත් රාජධානයේ පරිසරය සහ සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික ආයතනයේ ප්‍රධාන ආර්ථික විද්‍යාඥ ආචාර්ය පෝල් ස්ටීල් විසින් ''ඇයවැය ක්‍රියාවලියට දේශගුණ සහ ස්වභාවික සම්පත් අන්තර්ග්‍රහණය කිරීම''



ඔක්තෝබර් 10 ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී සීමාසහිත CHEC පෝර්ට් සිටි (පෞද්ගලික) කොළඹ ප්‍රධාන වෙළඳ සහ අලෙවි නිලධාරි ලියැන්ග් ත්වෝ මින්ග් මහතා විසින් ''කොළඹ වරාය නගරයඃ සමස්ත දැක්මක්''




ජුලි 27 ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී ජ්‍යෙෂ්ඨ බාහිර ප්‍රධාන විමල් නානායක්කාර මහතා විසින් ''තිරසාර සංවර්ධන ඉලක්කඃ ශ්‍රී ලංකාව තවමත් තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා නිසි මාර්ගයේ සිටින්නේ ද?''



ජුනි 8 ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී දිල්ලි විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨයේ (FMS) ගිණුම් සහ බදු පැනවීම පිළිබඳ මහාචාර්ය මොනිකා සංගානියා ''ඉන්දියාවේ බදුකරණ කුරුමාණම''

මැයි 27 ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී පර්යේෂණ ප්‍රධාන ආචාර්ය ජානක විජේසිරි විසින් ''ට්‍රාන්ස් පැසිෆික් හවුල්කාරිත්වයේ ශ්‍රී ලංකාවට ඇති බලපෑම''



මාර්තු 31 ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී ආචාරය මනෝජ් තිබ්බොටුවාව සහ ප්‍රියන්කා ජයවර්ධන යන පර්යේෂණ ආර්ථික විද්‍යාඥයන් විසින් '' වතු කම්කරුවන්ට ප්‍රමාණවත් වේතනයක් ලැබෙන්නේ දඃ ශ්‍රී ලංකාවේ තේ වතු සේවකයන් සඳහා ජීවත්වීමට සරිලන වේතනයක් ගණනය කිරීම''



මාර්තු 15 ආයතනයේ සම්මන්ත්‍රණ ශලාවේ දී සිංගප්පූරුව නන්යාංග් තාක්ෂණ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ප්‍රදුම්නා රනා විසින් ''දකුණු ආසියාවට තල්ලුවක්ඃ ශ්‍රී ලංකාව කෙරේ විශේෂ අවධානයක් සහිතව ප්‍රතිශෝධන දෙවන වටය සහ නැගෙනහිරට යොමුවීමේ ප්‍රතිපත්තිය''



පෙබරවාරි 8 ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී ඔස්ට්‍රේලියාවේ ජාතික විශ්ව විද්‍යාලයේ මහජන ප්‍රතිපත්ති පිළිබඳ ක්‍රෝෆෝඩ් පාසලේ ආර්න්ඩ්ට් කෝඩන් ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ ආර්ථික විද්‍යා මහාචාර්ය ප්‍රේමචන්ද්‍ර අතුකෝරළ විසින් ''වර්ධන විනිශ්චය පිවිසුම ගැන නැවත සිතා බැලීමක්''



ජනවාරි 5 ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී පර්යේෂණ සහකාර කිත්මිණ හේවගේ විසින් ''ගනුදෙනුවකට මතක පූජාවක්ඃ ජගත් වෙළඳ සංවිධානයේ සංවර්ධනය වන රටවල් අතර සහයෝගිතාවය කෙරේ විදෙස් ආධාර බලපෑම''



# අපගේ විදෙස් විද්‍යමානතාව

1. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂක විසින් ජනවාරි 29 – 30 පාකිස්ථානයේ ලාහෝර් පර්ල් කන්ටිනෙන්ටල් හෝටලයේ පැවති ගණකාධිකාරීන්ගේ දකුණු ආසියා සම්මේලනයේ දී ''දකුණු ආසියාවේ වෙළඳාම සහ ආයෝජනයː අවස්ථා සහ අභියෝග' පිළිබඳ ඉදිරිපත් කිරීමක් කරන ලදී.

2. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂක පෙබරවාරි 19 බංග්ලාදේශයේ දකා හි බිම්ස්ටෙක් මහ ලේකම් කාර්යාලයේ පැවති දෙවන බිම්ස්ටෙක් වට මේස සාකච්ඡාවේ දී ''බංග්ලාදේශ බොක්ක ප්‍රදේශයේ කලාපීය ආර්ථික අන්තර්ග්‍රහණය' යනුවෙන් දේශනයක් පැවැත් වූයේය.

3. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂක පෙබරවාරි 20 බංග්ලාදේශයේ දකා හි BRAC කේන්ද්‍රයේ පැවති බංග්ලාදේශය මධ්‍යම ප්‍රමාණයේ ආධායම් රටක් කරා යන ගමන'' පිළිබඳ 2016 වාර්ෂික SANEM සම්මන්ත්‍රණයේ දී ''දකුණු ආසියානු කලාපීය අන්තර්ග්‍රහණය සඳහා ඇති ඉඩ ප්‍රස්ථා සහ අභියෝග'' මැයෙන් ඉදිරිපත් කිරීමක්

4. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂක මාර්තු 28 – 29 ඉන්දියාවේ කොල්කටා පාර්ක් හෝටලයේ දී අන්තර්ජාතික සම්බන්ධතා සහ සංවර්ධනය පිළිබඳ අධ්‍යයන කේන්ද්‍රය ( CSIRD ) විදේශ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ( IFPS ) සහ බිම්ස්ටෙක් බුද්ධි මණ්ඩල ජාලය ( BMTT ) සංවිධානය කළ 20 වැනි වියේ බිම්ස්ටෙක්ː 2017 සහ ඉන් ඔබ්බට න්‍යාය පත්‍රය'' යනුවෙන් විශේෂ දේශනයක් පැවැත් වූයේය.

5. ආයතනයේ පර්යේෂණ ප්‍රධාන ගංගා තිලකරත්න මාර්තු 14 – 16 ඇීඒ පී වොෂින්ටන් හි ලෝක බැංකුව සංවිධානය කළ ''ආහාර පදනම් ආරක්ෂක ජාලයන්'' පිළිබඳ වැඩ මුළුවේ දී ''ශ්‍රී ලංකාවේ ආහාර පදනම් ආරක්ෂක ජාලයන්'' පිළිබඳ ඉදිරිපත් කිරීමක් කළාය.

6. ආයතනයේ විධායක අධ්‍යක්ෂක මැයි 10 සහ 11 චීනයේ ගුවාන්ග්ෂු හි ගුවාන්ග්ෂු විශ්ව විද්‍යාලයේ 21 වැනි ශතවර්ෂයේ සමුද්‍ර සේද මාවත පිළිබඳ පළමු බුද්ධි මණ්ඩල සාකච්ඡා මණ්ඩපයේ දී ''සමුද්‍ර සේද මාවතේ ආර්ථික සහ වෙළඳ සහයෝගිතාවය පුළුල් කිරීම'' මැයෙන් දේශනයක් කෙළේය.




7. ආයතනයේ පර්යේෂණ ප්‍රධාන බිලේෂා වීරරත්න ජූලි 20 සහ 21 තායිලන්ත යේ බැංකොක් හි කොළඹ ක්‍රියාවලියේ තේමාගත ක්ෂේත්‍ර ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීමේ දී ''සම්ප්‍රේෂණ සහ ස්ත්‍රී පුරුෂ භාවය'' පිළිබඳ ඉදිරිපත් කිරීමක් කළාය.

8. ආයතනයේ විධායක අධ්‍යක්ෂ ජූලි 20 සහ 21 බංග්ලාදේශ් දකා හි බංග්ලාදේශ් රාජ්‍ය පරිපාලන පුහුණු කේන්ද්‍රය (BPTATC ) දකුණු ආසියාවේ ඇතුළත් කර ගන්නා සහ වගවීමෙන් යුත් පාලනය සමුළුවේ දී ''පශ්චාත් ගැටුම් සමයක ඇතුළත් කර ගන්නා වර්ධනය සහ පාලනයː ශ්‍රී ලංකාවේ තත්වය'' යනුවෙන් ඉදිරිපත් කිරීමක්.

9. ආයතනයේ විධායක අධ්‍යක්ෂක ජූලි 11 සිට 13 දක්වා චීනයේ ෂැංහයි නගරයේ ෂැංහයි අන්තර්ජාතික සම්බන්ධතා ආයතනය සහ පාත් ෆයින්ඩර් පදනම සංවිධානය කළ ''සමුද්‍ර සේද මාවත සහ චීන – ශ්‍රී ලංකා සම්බන්ධතා'' පිළිබඳ දෙවන සම්මන්ත්‍රණයේ දී ''21 වැනි සියවසේ සමුද්‍ර සේද මාවත සහ ශ්‍රී ලංකාවේ සංවර්ධනය'' මැයෙන් ඉදිරිපත් කිරීමක්.

# Our Overseas Presence



සැප්තැම්බර් 27 නවදිල්ලියේ RIS ආයතනය සංවිධානය කළ ප්‍රතිපත්ති බුද්ධි මණ්ඩල ජාලයේ BIMSTEC කලාපීය ප්‍රවිචාරණයේ දි BIMSTEC නිදහස් ගිවිසුමට ඇති අභියෝගඃ ශ්‍රී ලාංකික දැක්මක් මැයෙන් ඉදිරිපත් කිරීමක් කෙළේය.

11 ආයතනයේ පර්යේෂණ නිලධාරි කිත්මිණ හේවගේ සැප්තැම්බර් 24 ඉන්දියාවේ මුම්බායි හි සාර්ක් වානිජ සහ වෙළඳ මණ්ඩලයේ ''දකුණු ආසියාව මුදා හැරීමඃ සම්බන්ධතාවය෴ උප කලාපීය මුලපිරුම්෴ බලශක්ති සහ ආයෝජන ආරක්ෂාව'' සමුළුවේ දී ''දකුණු ආසියාවේ ගුවන් සම්බන්ධතාවය'' මැයෙන් ඉදිරිපත් කිරීමක්.

12 ආයතනයේ පර්යේෂණ ප්‍රධානි බෙලිෂා වීරරත්න නොවැම්බර් 5 ඉන්දියාවේ නවදිල්ලියේ සංවර්ධනය වන රටවල පර්යේෂණ සහ තොරතුරු පද්ධති ( RIS ) සංවිධානය කළ ''ඉන්දියානු සාගර කලාපයේ නිල් ආර්ථිකයේ අංශීය සහයෝගිතාවය'' පිළිබඳ දෙවන IORA නිල් ආර්ථික සංවාදයේ දී ''ශ්‍රී ලංකාවේ වෙරළ සංචාරය සහ නාගරිකකරණය'' ඉදිරිපත් කිරීමක්.

13 ආයතනයේ පර්යේෂණ සහකාර විශ්වනාදන් සුබ්‍රමනියම් දෙසැම්බර් 5 වැනි දා නවදිල්ලියේ ආසියා පදනම (ඉන්දියාව) විසින් සපයන අරමුදල් යටතේ ප්‍රතිපත්ති අධ්‍යයන දකුණු ආසියානු කේන්ද්‍රය (SACEPS) සහ සංවර්ධනය වන රටවල් සඳහා පර්යේෂණ සහ තොරතුරු පද්ධති (RIS) සම සංවිධානය කළ නිෂ්පාදන අංශයේ ඊකියා නිර්මාණයඃ දකුණු ආසියාවේ තිරසාර ආර්ථික වර්ධනයේ උපාය මාර්ග'' පිළිබඳ වැඩ මුළුවේ දී ''ශ්‍රී ලංකාවඃ ශ්‍රම වෙළඳ පොළ ගැලපීම හරහා තිරසාර ආර්ථික වර්ධනය'' ඉදිරිපත් කිරීමක්.

14 ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා දුෂ්නි විජේකෝන් විසින් නොවැම්බර් 18 සහ 19 චීනයේ බීජිං හි සමාජ විද්‍යා පිළිබඳ චින ඇකඩමියේ (CASS) ගෝලීය උපාය මාර්ගික ජාතික ආයතනය (NIGS) සංවිධානය කළ චීනය සහ එහි අසල්වැසියන් අතර පොදු ඉරණමක් ගොඩ නැගීම පිළිබඳ අන්තර්ජාතික බුද්ධි මණ්ඩල එකතුවේ දී චීන ශ්‍රී ලංකා ආර්ථික සහයෝගිතාවය පිළිබඳව ඉදිරිපත් කිරිමක්.

15 ආයතනයේ පර්යේෂණ ප්‍රධානි ජානක විජේසිරි විසින් ඔක්තෝබර් 10 සහ 11 බීජිං හි ගෝලීය උපාය මාර්ගික ජාතික ආයතනය- සමාජ විද්‍යා පිළිබඳ චීන ඇකඩමිය හා බීජිං විදේශ අධ්‍යයන විශ්ව විද්‍යාලය සංවිධානය කළ ''එක තීරුවක් එක මාවතක් මුලපිරුම ගෝලීය දැක්මකින්'' සම්මන්ත්‍රණයේ දී ''එක තීරුවක් එක මාවතක් සහ විවිධ පාර්ශ්ව සහයෝගිතාවයඃ ශ්‍රී ලාංකීය දැක්මක්'' යනුවෙන් ඉදිරිපත් කිරීමක්.

16 ආයතනයේ පර්යේෂණ ප්‍රධානි බිලේෂා වීරරත්න විසින් නොවැම්බර් 14 සහ 15 කොරියානු ජනරජයේ දී පිලිපීනයේ ආසියානු සංවර්ධන බැංකුව සංවිධානය කළ ''මැත් ක්ලවුඩ්'' පිළිබඳ කලාපීය වැඩ මුළුවේ දී ''ශ්‍රී ලංකාවේ මැත් ක්ලවුඩ් බලපෑම ඇගයීමක්'' මැයෙන් ඉදිවීපත් කිරීමක්.

17 ආයතනයේ පර්යේෂණ ප්‍රධානි නිෂා අරුණතිලක විසින් නොවැම්බර් 24 සහ 25 තායිලන්තයේ බැංකොක් හි යුනෙස්කෝ බැංකොක් සංවිධානය කළ ''තිරසාර සංවර්ධන ඉලක්ක 4'' 2030 දී අධ්‍යාපනය - සාක්ෂාත් කර ගැනීම සඳහා පර්යේෂණ ශක්තිය යොදා ගැනීම පිළිබඳ ''අධ්‍යාපන පර්යේෂණ ආයතන ජාලය - කලාපීය විශෙෂඥ හමුවේ'' දී ශ්‍රී ලංකාවේ වත්මන් පර්යේෂණ ප්‍රවනතා'' යනුවෙන් ඉදිරිපත් කිරීමක්.

# අපගේ දේශීය විද්‍යමානතාව

## ජනවාරි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂක විසින් ජනවාරි 7 – 8 සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී අන්තර්ජාතික සංවර්ධන කේන්ද්‍රය හාර්වඩ් විශ්ව විද්‍යාලය විවෘත සමාජ මණ්ඩපය සහ ශ්‍රී ලංකාණ්ඩුව සංවිධානය කළ '2016 ශ්‍රී ලංකා ආර්ථික මණ්ඩපයේ දී 'ශ්‍රී ලංකාවේ ව්‍යුහාත්මක පරිණාමය සහ තරගකාරිත්වය'' මැයෙන් ඉදිරිපත් කිරීමක්

ආයතනයේ පර්යේෂණ ප්‍රධාන ගංගා තිලකරත්න විසින් ජනවාරි 7 – 8 කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී ශ්‍රී ලංකාව තිරසාර සහ ඇතුළත් කර ගන්නා සංවර්ධනයක් කරා මෙහෙයවීම පිළිබඳව ශ්‍රී ලංකා ආර්ථික මණ්ඩපය - 2016 දී '' ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය සහ වයස්ගතවීමේ දී සමාජයීය ඇතුළත්වීම'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්



▲

ආයතනයේ විධායක අධ්‍යක්ෂක ජනවාරි 11 ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනය□ ඉංජිනේරු උපාධි ශිෂ්‍යයන් සඳහා පැවැත් වූ ''ශ්‍රී ලංකාවේ ආර්ථිකයː ප්‍රශ්න සහ අපේක්ෂා'' පිළිබඳව දේශනයක් පැවැත් වූයේය

ආයතනයේ විධායක අධ්‍යක්ෂක ජනවාරි 19 හිල්ටන් හෝටලයේ දී බර්ක්ලි කැල්පෝර්නියා විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍ය මහාචාර්ය ක්ලෙයාරි බ්‍රවුන් සහභාගි වූ ජනාධිපති කාර්යාලය සංවිධානය කළ ''ආර්ථික සංවර්ධනයට තිරසාර පිවිසුමක්'' පිළිබඳ සාකච්ඡා සභාවේ මුලසුන හෙබවූයේය

ආයතනයේ විධායක අධ්‍යක්ෂක□ ජනවාරි 20 ලක්ෂ්මන් කදිර්ගමාර් අන්තර්ජාතික සම්බන්ධතා සහ ක්‍රමෝපාය පිළිබඳ ආයතනයේ දී ආසියානු සෙකුයුරිටීස් සහ වෙරිටේ රිසර්ච් ( Asian Securities and Verite Research ) සංවිධානය කළ ''සාර්ව ආර්ථික සහ දේශපාලන විශ්ලේෂණය'' සංවාදයේ සාකච්ඡා මණ්ඩපයට සහභාගි වූයේය

ආයතනයේ විධායක අධ්‍යක්ෂක□ ජනවාරි 22 හිල්ටන් JIC හි පැවති ශ්‍රී ලංකාවේ යුරෝපීය වානිජ මණ්ඩලය සහ ශ්‍රී ලංකාවේ සහ මාලදිවයින් යුරෝපා සංගමයේ දූත මණ්ඩලය සංවිධානය කළ ''යුරෝපා සංගමය- ශ්‍රී ලංකාවේ අංක 1 වෙළඳ හවුල්කරු'' පිළිබඳ සම්මන්ත්‍රණයක දී ''යුරෝපා සංගමය සහ ජී ඇස් පී ප්ලස් සමග ශ්‍රී ලංකාවේ වෙළඳ සහ ආයෝජන සම්බන්ධතා'' ගැන ඉදිරිපත් කිරීමක් කෙළේය

ආයතනයේ විධායක අධ්‍යක්ෂක ජනවාරි 27 PIM ආදි ශිෂ්‍ය ඔලිම්පික් පදක්කම් -PIM මාධ්‍ය හමුවේ ආරම්භක කතාව පැවැත් වූයේය

ආයතනයේ විධායක අධ්‍යක්ෂක ජනවාරි 28 කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍ය දෙපාර්තමේන්තුවේ දී ''ශ්‍රී ලංකාවේ පසුගිය දශකය තුළ ණය ලබා ගෙන කළ ආයෝජන'' පිළිබඳ දේශනයක් කෙළේය

## පෙබරවාරි

පෙබරවාරි 03 ආයතනයේ ශ්‍රවනාගාරයේ දී ඔස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍ය මහාචාර්ය ප්‍රේමචන්ද්‍ර අතුකෝරළ විසින් ''ගෝලීය නිෂ්පාදන හුවමාරුව සහ වෙළඳ රටාවන්ː වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්තියට ඇති කෙරෙන බලපෑම්'' පිළිබඳ දේශනයක් පැවැත් වූයේය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ආචාර්ය දුෂ්නි වීරකෝන් විසින් පෙබරවාරි 6 කොළඹ එච් ඇන් බී ශ්‍රවනාගාරයේ දී එච් ඇන් බී ශාඛා කළමනාකරුවන්ගේ වාර්ෂික සමුළුවේ දී ''ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ඉදිරිය'' මැයෙන් දේශනයක් ඉදිරිපත් කළාය

ආයතනයේ විධායක අධ්‍යක්ෂක පෙබරවාරි 16 බත්තරමුල්ල ජන කලා කේන්ද්‍රයේ දී ලෝක බැංකුවේ අධ්‍යයන දෙකක් වන ''ශ්‍රී ලංකාවේ පද්ධති තත්ව විනිශ්චය'' සහ ''ශ්‍රී ලංකාව- දරිද්‍රතාවය අවසන් කිරීම සහ පොදු සමෘද්ධිය ප්‍රවර්ධනය කිරීම'' එළි දැක්වීමේ අවස්ථාවේ දී සාකච්ඡාකරුවෙකු වශයෙන් සහභාගි වූයේය

ආයතනයේ විධායක අධ්‍යක්ෂක විසින් පෙබරවාරි 18 දින CCC ශ්‍රවනාගාරයේ දී ලංකාවේ වානිජ මණ්ඩලය (CCC ) විසින් සංවිධානය කළ දකුණු ආසියානු තරුණ මණ්ඩපයේ දී ''දකුණු ආසියානු කලාපීය අන්තර්ග්‍රහණයː ඉදිරියට ඇති අභියෝග' මැයෙන් දේශනයක් කෙළේය

ආයතනයේ විධායක අධ්‍යක්ෂක විසින් පෙබරවාරි 24- 26 ටාජ් සමුද්‍රා හෝටලයේ දී අන්තර්ජාතික තල්මසුන් නැරඹීමේ කොමිසම□ මර්ඩොක් විශ්ව විද්‍යාලයේ තල්මසුන් පර්යේෂණ ඒකකය (Cetacean Research Unit) ඔස්ට්‍රේලියානු ආණ්ඩුවේ පරිසර දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකාණ්ඩුවේ විදේශ කටයුතු අමාත්‍යංශයේ සහාය ඇතිව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සංවිධානය කළ ''ඉන්දියානු සාගර වළල්ල සංගමයේ තල්මසුන් සහ ඩොල්පින් නැරඹීමේ වැඩ මුළුවේ'' දී පිළිගැනීමේ සහ ආරම්භක දේශනය පැවැත් වූයේය

# අපගේ දේශීය විද්‍යමානතාව




**මාර්තු**

ආයතනයේ විධායක අධ්‍යක්ෂක විසින් මාර්තු 15 දින ආයතනයේ ශ්‍රවනාගාරයේ දී ලෝක පාරිභෝගික අයිතිවාසිකම් දිනය වෙනුවෙන් මෙම ආයතනය සංවිධානය කළ ''ලෝක පාරිභෝගික අයිතිවාසිකම් දින සාකච්ඡා මණ්ඩපය 2016'' දී පිළිගැනීමේ කතාව සහ ආරම්භක දේශනය පවත්වන ලදී

ආයතනයේ විධායක අධ්‍යක්ෂක විසින් මාර්තු 16-18 දිනවල ගලදාරි හෝටලයේ පොදුරාජ්‍ය මණ්ඩලයේ මහ ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකාවේ වානිජ දෙපාර්තමේන්තුව සහ තිරසාර සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික ආයතනය සමග ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සංවිධානය කළ බහු පාර්ශ්වීය වෙළඳ ගිවිසුම් තුළ මතුවන ''නව ගැටලු'' වටා වෙළඳ තරගකාරිත්වය ඉහළ නැංවීම පිළිබඳව ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදකයන් ගේ වැඩ මුළුවේ දි පිළිගැනීමේ කතාව සහ ආරම්භක දේශනය පවත්වන ලදී

ආයතනයේ විධායක අධ්‍යක්ෂක මාර්තු 23 ගාලුමුව දොර හෝටලයේ දී PIMA ඔලිම්පික් ත්‍යාගලාභීන් ගේ එකතුව අමතා කතාවක් පැවැත් වූයේය

**අප්‍රේල්**

ආයතනයේ විධායක අධ්‍යක්ෂක අප්‍රේල් 2 අන්තර්ජාතික අධ්‍යයනය සඳහා වූ බණ්ඩාරනායක කේන්ද්‍රයේ (BCIS ) දී ''අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ නීති සහ නියාමන'' පිළිබඳව දේශනයක් පැවැත් වූයේය

ආයතනයේ පර්යේෂණ ප්‍රධාන ජානක විජේසිරි අප්‍රේල් 6 ආයතනයේ ශ්‍රවනාගාරයේ දී අන්තර්ජාතික ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයේ ( IFPRI ) සහාය ඇතිව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, මූලික කර්මාන්ත අමාත්‍යාංශයත් සමග ''ආහාර වටිනාකම් දාම සංවර්ධනය'' පිළිබඳව සංවිධානය කළ ජාතික වැඩ මුළුවේ දී ''ශ්‍රී ලංකාවේ ආහාර වටිනාකම් දාමයේ කෘෂි ආහාර ප්‍රමිතීන්වල වැදගත්කම'' පිළිබඳව ඉදිරිපත් කිරීමක් කෙළේය

ආයතනයේ විධායක අධ්‍යක්ෂක අප්‍රේල් 6 සහ 7 ආයතනයේ ශ්‍රවනාගාරයේ දී ''ආහාර වටිනාකම් දාම සංවර්ධනය පිළිබඳ ජාතික වැඩ මුළුවේ දී පිළිගැනීමේ කතාව කෙළේය

ආයතනයේ විධායක අධ්‍යක්ෂක අප්‍රේල් 7 කොළඹ මිලෝදා ආයතනයේ දී ලෝක බැංකුව විසින් සංවිධානය කළ ''ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ උපාය මාර්ගික සාකච්ඡා'' පිළිබඳ සම්මන්ත්‍රණයකදී ''වෙළඳ ගිවිසුම්වලින් උපරිමය ලබා ගැනීම: ඉන්දු- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ සිට එට්කා දක්වා'' මැයෙන් ඉදිරිපත් කිරීමක් කෙළේය

ආයතනයේ පර්යේෂණ ප්‍රධානි මනෝජ් තිබ්බොටුවාව අප්‍රේල් 6 සහ 7 ආයතනයේ ශ්‍රවනාගාරයේ පැවති ''ආහාර වටිනාකම් දාම සංවර්ධනය'' පිළිබඳ ජාතික වැඩ මුළුවේ දී ''ජාතික සංයුක්ත ආහාර සුරක්ෂිත භාවය සහ පෝෂණ ප්‍රතිපත්තිය'' (NIFSNP) පිළිබඳව ඉදිරිපත් කිරීමක්

ආයතනයේ පර්යේෂණ නිලධාරිනී දිලානි හිරිමුතුගොඩගේ අප්‍රේල් 6 සහ 7 ආයතනයේ ශ්‍රවනාගාරයේ පැවති ආහාර වටිනාකම් දාම සංවර්ධනය'' පිළිබඳ ජාතික වැඩ මුළුවේ දී ''ශ්‍රී ලංකාවේ කෘෂි-ආහාර වටිනාකම් දාම: කිරි සහ ධීවර වටිනාකම් දාම'' පිළිබඳව ඉදිරිපත් කිරීමක්

ආයතනයේ විධායක අධ්‍යක්ෂක අප්‍රේල් 18 BCIS හි පැවති විදේශ කටයුතු අධ්‍යයන කණ්ඩායමේ (FASG) ''ඉන්දු ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණ සහයෝගිතා ගිවිසුම'' පිළිබඳව ඉදිරිපත් කිරීමක්

**මැයි**

ආයතනයේ පර්යේෂණ ප්‍රධාන නිෂා අරුණතිලක විසින් මැයි 3 ටාජ් සමුද්‍රා හොටලයේ පැවති බ්‍රිතාන්‍ය මණ්ඩලය සංවිධානය කළ ''ශ්‍රී ලංකාවේ ගෝලීයකරණය, සේවා නියුක්තිය සහ අධ්‍යාපනය'' කෘතිය දියත් කිරීමේ දී සහ ඒ පිළිබඳ සාකච්ඡා මණ්ඩපයේ දී ''ඉදිරි වසර 5-10 අතර කාලයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සහ සේවා නියුක්ති ප්‍රතිපත්තිය ගැන විවාදයේ දී මෙම කෘතියෙන් මතු කළ වඩාත් වැදගත් කරුණු මොනවාද?'' ගැන ඉදිරිපත් කිරීමක්

ආයතනයේ විධායක අධ්‍යක්ෂක මැයි 4 දින රාජකීය විද්‍යාල සංගම් ශ්‍රවනාගාරයේ ඉස්ලාමීය තරුණ මණ්ඩපය සංවිධානය කළ සම්මන්ත්‍රණයේ දී ''ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ තත්වය'' පිළිබඳ දේශනයක් ඉදිරිපත් කෙළේය

ආයතනයේ පර්යේෂණ ප්‍රධාන නිෂා අරුණතිලක විසින් මැයි 6 කොළඹ ජාත්‍යන්තර කම්කරු සංවිධාන කාර්යාලයේ වට මේස සාකච්ඡාවක දී ''සංක්‍රමණික සේවකයන් ශ්‍රී ලංකාවේ කම්කරු වෙළඳ පොළ දත්තයන්ට අන්තර්ග්‍රහණය කිරීම'' මැයෙන් ඉදිරිපත් කිරීමක්

ආයතනයේ විධායක අධ්‍යක්ෂක මැයි 19 හොටේල් මාරවිල හි දී දකුණු හඬ, ODI සහ CEPA ''ශක්තිමත්ව අරඹන්න: තිරසාර සංවර්ධන ඉලක්කවල පළමු දින 1000 පිළිබඳ ආසියා

# අපගේ දේශීය විද්‍යමානතාව

කලාපීය සංවාදය'' සංවිධානය කළ සම්මන්ත්‍රණයක දී තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හවුල් සහ සම්පත් මෙහෙයවීම'' පිළිබඳ සැසියේ දී සාකච්ඡා මණ්ඩප සාමාජිකයෙකු ලෙස කටයුතු කෙළේය

### ජූනි

ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ආචාර්ය දුෂ්නි වීරකෝන් ජූනි 1 දින කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හි CT, CLSA Securities සංවිධානය කළ ''දකුණු ආසියානු දේශසීමා සමුළුව'' දී ''ශ්‍රී ලංකාවේ ආර්ථික දැක්ම''මැයෙන් ඉදිරිපත් කිරීමක්

ආයතනයේ පර්යේෂණ ප්‍රධාන ජානක විජේසිරි ජූනි 3 කළුතර තුර්යා හි පැවති සාර්ක් වානිජ සහ කර්මාන්ත මණ්ඩලය සංවිධානය කළ ''දකුණු ආසියාවඃ වර්ධන සමුළුව සඳහා නව සුසමාදර්ශය හැඩගැසීම'' හිදී ''දකුණු ආසියාවේ ගුවන් සම්බන්ධතාවය'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්

▼



ආයතනයේ විධායක අධ්‍යක්ෂක ජූනි 3 සිට 5 දක්වා සිංගප්පූරුවේ ෂැන්ග්‍රිලා හෝටලයේ පැවති IISS ෂැන්ග්‍රිලා සංවාදයඃ ''15 වැනි ආසියානු සුරැකුම් පත් හමුව''ට සහභාගි වූයේය

ආයතනයේ විධායක අධ්‍යක්ෂක ජූනි 21 කොළඹ කිංග්ස්බරි හෝටලයේ පැවති ශ්‍රී ලංකාවේ යුරෝපීය වානිජ මණ්ඩලය සහ ප්‍රජාතන්ත්‍ර වාර්තා කිරීමේ ජාත්‍යන්තරය සංවිධානය කළ ''ජී ඇස් පී'' ප්ලස් පිළිබඳ සංවෘත වටමේස සාකච්ඡාවේ මුලසුන දැරුවේය

### ජූලි

ආයතනයේ විධායක අධ්‍යක්ෂක ජූලි 4 දින ශ්‍රී ජයවර්ධනපුර පාර්ලිමේන්තුවේ දී අලුතින් කෙටුම්පත් කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ''මුදල්'' පිළිබඳ පාර්ලිමේන්තු ප්‍රචාරණ කොමිටියට සහභාගි වූයේය

ආයතනයේ විධායක අධ්‍යක්ෂක ජූලි 5 දින ආයතනයේ ශ්‍රවනාගාරයේ දී IORA සාගර අධ්‍යයන සහ පරිසරය සඳහා වූ කේන්ද්‍රය සංවිධානය කළ ''ඉන්දියන් සාගරයේ MH 370 පරීක්ෂණය'' පිළිබඳව පර්ත් බටහිර ඔස්ට්‍රේලියානු විශ්ව විද්‍යාලයේ මහාචාර්ය සී පට්ටිආරච්චි විසින් පැවැත් වූ සම්මන්ත්‍රණයේ මුලසුන දැරීය

ආයතනයේ විධායක අධ්‍යක්ෂක ජූලි 7 දින අන්තර්ජාතික වෙළඳාම සහ සංවර්ධන උපාය මාර්ග අමාත්‍යංශය හා සිංගප්පූරුවේ නියෝජිත කණ්ඩායම සමග යෝජිත සිංගප්පූරු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳව නිල පූර්ව සාකච්ඡා වටයේ මුලසුන දැරුවේය

ආයතනයේ විධායක අධ්‍යක්ෂක ජූලි 8 අරලියගහ මන්දිරයේ දී අගමැති මුලසුන දරන ලද ''ජීඇස්පී ප්ලස් නැවත ලබා ගැනීම'' පිළිබඳ සාකච්ඡාවට සහභාගි වූයේය

### අගෝස්තු

ආයතනයේ විධායක අධ්‍යක්ෂක අගෝස්තු 2 සිනමන් ග්‍රෑන්ඩ් පැවති ලංකාවේ වානිජ මණ්ඩලය සංවිධානය කළ ශ්‍රී ලංකාවේ ආර්ථික හමුව-2016 හිදී ''කලාපීය කේන්ද්‍රයක් වශයෙන් මතුවීමට ශ්‍රී ලංකාවට පහසුකිරීමේ දී අන්තර්ජාතික වෙළඳාමේ භූමිකාව'' මැයෙන් දේශනයක් ඉදිරිපත් කිරීම

ආයතනයේ විධායක අධ්‍යක්ෂක අගෝස්තු 11 බණ්ඩාරනායක අන්තර්ජාතික රාජ්‍ය තාන්ත්‍රික පුහුණු ආයතනයේ දී ''ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික භාවය'' මැයෙන් දේශනයක් පැවැත්වීම

ආයතනයේ විධායක අධ්‍යක්ෂක අගෝස්තු 11 ගලදාරි හෝටලයේ දී කොළඹ විශ්ව විද්‍යාලයේ MBA ආදි ශිෂ්‍ය සංගමය සංවිධානය කළ ''BREXIT යුරෝපා සංගමයේ ප්‍රතිචාර සහ ශ්‍රී ලංකාවට එහි බලපෑම'' පිළිබඳව දේශනයක් පැවැත් වූයේය

### සැප්තැම්බර්

ආයතනයේ විධායක අධ්‍යක්ෂක සැප්තැම්බර් 8 වැනි දින වෝටර්ස් එජ් හි පැවති ශ්‍රී ලංකාවේ විද්‍යා සහ තාක්ෂණ සමිති මණ්ඩපය 2016 තිරසාර සංවර්ධනය සඳහා විද්‍යා සහ තාක්ෂණ මුලපිරුම්'' සැසියේ මුලසුන දැරුවේය

# අපගේ දේශීය විද්‍යමානතාව




ායතනයේ පර්යේෂණ ආර්ථික විද්‍යාඥ කාන්චනා වික්‍රමසිංහ සැප්තැම්බර් 13 දින ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ''ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවීන්ගේ දේශගුණික රක්ෂණය සඳහා වූ ඉල්ලුම පිළිබඳව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් කරන ලද අධ්‍යයනයේ සොයා ගැනීම්'' ගැන පාර්ශ්වකරුවන්ගේ රැස්වීමේ දී ''දේශගුණික රක්ෂණය සම්බන්ධයෙන් පවතින අනතුරු කළමනාකරණ උපාය මාර්ග සහ ගැටලු පිළිබඳ මූලික සොයා ගැනීම්'' ගැන ඉදිරිපත් කිරීමක්

ආයතනයේ විධායක අධ්‍යක්ෂක සැප්තැම්බර් 15 කිංග්ස්බරි හෝටලයේ මොරටුව විශ්ව විද්‍යාලයේ රෙදිපිළි සංගමය විසින් සංවිධානය කළ ''ජීඇස්පී ප්ලස් සහ ඇඟලුම් අපනයන කර්මාන්තය කෙරේ එහි බලපෑම'' පිළිබඳ සම්මන්ත්‍රණයේ දී ''යුරෝපීය සංගමය- ශ්‍රී ලංකා වෙළඳාම සහ ආයෝජනය: ජීඇස්පී ප්ලස් නැවත ලබා ගැනීම'' පිළිබඳව ඉදිරිපත් කිරීමක්

ආයතනයේ අධ්‍යක්ෂක සැප්තැම්බර් 19 ලංකා වානිජ මණ්ඩලය සංවිධානය කළ ''FTAs '' පිළිබඳ සම්මන්ත්‍රණයේ දී ''නිදහස් වෙළඳ ගිවිසුම්: රටවල් ඉල්ලා සිටින්නේ ඇයි සහ ඒ කුමක් සඳහාද?'' මැයෙන් ඉදිරිපත් කිරීමකි

ආයතනයේ විධායක අධ්‍යක්ෂ සැප්තැම්බර් 24 සිනමන් ලේක් හිදී ග්ලෝබල් ෂේපර්ස් කොළඹ කේන්ද්‍රය සංවිධානය කළ ''ෂේප් ඒසියා 2016'' සමුළුවේ දී ''දකුණු ආසියාව නැවත පරිකල්පනය කිරීම'' පිළිබඳව දේශණයකී

### ඔක්තෝබර්

ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ආචාර්ය දුෂ්ණි වීරකෝන් ඔක්තෝබර් 22 කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ පැවති ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමයේ වාර්ෂික සැසියේ දී ''ශ්‍රී ලංකාව: සාර්ව ආර්ථික ස්ථායිතාවය වර්ධනය සහ ණය තිරසාර භාවය'' පිළිබඳව ඉදිරිපත් කිරීමක්

### නොවැම්බර්

ආයතනයේ පර්යේෂණ ප්‍රධානි බිලේෂා වීරරත්න නොවැම්බර් 4 කොළඹ දී කම්කරු සහ වෘත්තීය සංගම් සම්බන්ධතා අමාත්‍යාංශය විසින් සංවිධානය කළ ''ශ්‍රම සහ සේවා නියුක්ති ජාතික සම්මන්ත්‍රණය'' දී ''ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණයේ අනාගතය'' පිළිබඳව ඉදිරිපත් කිරීමකී

### දෙසැම්බර්

ආයතනයේ පර්යේෂණ ප්‍රධාන ගංගා තිලකරත්න දෙසැම්බර් 8 ආයතනයේ ශ්‍රවනාගාරයේ දී ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සංගමය(SAEA) ණී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සමග හවුලේ සංවිධානය කළ එම සංගමයේ දහවැනි පර්යේෂණ මණ්ඩපයේ දී ''කෘෂිකාර්මික පවුල්වල දරිද්‍රතාවය අවදානම සහ සමාජ සුභ සාධනය'' පිළිබඳ ඉදිරිපත් කිරීමකී

ආයතනයේ පර්යේෂණ නිලධාරිනිය සමන්ති බණ්ඩාර දෙසැම්බර් 9 දා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන සේවා පර්යේෂණ සහ පුහුණු ආයතනයේ (HARTI)පැවති ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සංගමයේ (SAEA ) දහවැනි වාර්ෂික සමුළුවේ දී ''ශ්‍රී ලංකාවේ කොන් කරන ලද ප්‍රජාවේ පෝෂණ තත්වයේ නිර්ණායක'' පිළිබඳව ඉදිරිපත් කිරීමක්

## පර්යේෂණවලින් ඔබ්බට



ප්‍රතිපත්ති ආයතනය අප්‍රේල් 19 වැනි දා කාර්ය මණ්ඩලය සඳහා ක්‍රීඩා සහ
විනෝදාස්වාදී වැඩ සටහන් ඇතුළත් අවුරුදු සැඳෑවක් පැවැත් වූයේය

## ගංවතුරෙන් විපතට පත් අයට ආධාර




ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ගංවතුරෙන් විපතට පත් අයට ආධාර කිරීමට ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට ප්‍රදානයක් කෙළේය මුදල් සහ පරිපාලන අධ්‍යක්ෂිකා ගයනි කල්දේරා සහ ගණකාධිකාරී රනුෂි ජයතිලක රතු කුරුස අධ්‍යක්ෂකට චෙක් පත භාර දුන් අවස්ථාව






ප්‍රතිපත්ති ආයතනයේ වසර අවසාන සාදය දෙසැම්බර් 9 වැනි දා වෝටර්ස් එජ් හි පැවැත්විණි කාර්ය මණ්ඩලයේ දිගු කලක් සේවය කළ අයට විධායක අධ්‍යක්ෂක විසින් සිහිවටන ප්‍රදානය කරන ලදී ක්‍රීඩා නැටුම් සහ සංගීතයෙන් පිරි සැඳෑවක් විය

# මූල්‍ය ප්‍රකාශනය

2016 දෙසැම්බර් 31 දින

**INSTITUTE OF POLICY STUDIES OF SRI LANKA**
**STATEMENT OF FINANCIAL PERFORMANCE**

| ***For the year ended 31st December*** | **Notes** | **2016 Rs.** | 2015 Rs. |
|---|---|---|---|
| **Revenue** | | | |
| Grant from the Government of Sri Lanka | **2** | 15,000,000 | 17,000,000 |
| Contribution from the Endowment Trust Fund | **23** | 23,000,000 | 27,500,000 |
| Non-Monetary Government Grant for Land | **14** | 10,920,000 | - |
| Project Income | **3** | 25,027,771 | 36,068,600 |
| Income from International Development Research Centre (IDRC) TTI Grant | **4** | 24,085,393 | 23,902,995 |
| Income from Seminars/Workshops | **5** | 908,104 | 2,157,400 |
| Interest Income | | 27,051,179 | 14,804,487 |
| Income arising from Capital Grant Amortization | **20** | 9,364,140 | 6,786,273 |
| Income from Hiring the Auditorium | | 859,346 | 635,437 |
| Miscellaneous Income | **6** | 1,936,994 | 1,962,488 |
| Profit on Disposal | **14** | - | 2,833,833 |
| **Total Revenue** | | **138,152,927** | 133,651,513 |
| **Expenses** | | | |
| Employee Cost | **7** | 59,107,356 | 59,634,166 |
| Depreciation on Property, Plant and Equipment | **14** | 18,241,514 | 27,506,101 |
| Research Cost | **8** | 13,605,136 | 12,845,973 |
| Seminars and Workshops Cost | | 665,840 | 741,423 |
| Utility Expenditure | | 18,109,225 | 16,416,906 |
| Travel Expenses | | 463,122 | 1,556,895 |
| Other Operating Expenses | **9** | 13,612,477 | 13,348,191 |
| Hire of Auditorium | | 325,239 | 233,403 |
| Exchange Loss | | 220,237 | 248,955 |
| **Total Expenses** | | **124,350,146** | 132,532,013 |
| **Surplus Before Taxation** | | 13,802,781 | 1,119,500 |
| Income Tax Expense | **10** | - | - |
| **Surplus for the Year** | | **13,802,781** | 1,119,500 |

**INSTITUTE OF POLICY STUDIES OF SRI LANKA**
**STATEMENT OF FINANCIAL POSITION**

| ***As at 31st December*** | **Notes** | **2016 Rs.** | 2015 Rs. |
|---|---|---|---|
| **ASSETS** | | | |
| **Current Assets** | | | |
| Cash and Cash Equivalent | **11** | 77,045,881 | 50,504,580 |
| Investments | **15** | 87,379,240 | 79,619,675 |
| Trade receivables | **16** | 4,118,021 | 7,576,402 |
| Inventories - Publications | | 772,096 | 700,999 |
| Deposits and Prepayments | **12** | 13,945,420 | 10,759,897 |
| Interest Receivable | | 4,326,087 | 2,405,127 |
| VAT & NBT Receivable | | - | 2,305,242 |
| Other Receivables | **13** | 3,102,472 | 2,618,560 |
| **Total Current Assets** | | **190,689,217** | 156,490,482 |
| **Non Current Assets** | | | |
| Property, Plant and Equipment | **14** | 320,104,829 | 312,345,922 |
| Long Term Investments | **15** | 165,124,210 | 145,191,301 |
| **Total Non Current Assets** | | **485,229,039** | 457,537,223 |
| **Total Assets** | | **675,918,256** | 614,027,705 |
| **LIABILITIES** | | | |
| **Current Liabilities** | | | |
| Trade and Other Payables | **17** | 4,272,594 | 6,216,482 |
| Advance Receipts on Projects | **18** | 40,418,819 | 22,999,617 |
| **Total Current Liabilities** | | **44,691,413** | 29,216,099 |
| **Non Current Liabilities** | | | |
| Employee Benefits | **19** | 11,567,679 | 13,903,551 |
| Staff Welfare Fund | | 2,147,380 | 1,244,259 |
| Deferred Income- Capital Grants | **20** | 353,514,579 | 331,375,205 |
| Long Term Advances received on Projects | **18** | 11,905,833 | - |
| **Total Non Current Liabilities** | | **379,135,471** | 346,523,015 |
| **Total Liabilities** | | **423,826,884** | 375,739,114 |
| **Net Assets** | | **252,091,372** | 238,288,591 |
| **NET ASSETS/EQUITY** | | | |
| Contributed by; | | | |
| Initial Transfer of Assets from Government/Grantor | | 2,144,144 | 2,144,144 |
| Accumulated Surplus | | 249,947,228 | 236,144,447 |
| | | **252,091,372** | 238,288,591 |

These financial statements have been prepared in accordance with the Sri Lanka Public Sector Accounting Standards.

.................................. ..................................
Chief Financial Officer — Executive Director

The Board of Governors of the Institute is responsible for the preparation and presentation of these financial statements.

Chairman — Member of the Board of Directors — Member of the Board of Directors

The annexed notes to the financial statements are an integral part of these financial statements.

27th February 2017
Colombo

**INSTITUTE OF POLICY STUDIES OF SRI LANKA**
**STATEMENT OF CASH FLOW**

| *For the year ended 31st December* | | 2016 | 2015 |
|---|---|---|---|
| | | Rs. | Rs. |
| **Cash Flow From Operating Activities** | **Notes** | | |
| Surplus/(Deficit) Before Taxation | | **13,802,781** | 1,119,500 |
| **Adjustments for;** | | | |
| Movement of the Staff Welfare Fund | | 903,121 | (300,026) |
| Depreciation on Property, Plant and Equipment | **14** | 18,241,514 | 27,506,099 |
| Income arising from Non-Monetary Government Grant for Land | **14** | (10,920,000) | |
| Income arising from Capital Grant Amortization | | (9,364,140) | (6,786,273) |
| Provision / (Reversal) of Gratuity | **19** | (645,252) | 3,214,210 |
| Interest Income | | (27,051,179) | (14,804,487) |
| (Increase)/Decrease in Provision for Bad debt | | 699,209 | (1,230,839) |
| (Profit) / Loss on Write down of assets | | 195,076 | (131,761) |
| Profit on Disposal of Fixed Assets | | - | (2,833,833) |
| Property, Plant & Equipment Reclassification Adjustment | **14** | 11,486 | - |
| **Net cash inflow/(outflow) Before Working Capital Changes** | | **(14,127,384)** | 5,752,592 |
| (Increase)/ Decrease in Trade Receivables | | 2,759,171 | 3,158,699 |
| (Increase) /Decrease in Inventories | | (71,097) | 490,418 |
| (Increase)/Decrease in Deposits and Prepayments | | (3,185,523) | (6,810,482) |
| (Increase)/ Decrease in VAT and NBT Receivables | | 2,305,243 | 2,254,770 |
| (Increase)/ Decrease in Other Receivables | | (483,912) | (86,306) |
| Increase/(Decrease) in Advance Receipts | | 2,926,010 | (28,511,808) |
| Increase/(Decrease) in Trade and Other Payables | | (7,136,317) | (1,830,155) |
| **Net cash inflow/(outflow) Generated From Operations** | | **(17,013,809)** | (25,582,272) |
| Gratuity Paid | **19** | (1,178,190) | (310,000) |
| **Net cash inflow/(outflow) From Operating Activities** | | **(18,191,999)** | (25,892,272) |
| **Cash Flow From Investing Activities** | | | |
| Purchase of Property, Plant and Equipment | **14** | (10,606,983) | (13,553,043) |
| Interest Received | | 22,889,480 | 15,926,740 |
| Sales Proceeds from Disposal of Property, Plant and Equipment | | - | 2,833,833 |
| Purchase of Investments | | (51,215,177) | (195,599,216) |
| Proceeds from Sale of Investments | | 4,514,213 | 139,535,165 |
| **Net cash inflow/(outflow) From Investing Activities** | | **(34,418,467)** | (50,856,521) |
| **Cash Flow From Financing Activities** | | | |
| Grants Received | | 26,399,025 | 24,341,195 |
| Capital Grant from Endowment Trust Fund | **20** | 31,503,513 | 51,028,891 |
| **Net cash inflow/(outflow) From Financing Activities** | | **57,902,538** | 75,370,086 |
| **Net (Decrease)/Increase in Cash and Cash Equivalents** | | 5,292,072 | (1,378,707) |
| **Cash and Cash Equivalents at the beginning of the year (Note 11)** | | 456,793 | 1,835,500 |
| **Cash and Cash Equivalents at the end of the year** | | **5,748,865** | 456,793 |
| **a) Reconciliation of Cash and Cash Equivalents** | | | |
| **Cash at Bank** | | 5,658,865 | 366,793 |
| **Cash in Hand** | | 90,000 | 90,000 |
| | | **5,748,865** | 456,793 |

**INSTITUTE OF POLICY STUDIES OF SRI LANKA**
**STATEMENT OF CHANGES IN NET ASSETS/EQUITY**

***For the year ended 31st December***

| | Initial Transfer of Assets by Government/Grantor | Accumulated Surplus | Total |
|---|---|---|---|
| | **Rs.** | **Rs.** | **Rs.** |
| Balance as at 31st December 2014 | 2,144,144 | 235,024,947 | 237,169,091 |
| Surplus of income during the year | - | 1,119,500 | 1,119,500 |
| Balance as at 31st December 2015 | 2,144,144 | 236,144,447 | 238,288,591 |
| **Surplus of income during the year** | **-** | **13,802,781** | **13,802,781** |
| **Balance as at 31st December 2016** | **2,144,144** | **249,947,228** | **252,091,372** |

***For the year ended 31st December 2016***

**1. Domicile and legal form**

Institute of Policy Studies was established by the Parliament Act No.53 of December 1988, and was formally set up as a legal entity by gazette notification in April 1990. The Institute of Policy Studies of Sri Lanka (IPS) registered office and the principal place of service is situated at 100/20, Independence Avenue, Colombo 07- Sri Lanka.

